# බහු මානය



PEOPLE'S LEASING
THE TRUSTED LEADER

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
වාර්ෂික වාර්තාව 2022/23

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BAN/D/PLF/2023/03 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 01 June 2023 |

**සභාපතිතුමා**
**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී**
**සමාගම**

### 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව, 2023 මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගමෙහි සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මතය

2023 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ ලාභ හෝ අලාභ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක්ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වලින් සමන්විත වූ, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ("සමාගම") හි මූල්‍ය ප්‍රකාශවල විගණනය සහ සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මගේ මඟපෙන්වීම යටතේ සිදු කරන ලදී. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා විසින් ලබා ගන්නා ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මේ වාර්තාවේ දක්වා ඇති සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ, 2023 මාර්තු 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒවාහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මූල්‍ය ප්‍රවාහයන් සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කොට ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව මම මගේ විගණනය සිදු කළෙමි. මගේ වගකීම් පිළිබඳ මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ සඳහා වන කොටසේ විගණනයට අදාළ විගණකගේ වගකීම්හි, එකී ප්‍රමිතීන් යටතේ තවදුරටත් විස්තර කර ඇත. මා ලබාගෙන ඇති විගණන සාක්ෂි මගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය වනු ඇතැයි මම විශ්වාස කරමි.

### 1.3 ප්‍රධාන විගණන කරුණු

මගේ වෘත්තීය විනිශ්චය අනුව, ප්‍රධාන විගණන කරුණු වන්නේ වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී වඩාත් වැදගත් වූ කරුණු වේ. සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී සහ ඒ පිළිබඳව මගේ මතය සැකසීමේදී මෙම කරුණු සලකා බලන ලද අතර, මෙම කරුණු සම්බන්ධයෙන් මම වෙනම මතයක් ඉදිරිපත් නොකරමි. පහත සෑම කරුණක් සඳහාම, මගේ විගණනය එම කාරණය සලකා බලන ආකාරය පිළිබඳ සඳහන් කරමින් මගේ විස්තරය එම සන්දර්භය තුළ සපයා ඇත.

| ප්‍රධාන විගණන කරුණ | මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණ සලකා බලන ලද ආකාරය |
|---|---|
| **ක්‍රමක්ෂය පිරිවැය යටතේ ගණනය කරන ලද ණය සහ ලැබිය යුතු මුදල් හි හානිකරණ ගාස්තු සඳහා ප්‍රතිපාදන**<br><br>2023 මාර්තු 31 දිනට, මූල්‍ය ප්‍රකාශවල සටහන 25 හි හෙළිදරව් කර ඇති පරිදි, ක්‍රමක්ෂය පිරිවැය යටතේ ගණනය කරන ලද ණය සහ ලැබිය යුතු මුදල් හි හානිකරණ ගාස්තු සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 125,378 ක් විය.<br><br>මෙය ප්‍රධාන විගණන කාරණයක් වූයේ සංකීර්ණ ගණනය කිරීම් ඇතුළත් හානිකරණ ගාස්තු සඳහා වාර්තා කර ඇති ප්‍රතිපාදනවල ප්‍රමාණවත්භාවය; සුවිශේෂී විනිශ්චයන් සහ උපකල්පනවල මට්ටම සහ එවැනි ණය සහ ලැබිය යුතු මුදල්වලින් ලබා ගැනීමට අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහ කළමනාකරණය ඇස්තමේන්තු කිරීම හා සම්බන්ධ ඇස්තමේන්තු අවිනිශ්චිතතා මට්ටම හේතුවෙනි. | මාගේ වාර්තාවේ සදහන් දිනය දක්වා පවතින වැදගත් තොරතුරු මත පදනම්ව, එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ වෙළඳපළ ආර්ථික අස්ථාවරත්වයට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව හානිකරණ ගාස්තු ගණනය කිරීම් සහ අභ්‍යන්තරයේ පවතින ක්‍රමවේදයන් සඳහාද සමූහයේ විධිවිධාන පෙළගැස්වීම මම තක්සේරු කළෙමි.<br>▪ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් හානිකරණ ප්‍රතිපාදන පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සඳහා වන අධීක්ෂණය, සමාලෝචනය සහ අනුමත කිරීමේ මට්ටම තක්සේරු කිරීම ඇතුළත් හානිකරණ ගාස්තු ඇස්තමේන්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනයන් මම ඇගයීමට ලක් කළෙමි.<br>▪ සමූහයේ මූලාශ්‍ර ලේඛන සහ ගිණුම් වාර්තාවන්ට අදාළව ඇති විස්තර සමඟ එකඟවීමෙන් මම හානිකරණ ගාස්තු ගණනය කිරීමේදී භාවිත කරන ලද පාදක දත්තවල පරිපූර්ණත්වය, නිරවද්‍යතාව සහ වර්ගීකරණය මම පරීක්ෂා කළෙමි.<br>▪ ඉහත කරුණුවලට අමතරව, පහත සඳහන් ක්‍රියා පටිපාටි අනුගමනය කරන ලදී. |

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| ප්‍රධාන විගණන කරුණ | මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණ සලකා බලන ලද ආකාරය |
|---|---|
| ▪ හානිකරණ ගාස්තු සඳහා වන ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වය විසින් භාවිත කරන ලද සුවිශේෂී විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවලට අදාළ ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා පහත කරුණු ඇතුළත් විය.<br>▪ වත්මන් ආර්ථික අවපාතය පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා කළමනාකාරිත්වය සැලසුම් කරයි.<br>▪ අපේක්ෂිත මූල්‍ය ප්‍රවාහයන් විවිධ ආර්ථික තත්ත්වයන් යටතේ තක්සේරු කරන ලද වර්තමාන සහ අපේක්ෂිත අනාගත බාහිර සාධක සහ මෙම එක් එක් අවස්ථා සඳහා තීරණය කරන ලද සම්භාවිතා බර තැබීම් පිළිබිඹු වන ඉදිරි දැක්මක් සහිත තොරතුරු සංස්ථාගත කිරීම. | **හානිකරණය සඳහා තනි පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු මුදල්:**<br>▪ මම ණය ගුණාත්මකභාවය පිළිබඳ තක්සේරුවල සාධාරණත්වය ඇගයීමට ලක් කළෙමි.<br>▪ මම අභ්‍යන්තරව පවතින තනි හානිකරණ ගණනය කිරීම්වල අංක ගණිතමය නිරවද්‍යතාවය පරීක්ෂා කළෙමි.<br>▪ මම වත්මන් ආර්ථික අවපාතය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් හානිකරණය සඳහා පවතින ප්‍රතිපාදනයන් හි භාවිත කරන ප්‍රධාන යෙදවුම්වල සාධාරණත්වය ඇගයීමට ලක් කළෙමි. ඉහළ අවදානම් සහිත කර්මාන්ත සඳහා පාරිභෝගිකයන් නිරාවරණය වීම, ණය අත්හිටුවීම්, මූල්‍ය ප්‍රවාහයේ වටිනාකම සහ කාලසීමාව පුරෝකථනය කිරීමේදී ඇපකරවල ප්‍රතිසාධන ක්‍රියාවන්හි තත්ත්වය සැලකිල්ලට ගනිමින් එවැනි ඇගයීම් සිදු කරන ලදී.<br>**හානිකරණය වෙනුවෙන් සාමූහික පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු මුදල් සඳහා:**<br>▪ මම සටහන 25.6 හි අනාවරණය කර ඇති පරිදි ප්‍රධාන යෙදවුම් සහ හානිකරණ ගාස්තු සඳහා වන ප්‍රතිපාදන සඳහා භාවිත කරන ගණනය කිරීම් පරීක්ෂා කළෙමි.<br>▪ අනාගත මූල්‍ය ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වය විසින් භාවිත කරන ලද විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු මෙන්ම අභ්‍යන්තර ක්‍රමවේද සහ කළමනාකරණ ආවරණ සාධාරණදැයි මම තක්සේරු කළෙමි. නිෂ්පාදන කළඹ වර්ගීකරණය, ඉහළ අවදානම් කර්මාන්ත, ඉදිරි දැක්මක් ඇති තොරතුරුවල සාධාරණ බව ඇගයීම, විවිධ ආර්ථික අවස්ථා සහ එක් එක් අවස්ථාවට පවරා ඇති සම්භාවිතා බර තැබීම් ආදිය මගේ තක්සේරුවට ඇතුළත් විය.<br>▪ මූල්‍ය ප්‍රකාශවල 11 සහ 25 සටහන්වල දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව මම තක්සේරු කළෙමි. |
| තොරතුරු තාක්ෂණ (IT) පද්ධතිවල සහ මූල්‍ය වාර්තාකරණයෙහි අභ්‍යන්තර පාලනයන්<br>සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, ස්වයංක්‍රීය ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලනයන් සහිත තොරතුරු තාක්ෂණ පද්ධති මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිත කරමින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම් සකස් කරනු ලැබේ. ඒවා පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කර ඇත.<br>ඒ අනුව, තොරතුරු තාක්ෂණ පද්ධති සහ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ. | **මගේ විගණන ක්‍රියා පටිපාටි තුළ පහත ක්‍රියා පටිපාටි ඇතුළත් වේ:**<br>▪ මම ක්‍රියාවලීන්හි අභ්‍යන්තර පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගත් අතර, මූල්‍ය වාර්තාකරණය සහ අදාළ හෙළිදරව් කිරීම් සම්බන්ධ අදාළ පාලනයන් පරීක්ෂා කළෙමි.<br>▪ පරිශීලක ප්‍රවේශය සහ වෙනස්වීම් කළමණාකරණයට අදාළ දෑ ඇතුළුව තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ පාලනයන්හි සැලසුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීමට මෙන්ම ඇගයීමට මම මගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් යොදා ගත්තෙමි.<br>▪ සමූහයට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව, මූලික වශයෙන් විමසීම් යොදා ගනිමින් මම ඉහළ මට්ටමේ අවබෝධයක්ද ලබා ගත්තෙමි.<br>▪ මම පොදු ලෙජර සැසඳීම් සමාලෝචනය ඇතුළුව නිරවද්‍යතාව සහ පරිපූර්ණත්වය සඳහා හෙළිදරව් කිරීම් හඳුනාගැනීමට භාවිත කරන වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කළෙමි. |

### 1.4 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් සමාගමට අදාළ වෙනත් තොරතුරු

මූල්‍ය ප්‍රකාශ සහ ඒ පිළිබඳ මගේ විගණක වාර්තාව හැර, අනෙකුත් තොරතුරු සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරුවලින් සමන්විත වේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකාරිත්වය වගකිව යුතුය. සමාගමේ 2023 වාර්ෂික වාර්තාව මෙම විගණක වාර්තාවේ දිනයෙන් පසුව මා වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මගේ මතයෙහි වෙනත් තොරතුරු ආවරණය නොකෙරෙන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මගේ මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති වෙනත් තොරතුරු ලබා ගත හැකි වූ විට ඒවා කියවීම සහ එසේ කිරීමේදී, වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශ හෝ විගණනයේදී ලබාගත් මගේ දැනුමට ප්‍රමාණාත්මකව නොගැළපේද යන්න සලකා බැලීමයි. එසේ නොමැති නම් ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස ප්‍රකාශිත බව පෙනේ.

සමූහයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති බව බව මා නිගමනය කරන්නේ නම්, ඒවා නිරවද්‍ය කිරීම සඳහා මා එම කාරණය පරිපාලනයට සම්බන්ධ අය වෙත සන්නිවේදනය කළ යුතු වේ. තවදුරටත් නිවැරදි නොකළ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව මා විසින් පාර්ලිමේන්තුවට සභාගත කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරිත්වය සහ පරිපාලනයට සම්බන්ධ පුද්ගලයන් සතු වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වන අතර, කළමනාකාරිත්වය තීරණය කරන පරිදි වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයෙන් තොර මූල්‍ය ප්‍රකාශ සැකසීමට එවැනි අභ්‍යන්තර පාලනයක් අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමණාකාරිත්වයේ වගකීමක් වන අතර, කළමණාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමණාකාරිත්වයේ වගකීමකි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පරිපාලනයට සම්බන්ධ අය වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තියට අනුව, සමූහයේ වාර්ෂික සහ වාරාන්තර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට හැකිවන පරිදි සමූහය විසින් සියලු ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.6 මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණක සතු වගකීම්

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශ, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර පෙන්නන බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් සිදු කිරීම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චයභාවය හා වෘත්තීය සැකමුසුභාවය සහිතව, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද:

වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගෙන තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ මගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම. දුස්සන්ධානය, ව්‍යාජ ලිපි ලේඛන සැකසීම, චේතනාන්මත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවන් ඇතිවීමට හේතු විය හැකි බැවින් වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වේ.

අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, සමාගම සහ සමූහයට අදාළ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකාරිත්වය විසින් අනුගමන කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාග න්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාග මේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතභාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට අපගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතුය. නැතහොත් එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය සංශෝධනය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වෙතත්, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශයන්හි සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ සාධාරණ ප්‍රකාශනයක් ලබා ගත හැකි අයුරින්, ගනුදෙනු සහ සිදුවීම් මූල්‍ය ප්‍රකාශ මගින් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කිරීම.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම. සමූහයේ විගණනය මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය පිළිබඳ වගකීම මා සතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි.

මාගේ විගණනයේදී මා විසින් හඳුනා ගන්නා ලද අභ්‍යන්තර පාලනයේ යම් සැලකිය යුතු අඩුපාඩු ඇතුළුව, වෙනත් කරුණු අතර, විගණනයේ සැලසුම්ගත විෂය පථය සහ කාලසීමාව සහ සුවිශේෂී විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පරිපාලනයට අදාළ පාර්ශ්වයන් සමඟ මම සන්නිවේදනය කරන්නෙමි.

### 2. අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි පහත අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගෙන ඇති අතර මාගේ විමර්ශනයන්ගෙන් පෙනී යන පරිදි, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගම විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයට අනුකූල වේ.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (සසස) වගන්තියේ අවශ්‍යතාවට අනුව පෙර වසරට අනුකූල වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (සඩ) වගන්තියේ අවශ්‍යතාවට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල මා විසින් පෙර වර්ෂයේ කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව ප්‍රමාණාත්මක කරුණුවලට සීමා වූ කිසිවක් මගේ අවධානයට ලක්ව නැත;

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවට අනුව සාමාන්‍ය ක්‍රමවේදයට පරිබාහිරව සමාගම විසින් ඇති කර ගත් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමාග මේ පාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීමට;

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවට අනුව සමාගමේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධානයන් සමඟ සමාගම අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීමට;

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවට අනුව සමාගම සිය බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට;

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවට අනුව අදාළ නීතිවලට අනුකූලව කාල රාමු තුළ සමාගමේ සම්පත් පිරිමැසුම්සහගතව, කාර්යක්ෂමව සහ ඵලදායී අයුරින් ලබා ගැනීම සහ උපයෝජනය කිරීම සිදු කොට නොමැති බව ප්‍රකාශ කිරීම.



ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

# මූල්‍ය ප්‍රකාශ - අන්තර්ගතය


| | | පිටු අංකය |
|---|---|---|
| **මූල්‍ය ප්‍රකාශ** | | |
| | ලාභ හෝ අලාභ ප්‍රකාශය | 225 |
| | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 226 |
| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 227 |
| | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | 228 |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 230 |
| **මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්** | | |
| 1. | සංස්ථාව සහ සමූහය පිළිබඳ | 231 |
| 2. | පිළියෙල කිරීමේ පදනම සහ වෙනත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 231 |
| 3. | සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති | 233 |
| 4 | නිකුත් කළ නමුදු බලාත්මක නොවන ප්‍රමිතීන් | 237 |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශය** | | |
| 5. | දළ ආදායම | 238 |
| 6. | ශුද්ධ පොලී ආදයම | 238 |
| 7. | ඉපැයූ ශුද්ධ වාරික | 240 |
| 8. | ගාස්තු සහ කොමිස් ආදායම | 241 |
| 9. | මූල්‍ය වත්කම් හි ශුද්ධ ලාභ/(අලාභය) - FVTPL | 242 |
| 10. | වෙනත් මෙහෙයුම් ආදායම් | 242 |
| 11. | ණය සහ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ ගාස්තු සහ වෙනත් අලාභ | 243 |
| 12. | කාර්ය මණ්ඩල වියදම් | 246 |
| 13. | ක්ෂය වීම සහ ක්‍රමක්ෂය කිරීම | 246 |
| 14. | ප්‍රතිලාභ, හිමිකම් පෑම් සහ ප්‍රතිරක්ෂණ වියදම් | 247 |
| 15 | වෙනත් මෙහෙයුම් වියදම් | 248 |
| 16. | මූල්‍ය සේවා මත බදු | 248 |
| 17. | ආදායම් බදු වියදම් | 249 |
| 18. | සාමාන්‍ය කොටසකට මූලික/තනුක ඉපයුම් | 252 |
| 19. | සාමාන්‍ය කොටසකට ලාභාංශ | 253 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - වත්කම්** | | |
| 20. | මිනුම්කරණ පදනමෙන් මූල්‍ය සාධන පත්‍රයන්හි විශ්ලේෂණය | 253 |
| 21. | වත්කම් සහ වගකීම් හි සාධාරණ අගය | 255 |
| 22. | මුදල් සහ මුදල්වලට සමාන දෑ | 262 |
| 23. | බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂය | 263 |
| 24. | මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට | 263 |
| 25. | ණය සහ ලැබිය යුතු - ක්‍රමක්ෂය පිරිවැය | 265 |
| 26. | ලැබිය යුතු රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ | 281 |
| 27. | මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට | 282 |
| 28. | ණය සාධන පත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | 283 |
| 29. | පරිපාලිතවල ආයෝජන | 285 |
| 30. | දේපළ ආයෝජන | 287 |
| 31. | වෙනත් වත්කම් | 288 |
| 32. | දේපළ, පිරියත සහ උපකරණ | 289 |
| 33. | භාවිතයට අයිතිය ඇති වත්කම් | 293 |
| 34. | කීර්ති නාමය සහ අස්පෘශ්‍ය වත්කම් | 294 |

| | | පිටු අංකය |
|---|---|---|
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - වගකීම්** | | |
| 35. | බැංකු වෙත ගෙවිය යුතු | 296 |
| 36. | ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 298 |
| 37. | නිකුත් කළ ණය සුරැකුම් | 299 |
| 38. | වෙනත් මූල්‍ය වගකීම් | 301 |
| 39. | රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 302 |
| 40. | කල්බදු වගකීම් | 304 |
| 41. | ප්‍රවර්තන බදු වගකීම් | 305 |
| 42. | වෙනත් වගකීම් | 306 |
| 43. | විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 307 |
| 44. | විලම්භිත බදු වගකීම්/(වත්කම්) | 309 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - හිමිකම්** | | |
| 45. | ප්‍රකාශිත ප්‍රාග්ධනය | 311 |
| 46. | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 312 |
| 47. | රඳවාගත් ඉපැයුම් | 312 |
| 48. | වෙනත් සංචිත | 313 |
| 49. | පාලනය නොවන හිමිකම් | 314 |
| **වෙනත් මූල්‍ය හෙළිදරව් කිරීම්** | | |
| 50. | අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් | 314 |
| 51. | සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය | 316 |
| 52. | ජංගම සහ ජංගම නොවන විශ්ලේෂණ | 316 |
| 53. | කාණ්ඩ අනුව මූල්‍ය වාර්තාකරණය | 318 |
| 54. | ඔඩපනය කළ වත්කම් | 320 |
| 55. | සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම | 320 |
| 56. | අවදානම් කළමනාකරණය | 326 |
| 57. | වාර්තාකරණ කාලසීමාවට පසු සිදුවීම් | 350 |

# ලාභ හෝ අලාභ ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමාගම සමූහය % | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 | සමූහය සමූහය % |
|---|---|---|---|---|---|---|---|---|
| දළ ආදායම | 5 | 238 | 32,018,308 | 26,741,380 | 19.73 | 39,162,645 | 32,630,986 | 20.02 |
| පොලී ආදායම | 6.1 | 239 | 30,196,588 | 23,881,526 | 26.44 | 33,406,918 | 25,926,792 | 28.85 |
| අඩු කළ: පොලී වියදම් | 6.2 | 239 | 18,206,943 | 10,832,186 | 68.08 | 19,270,402 | 11,205,126 | 71.98 |
| ශුද්ධ පොලී ආදායම | 6 | 238 | 11,989,645 | 13,049,340 | (8.12) | 14,136,516 | 14,721,666 | (3.97) |
| ශුද්ධ ඉපැයුම් වාරික | 7 | 240 | - | - | - | 4,673,853 | 4,939,071 | (5.37) |
| ගාස්තු සහ කොමිස් ආදායම | 8 | 241 | 1,265,287 | 1,876,524 | (32.57) | 691,195 | 1,321,513 | (47.70) |
| මූල්‍ය වත්කම්වල ශුද්ධ ලාභ/(අලාභ)-FVTPL | 9 | 242 | 9,143 | 26,783 | (65.86) | 4,168 | 86,525 | (95.18) |
| වෙනත් මෙහෙයුම් ආදායම | 10 | 242 | 547,290 | 956,547 | (42.78) | 386,511 | 357,085 | 8.24 |
| මුළු මෙහෙයුම් ආදායම | | | 13,811,365 | 15,909,194 | (13.19) | 19,892,243 | 21,425,860 | (7.16) |
| අඩු කළා: ණය සහ ලැබිය යුතු දෑ හි හානිකරණ ගාස්තු සහ වෙනත් අලාභ | 11 | 243 | 568,485 | 655,425 | (13.26) | 703,962 | 951,756 | (26.04) |
| කීර්ති නාමය සඳහා හානිකරණ ගාස්තු | 34 | 294 | - | 121,611 | (100.00) | - | 121,611 | (100.00) |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | | | 13,242,880 | 15,132,158 | (12.49) | 19,188,281 | 20,352,493 | (5.72) |
| අඩු කළ: වියදම් | | | | | | | | |
| කාර්ය මණ්ඩල වියදම් | 12 | 246 | 4,488,546 | 4,002,414 | 12.15 | 5,731,934 | 4,946,747 | 15.87 |
| ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය | 13 | 246 | 698,572 | 700,043 | (0.21) | 660,133 | 638,664 | 3.36 |
| ප්‍රතිලාභ, හිමිකම් පෑම් සහ ප්‍රතිරක්ෂණ වියදම් | 14 | 247 | - | - | - | 3,251,671 | 3,228,475 | 0.72 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 15 | 248 | 2,082,538 | 2,134,497 | (2.43) | 2,540,760 | 2,607,480 | (2.56) |
| මුළු මෙහෙයුම් වියදම් | | | 7,269,656 | 6,836,954 | 6.33 | 12,184,498 | 11,421,366 | 6.68 |
| මූල්‍ය සේවා මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය | | | 5,973,224 | 8,295,204 | (27.99) | 7,003,783 | 8,931,127 | (21.58) |
| අඩු කළ: මූල්‍ය සේවා සඳහා බදු | 16 | 248 | 1,631,468 | 1,645,111 | (0.83) | 1,673,580 | 1,705,797 | (1.89) |
| ආදායම් බදු වියදම්වලට පෙර ලාභය | | | 4,341,756 | 6,650,093 | (34.71) | 5,330,203 | 7,225,330 | (26.23) |
| අඩු කළ: ආදායම් බදු වියදම් | 17 | 249 | 1,324,118 | 1,991,084 | (33.50) | 1,888,502 | 2,407,161 | (21.55) |
| වසර සඳහා ලාභය | | | 3,017,638 | 4,659,009 | (35.23) | 3,441,701 | 4,818,169 | (28.57) |
| ලාභය බෙදහැරීම | | | | | | | | |
| සමාගමේ හිමිකම් දරන්නන් | | | 3,017,638 | 4,659,009 | (35.23) | 3,507,014 | 4,805,731 | (27.02) |
| පාලනය නොවන හිමිකම් | 49 | 314 | - | - | - | (65,313) | 12,438 | (625.11) |
| වර්ෂය සඳහා ලාභය | | | 3,017,638 | 4,659,009 | (35.23) | 3,441,701 | 4,818,169 | (28.57) |
| සාමාන්‍ය කොටසකට මූලික/තනුක ඉපැයුම් (රු.) | 18 | 252 | 1.48 | 2.28 | (35.09) | 1.72 | 2.35 | (26.81) |
| සාමාන්‍ය කොටසකට ලාභාංශ (රු.) | 19 | 253 | 0.50 | 1.25 | (60.00) | | | |

පිටු අංක 231 සිට 350 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය අංගයකි.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | | | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | 2023 රු. '000 | 2022 රු. '000 | සමූහය % | 2023 රු. '000 | 2022 රු. '000 | සමූහය % |
| **වර්ෂය සඳහා ලාභය** | | | 3,017,638 | 4,659,009 | (35.23) | 3,441,701 | 4,818,169 | (28.57) |
| **වෙනත් විස්තීර්ණ ආදායම, ඉදිරි වර්ෂවල ලාභ හෝ අලාභ වෙත නැවත වර්ගීකරණය කිරීමට ඇති ශුද්ධ බදු අයිතම (ශුද්ධ බදු):** | | | | | | | | |
| විදෙස් පරිපාලිතවල මූල්‍ය ප්‍රකාශ පරිවර්තනයෙන් ඇතිවන ශුද්ධ ලාභ/(අලාභ) | 48.4 | 314 | - | - | - | (594,615) | 1,439,171 | (141.32) |
| **ඉදිරි වර්ෂවල ලාභ හෝ අලාභ වෙත නැවත වර්ගීකරණය කිරීමට ඇති ශුද්ධ අයිතම** | | | - | - | - | (594,615) | 1,439,171 | (141.32) |
| **ඉදිරි වර්ෂවල ලාභ හෝ අලාභ වෙත නැවත වර්ගීකරණය කිරීමට ඇති අයිතම (ශුද්ධ බදු):** | | | | | | | | |
| **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ශුද්ධ ආයුගණක ලාභය/(අලාභය)** | | | | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණන ලාභ සහ අලාභ | 43 | 307 | 57,764 | (31,732) | (282.04) | 67,120 | (28,272) | (337.41) |
| ආයුගණන ලාභ හෝ අලාභ මත විලම්භිත බදු බලපෑම | 44.1 | 310 | (17,329) | 7,616 | 327.53 | (20,136) | 7,795 | 358.32 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධරණ අගය | | | | | | | | |
| නැවත මිනුම්කරණය මත ලාභය/(අලාභය) | 48.3 | 313 | (195,940) | (207,831) | 5.72 | (248,491) | (207,831) | (19.56) |
| ඉහත දෑ මත විලම්භිත බදු බලපෑම | 44.1 | 310 | 58,789 | 49,817 | 18.01 | 74,554 | 49,817 | 49.66 |
| **ඉදිරි වර්ෂවල ලාභ හෝ අලාභ වෙත නැවත වර්ගීකරණය කිරීමට නොමැති ශුද්ධ අයිතම** | | | (96,716) | (182,130) | 46.90 | (126,953) | (178,491) | 28.87 |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, ශුද්ධ බදු** | | | (96,716) | (182,130) | 46.90 | (721,568) | 1,260,680 | (157.24) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | 2,920,922 | 4,476,879 | (34.76) | 2,720,133 | 6,078,849 | (55.25) |
| **ලාභය බෙදහැරීම** | | | | | | | | |
| සමාගමේ හිමිකම් දරන්නන් වෙත | | | (96,716) | (182,130) | 46.90 | (426,193) | 555,132 | (176.77) |
| පාලනය නොවන හිමිකම් | 49 | 314 | - | - | - | (295,375) | 705,548 | 141.86 |
| වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්, ශුද්ධ බදු | | | (96,716) | (182,130) | 46.90 | (721,568) | 1,260,680 | (157.24) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | 2,920,922 | 4,476,879 | (34.76) | 2,720,133 | 6,078,849 | (55.25) |

පිටු අංක 231 සිට 350 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය අංගයකි.

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | 2023 රු. '000 | 2022 රු. '000 | සමූහය % | 2023 රු. '000 | 2022 රු. '000 | සමූහය % |
| **වත්කම්** | | | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 262 | 5,844,798 | 4,668,830 | 25.19 | 6,316,003 | 5,402,587 | 16.91 |
| බැංකු සහ මූල්‍ය ආයතන ශේෂයන් | 23 | 263 | 29,839,914 | 5,117,866 | 483.05 | 34,224,917 | 9,529,518 | 259.15 |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට | 24 | 263 | 203,975 | 25,140 | 711.36 | 345,093 | 849,298 | (59.37) |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය | 25 | 265 | 114,277,945 | 151,274,454 | (24.46) | 125,377,904 | 163,320,846 | (23.23) |
| ලැබිය යුතු රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ | 26 | 281 | - | - | - | 1,498,065 | 1,322,528 | 13.27 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගය | 27 | 282 | 944,653 | 1,333,278 | (29.15) | 1,372,962 | 1,632,941 | (15.92) |
| ණය සාධන පත්‍රය - ක්‍රමක්ෂය පිරිවැය | 28 | 283 | 10,903,577 | 9,827,221 | 10.95 | 15,859,672 | 16,013,525 | (0.96) |
| පරිපාලිතවල ආයෝජන | 29 | 285 | 3,291,604 | 3,213,788 | 2.42 | - | - | - |
| ආයෝජන දේපළ | 30 | 287 | 284,961 | - | - | 1,200,317 | 820,664 | 46.26 |
| වෙනත් වත්කම් | 31 | 288 | 1,030,138 | 749,155 | 37.51 | 1,281,022 | 831,825 | 54.00 |
| දේපළ, පිරියත සහ උපකරණ | 32 | 289 | 1,481,005 | 1,413,776 | 4.76 | 3,971,219 | 4,090,682 | (2.92) |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 33 | 293 | 1,615,939 | 1,972,380 | (18.07) | 1,372,423 | 1,539,484 | (10.85) |
| විලම්භිත බදු වත්කම් | 44 | 309 | 1,335,460 | 1,146,726 | 16.46 | 1,419,836 | 1,121,192 | 26.64 |
| කීර්ති නාමය සහ අස්පෘශ්‍ය වත්කම් | 34 | 294 | 19,193 | 21,965 | (12.62) | 137,436 | 139,603 | (1.55) |
| **මුළු වත්කම්** | | | 171,073,162 | 180,764,579 | (5.36) | 194,376,869 | 206,614,693 | (5.92) |
| **වගකීම්** | | | | | | | | |
| බැංකුවට ගෙවිය යුතු | 35 | 296 | 7,724,671 | 11,749,332 | (34.25) | 11,068,522 | 15,300,361 | (27.66) |
| ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 36 | 298 | 100,935,114 | 103,367,904 | (2.35) | 107,979,956 | 111,453,750 | (3.12) |
| නිකුත් කළ ණය සුරැකුම් | 37 | 299 | 16,706,049 | 17,244,313 | (3.12) | 16,564,956 | 17,103,223 | (3.15) |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 301 | 1,457,388 | 3,636,528 | (59.92) | 1,709,574 | 4,043,322 | (57.72) |
| රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 39 | 302 | - | - | - | 5,206,622 | 5,903,363 | (11.80) |
| කල්බදු වගකීම් | 40 | 304 | 1,753,723 | 2,059,050 | (14.83) | 1,477,875 | 1,588,115 | (6.94) |
| ප්‍රවර්තන බදු වගකීම් | 41 | 305 | 1,013,703 | 1,851,676 | (45.25) | 1,406,648 | 2,098,784 | (32.98) |
| වෙනත් වගකීම් | 42 | 306 | 1,016,790 | 1,369,054 | (25.73) | 1,202,218 | 1,399,030 | (14.07) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 43 | 307 | 673,659 | 668,411 | 0.79 | 756,320 | 748,944 | 0.98 |
| **මුළු වගකීම්** | | | 131,281,097 | 141,946,268 | (7.51) | 147,372,691 | 159,638,892 | (7.68) |
| **හිමිකම්** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 45 | 311 | 18,015,559 | 17,071,961 | 5.53 | 18,015,559 | 17,071,961 | 5.53 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 46 | 312 | 2,790,828 | 2,639,946 | 5.72 | 2,905,660 | 2,729,351 | 6.46 |
| රඳවාගත් ඉපැයුම් | 47 | 312 | 19,556,826 | 19,481,612 | 0.39 | 23,248,550 | 23,122,851 | 0.54 |
| වෙනත් සංචිත | 48 | 313 | (571,148) | (375,208) | 52.22 | 349,380 | 897,111 | (61.05) |
| **සමාගමේ හිමිකම් දරන්නන් වෙත බෙදහැරිය හැකි මුළු හිමිකම්** | | | 39,792,065 | 38,818,311 | 2.51 | 44,519,149 | 43,821,274 | 1.59 |
| පාලනය කළ හිමිකම් | 49 | 314 | - | - | - | 2,485,029 | 3,154,527 | (21.22) |
| **මුළු හිමිකම්** | | | 39,792,065 | 38,818,311 | 2.51 | 47,004,178 | 46,975,801 | 0.06 |
| **මුළු වගකීම් සහ හිමිකම්** | | | 171,073,162 | 180,764,579 | (5.36) | 194,376,869 | 206,614,693 | (5.92) |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | 50 | 314 | 5,626,774 | 6,852,234 | (17.88) | 5,750,578 | 6,899,223 | (16.65) |
| **සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.)** | 51 | 316 | 19.49 | 20.57 | (5.26) | 21.80 | 23.22 | (6.10) |

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව අපි සහතික කරන්නෙමු.

**ඔමාල් සුමනසිරි**
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**ශමින්ද්‍ර මර්සිලින්**
ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සහතික කොට අත්සන් තබන ලද්දේ;

**ප්‍රදීප් අමීර්තනායගම්**
සභාපති

**රොහාන් පතිරගේ**
අධ්‍යක්ෂ

පිටු අංක 231 සිට 350 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය අංගයකි.

2023 මැයි 26 වනිදා
කොළඹ

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය- සමාගම

| සමාගම | ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | වෙනත් සංචිත<br>සාධාරණ අගය සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2021 අප්‍රේල් 1 වැනිදාට ශේෂය | 14,892,036 | 2,406,995 | (117,377) | 17,159,777 | 34,341,431 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | | |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | 4,659,009 | 4,659,009 |
| වෙනත් විස්තීර්ණ ආදායම (ශුද්ධ බදු) | - | - | (207,831) | 25,701 | (182,130) |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (207,831) | 4,684,710 | 4,476,879 |
| **හිමිකම් හි සෘජුව හඳුනා ගත් හිමිකම් දරන්නන් සමඟ සිදු කළ ගනුදෙනු** | | | | | |
| සංචිතවලට මාරු කිරීම | - | 232,950 | (50,000) | (182,950) | - |
| ගෙවූ ලාභාංශ – අතුරු | 2,179,925 | - | - | (2,179,925) | - |
| - අවසාන | - | - | - | - | - |
| හිමිකම් දරන්නන් සමඟ සිදු කළ මුළු ගනුදෙනු | 2,179,925 | 232,950 | (50,000) | (2,362,875) | - |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 17,071,961 | 2,639,945 | (375,208) | 19,481,612 | 38,818,310 |
| 2022 අප්‍රේල් 1 දිනට ශේෂය | 17,071,961 | 2,639,945 | (375,208) | 19,481,612 | 38,818,310 |
| 2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අධිභාර බදු අයකිරීම සඳහා ගැළපීම් | - | - | | (1,947,167) | (1,947,167) |
| 2022 අප්‍රේල් 1 දිනට ගැළපූ ශේෂය | 17,071,961 | 2,639,945 | | 17,534,445 | 36,871,143 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | | |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | 3,017,638 | 3,017,638 |
| වෙනත් විස්තීර්ණ ආදායම (ශුද්ධ බදු) | - | - | (195,940) | 99,224 | (96,716) |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (195,940) | 3,116,862 | 2,920,922 |
| **හිමිකම් හි සෘජුව හඳුනා ගත් හිමිකම් දරන්නන් සමඟ සිදු කළ ගනුදෙනු** | | | | | |
| සංචිතවලට මාරු කිරීම | - | 150,882 | - | (150,882) | - |
| ගෙවූ ලාභාංශ - අවසාන | 943,598 | - | - | (943,598) | - |
| හිමිකම් දරන්නන් සමඟ සිදු කළ මුළු ගනුදෙනු | 943,598 | 150,882 | - | (1,094,480) | - |
| 2023 මාර්තු 31 දිනට ශේෂය | 18,015,559 | 2,790,827 | (571,148) | 19,556,827 | 39,792,065 |

පිටු අංක 231 සිට 350 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය අංගයකි.

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය- සමූහය

| සමූහය | | | වෙනත් සංචිත | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | සාධාරණ අගය සංචිත | විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සංචිත | රඳවාගත් ඉපැයුම් | එකතුව | පාලනය නොවන හිමිකම් | මුළු හිමිකම් |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2021 අප්‍රේල් 1 වැනිදාට ශේෂය | 14,892,036 | 2,464,951 | (121,517) | 542,836 | 20,682,106 | 38,460,412 | 2,661,541 | 41,121,953 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | | | | |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | - | 4,805,731 | 4,805,731 | 12,438 | 4,818,169 |
| වෙනත් විස්තීර්ණ ආදායම (ශුද්ධ බදු) | - | - | (207,831) | 733,623 | 29,340 | 555,132 | 705,548 | 1,260,680 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (207,831) | 733,623 | 4,835,071 | 5,360,863 | 717,986 | 6,078,849 |
| හිමිකම් හි සෘජුව හඳුනා ගත් හිමිකම් දරන්නන් සමඟ සිදු කළ ගනුදෙනු | | | | | | | | |
| සංචිතවලට මාරු කිරීම | - | 264,401 | (50,000) | - | (214,401) | - | - | - |
| ගෙවූ ලාභාංශ - අතුරු | 2,179,925 | - | - | - | (2,179,925) | - | (225,000) | (225,000) |
| හිමිකම් දරන්නන් සමඟ සිදු කළ මුළු ගනුදෙනු | 2,179,925 | 264,401 | (50,000) | - | (2,394,326) | - | (225,000) | (225,000) |
| 2022 මාර්තු 31 වැනිදාට ශේෂය | 17,071,961 | 2,729,352 | (379,348) | 1,276,459 | 23,122,851 | 43,821,275 | 3,154,527 | 46,975,802 |
| 2022 අප්‍රේල් 1 වැනිදාට ශේෂය | 17,071,961 | 2,729,352 | (379,348) | 1,276,459 | 23,122,851 | 43,821,275 | 3,154,527 | 46,975,802 |
| 2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අධිභාර බදු අයකිරීම සඳහා ගැළපීම් | - | - | - | - | (2,382,947) | (2,382,947) | (110,146) | (2,493,093) |
| 2022 අප්‍රේල් 1 වැනිදාට ගැළපූ ශේෂය | 17,071,961 | 2,729,352 | (379,348) | 1,276,459 | 20,739,904 | 41,438,328 | 3,044,381 | 44,482,709 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | | | | |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | - | 3,507,014 | 3,507,014 | (65,313) | 3,441,701 |
| වෙනත් විස්තීර්ණ ආදායම (ශුද්ධ බදු) | - | - | (248,491) | (299,240) | 121,538 | (426,193) | (295,375) | (721,568) |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (248,491) | (299,240) | 3,628,552 | 3,080,821 | (285,924) | 2,794,897 |
| හිමිකම් හි සෘජුව හඳුනා ගත් හිමිකම් දරන්නන් සමඟ සිදු කළ ගනුදෙනු | | | | | | | | |
| සංචිතවලට මාරු කිරීම | - | 176,310 | - | - | (176,310) | - | - | - |
| ගෙවූ ලාභාංශ - අවසාන | 943,598 | - | - | - | (943,598) | - | (273,428) | (273,428) |
| හිමිකම් දරන්නන් සමඟ සිදු කළ මුළු ගනුදෙනු | 943,598 | 176,310 | - | - | (1,119,908) | - | (273,428) | (273,428) |
| 2023 මාර්තු 31 වැනිදාට ශේෂය | 18,015,559 | 2,905,662 | (627,839) | 977,219 | 23,248,548 | 44,519,149 | 2,485,029 | 47,004,178 |

පිටු අංක 231 සිට 350 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය අංගයකි.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

## ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 7 හි 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' ට අනුකූලව, මුදල් ප්‍රවාහ සකස් කිරීමේ 'ඍජු ක්‍රමය' යොදා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. එමගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, ආයෝජන ක්‍රියාකාරකම්, සහ මූල්‍ය ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගනු ලබයි. මුදල් සහ මුදල් හා සමාන දෑ, නිශ්චිත මුදල් වටිනාකමකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස්වීම් සම්බන්ධයෙන් නොසැලකිය හැකි තරමේ අවදානමකට භාජනය වන, කෙටි කාලීන, ඉතා ඉහළ ද්‍රවශීලිතාවයෙන් යුත් අයෝජනවලින් සමන්විත වේ.

| මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා | | පිටු | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | 2023 | 2022 | 2023 | 2022 |
| | සටහන | අංක | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් සිදු වන මුදල් ප්‍රවාහ** | | | | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ හි ආදායම | 6.1 | 239 | 877,597 | 159,743 | 884,520 | 176,533 |
| ණය සහ ලැබිය යුතු දෑ සඳහා ගෙවීම් | | | (49,479,705) | (123,938,484) | (56,532,319) | (128,649,697) |
| ණය සහ ලැබිය යුතු දෑ වෙතින් මුදල් ලැබීම් | | | 108,112,701 | 137,014,283 | 116,824,867 | 139,838,872 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ගැළපූ ශේෂයන් සඳහා ආයෝජන | | | (96,735,535) | (30,785,830) | (102,232,584) | (34,428,160) |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ගැළපූ ශේෂයන් වෙතින් ලද මුදල් ලැබීම් | | | 74,982,057 | 31,510,851 | 81,747,062 | 34,065,096 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය සාධන පත්‍රයේ ආයෝජන | | | (40,967,052) | (31,590,690) | (45,032,821) | (37,883,431) |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය සාධන පත්‍රයේ මුදල් ලැබීම් | | | 42,620,849 | 29,316,856 | 47,916,827 | 31,022,471 |
| ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ගෙවුම් | | | (164,570,652) | (122,737,129) | (169,175,292) | (124,719,248) |
| ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ වෙතින් මුදල් ලැබීම් | | | 147,334,387 | 116,799,179 | 150,395,668 | 124,371,580 |
| වෙනත් ආදායම් වෙතින් මුදල් ලැබීම් | | | 4,259 | 2,079 | 184,223 | 219,280 |
| මූල්‍ය වත්කම්වල ආයෝජන - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය | | | (189,797) | (4,573,220) | (286,151) | (5,221,552) |
| මූල්‍ය වත්කම්වලින් ලැබීම් - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය | | | 1,616 | 4,684,650 | 794,525 | 5,740,532 |
| මූල්‍ය වත්කම්වලින් ලැබීම් - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය | | | 313,654 | 3,756 | 566,386 | 156,320 |
| මූල්‍ය වත්කම්වල ආයෝජන - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය | | | - | (1,150,081) | (452,420) | (1,175,931) |
| කාර්ය මණ්ඩල වියදම් සඳහා ගෙවීම් | | | (4,724,920) | (3,709,482) | (5,986,957) | (4,653,596) |
| මෙහෙයුම් කල්බදු වගකීම් සඳහා ගෙවීම් | | | (651,359) | (667,068) | (438,364) | (385,273) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාකම් සඳහා ගෙවීම් | | | (3,796,402) | (3,444,436) | (4,577,598) | (3,623,514) |
| පාරිභෝගිකයින්ගෙන් ලද වාරික | | | - | - | 4,498,316 | 4,641,005 |
| ගෙවූ හිමිකම්පෑම් | | | - | - | (3,948,414) | (2,340,996) |
| ආයෝජනවලින් ලද ලාභාංශ ආදායම | | | 343,930 | 711,841 | 7,014 | 6,216 |
| ගෙවූ පාරිතෝෂික | 43 | 307 | (92,658) | (33,471) | (100,021) | (39,309) |
| ගෙවූ ආදායම් බදු | 41.1 | 306 | (4,256,539) | (1,175,248) | (5,317,964) | (1,958,933) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය වූ/ (භාවිත වූ) ශුද්ධ මුදල්** | | | 9,126,431 | (3,601,901) | 9,738,503 | (4,841,735) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ** | | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැණුම් | 32 | 289 | (253,253) | (385,714) | (234,426) | (307,456) |
| දේපළ, පිරියත සහ උපකරණ විකුණුම්වලින් ලද මුදල් | | | 39,867 | 14,005 | 88,898 | 131,604 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැණුම් | 34 | 294 | (7,684) | (10,325) | (12,781) | (12,835) |
| ආයෝජනවලින් ලද ලාභාංශ | | | - | - | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිත වූ)/ උත්පාදනය වූ ශුද්ධ මුදල්** | | | (221,070) | (382,034) | (158,309) | (188,687) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් සිදු වූ මූල්‍ය ප්‍රවාහ** | | | | | | |
| බැංකු වෙත සිදුකළ යුතු ගෙවීම් | 35.1 | 296 | (7,618,774) | (1,946,889) | (9,082,471) | (2,504,664) |
| බැංකුවලින් ණය ලබා ගැනීම් | 35.1 | 296 | 2,000,000 | 7,000,000 | 2,799,279 | 7,250,000 |
| නිකුත් කළ ණය සුරැකුම් සඳහා ගෙවීම් | 37.1 | 299 | (2,093,667) | (8,456,772) | (2,077,567) | (8,440,722) |
| නිකුත් කළ ණය සුරැකුම්වලින් ණය ගැනීම | | | - | 10,000,000 | - | 10,000,000 |
| කොටස් හිමියන් වෙත ගෙවූ ලාභාංශ | | | 17 | 80 | 17 | 80 |
| පාලනය නොවන හිමිකම් වෙත ගෙවූ ලාභාංශ | | | - | - | (123,900) | (150,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් (භාවිත වූ)/ උත්පාදනය වූ ශුද්ධ මුදල්** | | | (7,712,424) | 6,596,419 | (8,484,642) | 6,154,694 |
| **ශුද්ධ (අඩුවීම) මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | 1,192,937 | 2,612,484 | 1,095,552 | 1,124,272 |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 4,599,141 | 1,986,657 | 4,077,087 | 2,952,815 |
| **වර්ෂ අවසානය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | 5,792,078 | 4,599,141 | 5,172,639 | 4,077,087 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 5,844,798 | 4,668,831 | 6,316,003 | 5,402,587 |
| බැංකු අයිරාව | | | (52,720) | (69,690) | (1,143,364) | (1,325,500) |
| **වර්ෂ අවසානය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | 5,792,078 | 4,599,141 | 5,172,639 | 4,077,087 |

පිටු අංක 231 සිට 350 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යාවශ්‍ය අංගයකි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. ආයතනය සහ සමූහය පිළිබඳ තොරතුරු

### 1.1 ආයතනික තොරතුරු

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (මෙතැන් පටන් 'සමාගම') 1995 අගෝස්තු 22 දින සංස්ථාපිත, ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සීමාසහිත පොදු සමාගමකි. එය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමකි. 2011 නොවැම්බර් 24 දින කොළඹ කොටස් වෙළඳපොළේ මූලික ලැයිස්තුගත කිරීමක් සමාගම සතු වේ. 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම නැවත ලියාපදිංචි කරන ලදී.

එහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය නො. 1161, මරදාන පාර, කොළඹ 08 ලිපිනයේ පිහිටා ඇත.

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මඟින් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (මවු සමාගම), එහි පරිපාලිත (සියල්ල එක්ව 'සමූහය' ලෙස හැඳින්වේ) සමන්විත වේ.

**මවු සමාගම සහ සමස්ත පරිපාලක සමාගම**

රජයේ ආයතනයක් වන මහජන බැංකුව සමාගමේ මවු සමාගම වේ.

**සේවකයින් සංඛ්‍යාව**

2023 මාර්තු 31 දිනට සමාගමේ සහ සමූහයේ කාර්ය මණ්ඩලය පිළිවෙළින් 2,114 ක් සහ 2,995 ක් විය. (2022 මාර්තු 31 දිනට 2,245 සහ 3,148 ක් විය.)

### 1.2 සමූහයේ තොරතුරු

**මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

**සමාගම**

**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී**

මූලික ව්‍යාපාර ක්‍රියාකාකම් ලෙස මූල්‍ය කල්බදු සැපයීම, කුලී පිට ගැණුම් වත්කම් මූල්‍යකරණය, කාලසීමා ණය, ඉස්ලාමීය ණය, ආන්තික වෙළඳාම, කොටස් වෙළඳාම, ණය සාධන පත්‍ර නිකුත් කිරීම, සාධකකරණය, රන් ණය සහ මහජන තැන්පතු ජංගමකරණය දැක්විය හැකිය.

**පරිපාලිතයන්**

| පරිපාලිතයේ නම | මූලික ක්‍රියාකාරකම් | සංස්ථාපිත රට | හිමිකම් අයිතීන් % | |
|---|---|---|---|---|
| | | | 2023 | 2022 |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | රථවාහන සමූහ කළමනාකරණය, රථවාහන තක්සේරුකරණය, රථවාහන විකුණුම්, රක්ෂණ තක්සේරුව සහ රථවාහන අලුත්වැඩියාව | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙනයාම (සාමාන්‍ය) | ශ්‍රී ලංකාව | 75% | 75% |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | කාර්යාල සංකීර්ණයක් ගොඩ නැගීම සහ මෙහෙයවීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | අඩු ආදායම් උපයන්නන්ට සහ ක්ෂුද්‍ර ව්‍යාපාර ආයතන වෙත බැංකු නොවන මූල්‍ය සේවා සැපයීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | කල්බදු/ණය සහ අත්තිකාරම් සැපයීම, ණය සාධන පත්‍ර නිකුත් කිරීම සහ මහජන තැන්පතු ජංගමකරණය | බංගලාදේශය | 51% | 51% |

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ මූලික ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්කම් සිදු නොවිය.

## 2. ගිණුම් සකස් කිරීමේ පදනම සහ අනෙකුත් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 අනුකූලතා ප්‍රකාශය

2023 මාර්තු 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ වෙනම සකස් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ (ස් ශ්‍රී ලංකා) ආයතනය විසින් සකස් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (බ්‍යඝෂ සහ බණී) අනුව සහ 2007 අංක 07 දරන සමාගම් පනත, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනත යන පනත්වල අවශ්‍යතාවලට සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත. මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු හැරුණුකොට, මෙම මූල්‍ය ප්‍රකාශ ගිණුම්කරණයේ උපචිත පදනම අනුව සකස් කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 'අඅඅගපීරසක්බන්ග ජදප රැ අඅඅගිකීජගකන' වෙතින් ලබා ගත හැකිය.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම නියාමනය කරන් බ්‍යඝෂ සහ බණී හි අවශ්‍යතාවලට අනනුකූල වන කිසිදු ආකාරයක අයෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය විසින් අනුගමනය කර නැත.

සමූහය විසින් වර්ෂය තුළ අනුගමනය කරන ලද සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර පිටු අංක 233 හි සටහන් 3 හි දක්වා ඇත.

### 2.2 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම

2007 අංක 07 දරන සමාගම් පනතේ සහ බ්‍යඝෂ සහ බණී හි විධිවිධාන අනුව සමාගමේ සහ සමූහයේ මෙම මූල්‍ය ප්‍රකාශයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

"සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අදාළ සහතිකයේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ වගකීම පිළිග නු ලැබේ.

මෙම මූල්‍ය ප්‍රකාශවලට පහත සංරචක ඇතුළත් වේ:

- සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු සැපයෙන ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය;
- වසර අවසාන වන විට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සැපයෙන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය;
- සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ කොටස් හිමියන්ගේ හිමිකම්හි සියලුම වෙනස්කම් නිරූපණය කෙරෙන හිමිකම් වෙනස්වීම පිළිබඳ පකාශය;

- සමාගමට සහ සමූහයට මුදල් සහ මුදල් සමාන දෑ උත්පාදනය කිරීමට ඇති හැකියාව සහ එම මුදල් ප්‍රවාහයන් උපයෝජනයට ආයතනය සතු වන අවශ්‍යතා පිළිබඳව පරිශීලකයින්ට තොරතුරු සැපයෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය; සහ,

- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්.

### 2.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ (සංසන්දනයන් ඇතුළත්ව) ප්‍රකාශයට පත් කිරීම සඳහා, 2023 මැයි 26 දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවට අනුකූලව අනුමතය සහ අවසරය ලබා දී ඇත.

### 2.4 මිනුම්කරණ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත කරුණු හැර සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ, ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කොට ඇත.

| කරුණු | මිනුම් පදනම | සටහන | පිටු අංකය |
|---|---|---|---|
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | සාධාරණ අගය | 24 | 263 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය | සාධාරණ අගය | 27 | 282 |
| ආයෝජන දේපළ | සාධාරණ අගය | 30 | 287 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් හි වර්තමාන අගය සහ ආයුගණන ලාභය හෝ අලාභය ලෙස වගකීම් හඳුනා ගැනේ. | 43 | 307 |

### 2.5 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සමාගමේ සහ සමූහයේ වත්කම් සහ වගකීම්, ඒවායේ අදාළ ද්‍රවශීලිතා සහ කල් පිරීම නිරූපණය කිරීමේ ස්වභාවය අනුව වර්ග කොට ලැයිස්තුගත කර ඇත. වාර්තාකරණ දිනයට (ජංගම) පසු මාස 12 ක් ඇතුළත සහ වාර්තාකරණ දිනයට (ජංගම නොවන) පසු මාස 12 කට වැඩියෙන් ප්‍රතිසාධන හෝ නිරවුල් කිරීම් විශ්ලේෂණය පිටු අංක 316 හි සටහන 52 හි ඉදිරිපත් කොට ඇත (ජංගම/ ජංගම නොවන). මූල්‍ය ප්‍රකාශවලට බලපාන උද්ධමන සාධක සඳහා ගැළපුම් සිදු කොට නැත.

### 2.6 හිලවු කිරීම

හඳුනාගත් වටිනාකම හිලවු කිරීමට නෛතික බලාත්මක කළ හැකි අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට අදහස් කරන විට හෝ, එකවර වත්කම් උපලබ්ධි කිරීමට සහ වගකීම් නිරවුල් කිරීමට අදහස් කරන විට පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලවු කොට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ අගය වාර්තා කොට ඇත. යම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථකථනයක් මගින් අවශ්‍ය හෝ අවසර දී ඇත්නම් සහ සමූහයේ ගිණුම්කරණ ප්‍රමිතිවල විශේෂයෙන් හෙළිදරව් කර ඇත්නම් මිස ආදායම් සහ වියදම් ඒකාබද්ධ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හිලවු කරනු නොලැබේ.

### 2.7 ව්‍යවහාරික සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල්

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ, සමූහය පවත්වාගෙන යනු ලබන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල වන (සමූහයේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල්) ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්වේ.

### 2.8 වැටයීම

"මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" හි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 01 මගින් පිළිගෙන ඇති පරිදි වෙනත් ආකාරයකට ඉදිරිපත් කොට ඇති අවස්ථාවකදී හැර මූල්‍ය ප්‍රකාශවල වටිනාකම් ආසන්න රුපියල් දහසට වටයා ඇත.

### 2.9 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

"මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" හි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 01 අනුකූලව, සෑම සමාන කරුණුවල ප්‍රමාණාත්මක මට්ටම මූල්‍ය ප්‍රකාශවල වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයේ හෝ කාර්යයේ කරුණු ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලබයි.

### 2.10 සුවිශේෂී ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

SLFRSs සහ LKASs අවශ්‍යතාවලට අනුකූලව සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී, කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කළ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වටිනාකම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතුය. එමෙන්ම කළමනාකරණය විසින් ඉදිරි මූල්‍ය වර්ෂ තුළ වත්කම් සහ වගකීම් හි ධාරණ වටිනාකමට ද්‍රව්‍යමය ගැළපුම් ඇති කළ හැකි සැලකිය යුතු අවදානම් පවතින වාර්තාකරණ දිනයට ඉදිරිය සලකා බලමින් මූලික උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතාවන් හි ප්‍රධාන මූලාශ්‍ර සලකා බැලීම සිදු කළ යුතුය. මෙම උපකල්පනයන්ට සාපේක්ෂව සැබෑ ප්‍රතිඵලයන් වෙන්ස විය හැකිය.

ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනම මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල සංශෝධන, ඒවා සංශෝධනය කළ කාලය තුළ සහ අනාගතයේ බලපානු ලබන ඕනෑම කාලයක හඳුනා ගැනේ.

අවිනිශ්චිතතා ඇති කරනු ලබන ප්‍රධාන වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන පහතින් දක්වා ඇති අතර, අදාළ සටහන්වල එවැනි වත්කම් සහ වගකීම් හි අදාළ ධාරණ වටිනාකම දක්වා ඇත.

#### අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම පවත්වා ගැනීමට සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කර ඇති අතර, තක්සේරු කළ හැකි ඇස්තමේන්තු කළ හැකි අනාගතය තුළ ව්‍යාපාර පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත් වේ. එය මෙහෙයුම් සිදු කරනු ලබන පරිසරය තුළ ඉදිරි ආර්ථික අවශ්‍යතා සඳහා ප්‍රක්ෂේපණ සිදු කිරීමට තක්සේරු මඟින් වත්මන් ආර්ථික සංවර්ධනයන් සලකා බලන ලදී. මෙම ප්‍රතිපත්ති යොදා ගැනීම සඳහා අවිනිශ්චිතතා ඇති කරන ලද මූලික කාරණාවලට රටේ අස්ථාවර ආර්ථික පරිසරය, ව්‍යාපාර මෙහෙයුම්වලට කොවිඩ් 19 උවදුරේ බලපෑම, සමූහයේ කාර්යසාධනය සහ ආර්ථික ප්‍රතිසාධනයට සහය ලබා දීමට රජය විසින් යොදා ගත් ක්‍රියාමාර්ග අදාළ වේ. අඛණ්ඩ පැවැත්ම පවත්වා ගැනීම සඳහා සමූහය සතු හැකියාවට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

විශේෂයෙන්ම අභ්‍යන්තර ආර්ථික පරිසරය නිරූපණය කරනු ලබන ඉහළ මට්ටමේ අනපේක්ෂිතතා ආයතනික සහ පුද්ගල ණය යෝග්‍යතාවයේ පිරිහීමට හේතු වේ. මෙය අක්‍රීය ණය ඉහළ යාම සඳහා බලපානු ලබන අතර, එම නිසා පොදුවේ සමාගම සහ එම අංශය විසින් සැලකිය යුතු හානිකරණ අලාභ හඳුනා ගත හැකි විය. ඉහත කරුණු සහ සමූහයේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ ද්‍රවශීලිතා යාන්ත්‍රණ ප්‍රවේශයට සමාගමේ හැකියාව සමඟින්, සමූහය විසින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම යොදා ගැනීමේ කොන්දේසි සපුරා ඇති බවට සමාගම ඇස්තමේන්තු කරයි. එබැවින් මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පදනම යටතේ සකස් කිරීම සිදු කරනු ලබයි.

#### මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණය

SLFRS 9 අනුව, සමූහයේ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කර පසුව විවිධ කාණ්ඩවලට, එනම් ක්‍රමක්ෂ පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් (FVOCI) හරහා සාධාරණ වටිනාකම සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම (FVTPL) පහත සඳහන් නිර්ණායක මත පදනම්ව මිනුම් කරනු ලැබේ;

- 3.5.2 සටහනේ දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වන ආයතනයේ ව්‍යාපාර ආකෘතිය

- 3.5.2 සටහනේ දක්වා ඇති මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ

**මූල්‍ය වත්කම් හි හානිකරණ අලාභ**

SLFRS 9 යටතේ සියලු වර්ගවල මූල්‍ය වත්කම් හරහා සිදුවන හානිකරණය මැනීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ. විශේෂයෙන්ම, අනාගත මුදල් ප්‍රවාහයන්හි ප්‍රමාණය සහ කාලසීමාව මෙන්ම හානිකරණ අලාභ නිර්ණය කිරීමේදී අතිරේක වටිනාකම් ඇස්තමේන්තු කිරීම සඳහා මෙය අවශ්‍ය වේ.

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී ඇති බවට කිසියම් විෂය මූලික සාක්ෂි තිබේද යන්න, එක් එක් වාර්තාකරණ දිනයන්හිදී සමූහය/සමාගම මඟින් තක්සේරු කරයි.

**ණය සහ ලැබිය යුතු දෑ හි හානිකරණ අලාභ**

ඒ අනුව, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හානිකරණ අලාභයක් දැක්විය යුතුද යන්න තක්සේරු කිරීම සඳහා සමූහය විසින් වාර්තා කරන සෑම දිනකම තනි තනිව සැලකිය යුතු ණය සහ අත්තිකාරම් සමාලෝචනය කරයි. විශේෂයෙන්ම, හානිකරණ අලාභය නිර්ණය කරන විට අනාගත මුදල් ප්‍රවාහයේ ප්‍රමාණය සහ කාලය තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චය අවශ්‍ය වේ.

මෙම ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ සාධක ගණනාවක් පිළිබඳ වන උපකල්පන මත වන අතර එම නිසා සත්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය. එමඟින් සිදු කරන ලද හානිකරණ වෙන් කිරීම වෙත අනාගත වෙනස්කම් ඇති වේ.

'ණය සහ ලැබිය යුතු දෑ මත ඇති වූ හානිකරණ අලාභ' පිළිබඳ විස්තර පිටු අංක 277 හි මූල්‍ය ප්‍රකාශ සඳහා වන 25.7 සටහනේ දක්වා ඇත.

**මූල්‍ය ආයෝජනයන්හි හානිකරණ ගාස්තු**

SLFRS 9-මූල්‍ය ආයෝජනයට අනුකූලව හානිකරණයට යටත්ව ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මූල්‍ය ආයෝජන වර්ගීකරණය කර ඇත. හානිකරණ පිරිවැය යටතේ ගණනය කරන ලද ණය සාධන පත්‍ර පිළිබඳ ඓතිහාසික අලාභ අත්දැකීමක් සමාගමට/සමූහයට නොමැත. එබැවින් සමූහය විසින් බාහිර මූලාශ්‍ර මඟින් ප්‍රකාශයට පත් කරන ලද පැහැර හැරීමේ සම්භාවිතාව (PD) එනම් බාහිර ණය ශ්‍රේණිගත කිරීම සඳහා - බ්ලූම්බර්ග් ආදිය සලකා බලයි. ශ්‍රී ලංකා රජය විසින් රුපියල්වලින් නිකුත් කරන ලද පැහැර හැරීම් නිසා සිදුවූ අලාභය (LGD) සඳහා ණය සුරැකුම්පත් 0% ලෙස සලකනු ලබන අතර, අනෙකුත් සියලුම සාධන පත්‍ර සඳහා කර්මාන්ත සාමාන්‍යය පැහැර හැරීම් නිසා සිදුවූ අලාභය ලෙස සලකනු ලබයි.

මූලික හඳුනාගැනීමේ සිට මූල්‍ය ආයෝජන සම්බන්ධයෙන් ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී නොමැත. එබැවින් සමූහය විසින් එම ආයෝජන සඳහා මූල්‍ය ප්‍රකාශවල අපේක්ෂිත ණය අලාභ වාර්තා කර නොමැත.

**FVOCI හි හානිකරණය**

FVOCI හි හානිකරණය' පිළිබඳ විස්තර පිටු අංක 282 හි මූල්‍ය ප්‍රකාශ සඳහා වන 27 සටහනේ දක්වා ඇත.

**දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය**

සමූහය විසින් එක් එක් වාර්තාකරණ දිනයේදී දේපළ, පිරියත සහ උපකරණවල අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් ආයු කාලයන් සහ ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කෙරේ. කළමනාකාරිත්වයේ විනිශ්චය මෙම අගයන්, අනුපාත, ක්‍රම තක්සේරු කිරීමේදී ක්‍රියාත්මක වන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයට යටත් වේ.

**අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය**

'අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය' පිළිබඳ විස්තර පිටු අංක 294 මූල්‍ය ප්‍රකාශ සඳහා වන 34 සටහනේ දක්වා ඇත.

**GRI 207-1,207-2,207-3,207-4,3-3**

**හුවමාරු මිල රෙගුලාසි**

සමාගම ආදායම් බදු සහ හුවමාරු මිල රෙගුලාසි ඇතුළු අනෙකුත් බදුවලට යටත් වේ. අදාළ හුවමාරු මිල රෙගුලාසිවල අර්ථ නිරූපණය සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවයන්, හුවමාරු මිල රෙගුලාසිවල බලපෑම තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චය භාවිත කිරීම අවශ්‍ය විය. ඒ අනුව ආශ්‍රිත ව්‍යාපාර හඳුනාග ැනීම, අදාළ ආසන්න මිල ගණන් ඇස්තමේන්තු කිරීම සහ සුදුසු මිලකරණ යාන්ත්‍රණයක් තෝරා ගැනීම අන්තර්ගත වන මුත් ඒවාට සීමා නොවූ, අංශවල රෙගුලාසි යොදා ගැනීමේදී තීරණාත්මක විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිත කරන ලදී. වත්මන් බදු ගාස්තුව එවැනි විනිශ්චයන්ට යටත් වේ. කළමනාකාරිත්වයේ අර්ථ නිරූපණය සහ හුවමාරු මිල රෙගුලාසි යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තුගත ආදායම් බදු අයකිරීම් සහ සත්‍ය වශයෙන් ගෙවිය යුතු මුදල අතර වෙනස්කම් ඇති විය හැකිය.

**GRI 207-1,207-2,207-3,207-4,3-3**

**විලම්බිත බදු**

'විලම්බිත බද්ද' පිළිබඳ විස්තර පිටු අංක 309 හි මූල්‍ය ප්‍රකාශ සඳහා වන 44 සටහනේ දක්වා ඇත.

**විශ්‍රාම ප්‍රතිලාභ වගකීම**

'විශ්‍රාම ප්‍රතිලාභ වගකීම' පිළිබඳ විස්තර පිටු අංක 307 හි මූල්‍ය ප්‍රකාශ සඳහා වන 43 සටහනේ දක්වා ඇත.

**පරිපාලිතයක් වන පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම් තක්සේරු කිරීම**

සාමාන්‍ය රක්ෂණ ගිවිසුම්වල ඇස්තමේන්තු වාර්තා කරන දිනට ලද හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය සහ වාර්තා කරන දිනට දරන ලද නමුත් තවමත් වාර්තා කර නොමැති හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය (IBNR) යන දෙයාකාරයට සිදු කළ යුතුය. අවසාන හිමිකම් පිරිවැය නිශ්චිතව තහවුරු කිරීමට පෙර සැලකිය යුතු කාලයක් ගත විය හැකිය. නොගෙවූ හිමිකම් ප්‍රමාණයන් ඇස්තමේන්තු කිරීම සඳහා පාදක වන ප්‍රධාන උපකල්පනය වන්නේ අතීත හිමිකම් ක්‍රියාකාරීත්වයෙන් ලද අත්දැකීමයි.

අලාභ ගැළපුම් ඇස්තමේන්තුවල ප්‍රකාශිත වටිනාකමින් වෙන් කර තැබීමෙන් හෝ ඒවායේ අනාගත වර්ධනය පිළිබිඹු කිරීම සඳහා වෙන වෙනම ප්‍රක්ෂේපණය කිරීම මඟින් විශාල හිමිකම් සාමාන්‍යයෙන් වෙන් වශයෙන් සලකා බලනු ලැබේ. බොහෝ අවස්ථාවන්හිදී, අනාගත හිමිකම් අනුපාත, උද්ධමනය හෝ අලාභ අනුපාත සම්බන්ධයෙන් පැහැදිලි උපකල්පන සිදු නොකෙරේ.

## 2.11 සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා සහ අන්තර් කාල පරිච්ඡේද සංසන්දනය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළත් සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශවල පෙර කාල සීමාව සම්බන්ධයෙන් අනාවරණය කර ඇත. වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සහ වත්මන් වසරේ තොරතුරු සමඟ සැසඳිය හැකි පරිදි පෙර වසරේ මූල්‍ය ප්‍රකාශ සහ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබේ.

## 3. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට සමාගම, එහි පරිපාලිත සමාගම් සහ එහි ආශ්‍රිත සමාගම ඇතුළත් වේ. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි පරිපාලිත පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හැර සමාගමේ පරිපාලිත සමාගම්වල සහ ආශ්‍රිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ එම වාර්තාකරණ වර්ෂය සඳහා සකස් කර ඇති අතර, පීපල්ස් ඉන්ෂුවර්න්ස් පීඑල්සී හි මූල්‍ය වර්ෂය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා එකම වාර්තාකරණ වර්ෂය භාවිත කර ඇත.

#### 3.1.1 ව්‍යාපාර සංයෝජනය සහ කීර්ති නාමය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - SLFRS 03 (ව්‍යාපාර සංයෝජන) හි අවශ්‍යතාවන්ට අනුකූලව ව්‍යාපාර සංයෝජනයන් අත්පත් කර ගැනීමේ ක්‍රමය යොදා ගනිමින් ගිණුම්ගත කෙරේ.

සමූහය සහ සමාගම මඟින් කීර්ති නාමය මනිනු ලබන්නේ, අත්පත් කරගැනීමට ලක් වූ ආයතනයෙහි කවර හෝ පාලනයට නතු නොවන හඳුනාගත් වටිනාකමක්ද ඇතුළුව මාරු කරන ලද ප්‍රතිශ්‍යාවේ සාධාරණ අගයෙන් හඳුනාගත හැකි අත්පත් කරගත් වත්කම් සහ උපකල්පිත වගකීම්වල ශුද්ධ හඳුනාගත් වටිනාකම අඩු කිරීමෙන් වන අතර, සියලුම මිනුම් අත්පත් කර ගන්නා ලද දිනට සිදු කෙරේ. අතිරික්තය ඍණාත්මක වන විටදී, කේවල් කොට මිලදී ගැනීමේ ලාභයක් වහාම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගන්නා ලද කීර්ති නාමය මූලිකව පිරිවැය අනුව මනිනු ලබන අතර, එය අත්පත් කරගන්නා ලද හඳුනාගත හැකි වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් සම්බන්ධ සමූහයේ අයිතිය මත ව්‍යාපාර සංයෝජන පිරිවැයෙහි අතිරික්තය වේ.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, කීර්ති නාමය මනිනු ලබන්නේ පිරිවැය අනුව කවර හෝ සමුච්චිත හානිකරණ අලාභයන් අඩු කිරීමෙනි. සිදුවීම් හෝ තත්ත්වයන් සම්බන්ධ වෙනස්වීම් මඟින් ධාරණ අගය හානිකරණයට ලක්ව ඇති බවට දැක්වෙන්නේ නම්, කීර්ති නාමය හානිකරණය සඳහා වාර්ෂිකව හෝ ඊට වඩා නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. හානිකරණ පරීක්ෂාවන් සඳහා, ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගන්නා ලද කීර්ති නාමය, අත්පත් කර ගන්නා ලද දිනයේ සිට, අදාළ සංයෝජනයෙහි හවුල්කාරීත්වයන් මඟින් ප්‍රතිලාභ ලැබේ යැයි අපේක්ෂිත සමූහයේ එක් එක් මුදල් උත්පාදන ඒකක (CGU) හෝ මුදල් උත්පාදන ඒකක සමූහයන් (CGU) වෙත බෙදා වෙන් කෙරෙන අතර, එහිදී එකී ඒකකයන් වෙත අත්පත් කර ගැනීමට ලක් වූ ආයතනයෙහි වෙනත් වත්කම් හෝ වගකීම් පවරා ඇති බවක් හෝ නොමැති බවක් සැලකිල්ලට නොගැනේ.

කීර්ති නාමය මගින් මුදල් උත්පාදන ඒකකයක (CGU) (හෝ (CGU) සමූහයක) කොටසක් නිර්මාණය වන සහ එකී ඒකකය තුළ මෙහෙයුම බැහැර කරනු ලබන අවස්ථාවකදී, බැහැර කරන ලද මෙහෙයුම ආශ්‍රිත කීර්ති නාමය, අදාළ මෙහෙයුම් බැහැර කිරීමේ ලාභය හෝ අලාභය නිර්ණය කිරීමේදී මෙහෙයුමෙහි ධාරණ අගය තුළ ඇතුළත් කෙරේ. මෙකී තත්ත්වයන් තුළ බැහැර කරන ලද කීර්ති නාමය මනිනු ලබන්නේ බැහැර කරන ලද මෙහෙයුමෙහි සාපේක්ෂ වටිනාකම් සහ මුදල් උත්පාදන ඒකකය (CGU) මගින් රඳවා ගන්නා ලද කොටස පදනම් කර ගනිමිනි.

පරිපාලිතයන් විකුණා දමනු ලබන අවස්ථාවේදී, විකුණුම් මිල සහ ශුද්ධ වත්කම් අතර වටිනාකම සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් සහ කීර්ති නාමය ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

### 3.1.2. පොදු පාලන ව්‍යාපාර සංයෝජන

පොදු පාලන ව්‍යාපාර සංයෝජන ගිණුම්ගත කරනු ලබන්නේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද, පොදු පාලන ව්‍යාපාර සංයෝජනය සඳහා ඒකාබද්ධ ගිණුම්කරණය - නිර්දේශිත ක්‍රියාකාරකම් ප්‍රකාශය (SoRP) යටතේ වූ මාර්ගෝපදේශයන් භාවිත කරමිනි.

### 3.1.3. පාලනය අහිමිවීම

පාලනය අහිමි වීමෙන් අනතුරුව, සමූහය මගින් පරිපාලිතයෙහි වත්කම් හා වගකීම් කවර හෝ පාලනය රහිත අයිතයක් සහ පරිපාලිතයෙහි හිමිකම් ආශ්‍රිත සෙසු සංරචකයන් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. පාලනය අහිමි වීමෙන් උද්ගත වන කවර හෝ අතිරික්තයක් හෝ හිඟයක් ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ. සමූහය මගින් පෙර පරිපාලිතයහි කවර හෝ අයිතියක් රඳවාගනු ලබන්නේ නම්, එබඳු අයිතියක් පාලනය අහිමි වන දිනයේදී සාධාරණ අගය අනුව මනිනු ලැබේ.

### 3.1.4. ඒකාබද්ධකරණයේදී ඉවත් කරන ලද ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අභ්‍යන්තර - සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අභ්‍යන්තර - සමූහ ගනුදෙනුවලින් උද්ගත වන කවර හෝ උපලබ්ධි නොවූ ආදායම් හෝ වියදම් ඉවත් කෙරේ. හිමිකම් ගිණුම්ගත ආයෝජිතයන් සමඟ වන ගනුදෙනුවලින් උද්ගත වන උපලබ්ධ නොවූ ලාභයන්, ආයෝජිතයා කෙරෙහි සමූහයේ අයිතිය පවතින තාක් දුරට ආයෝජනයට එරෙහිව ඉවත් කෙරේ. උපලබ්ධ නොවූ අලාභයන්ද උපලබ්ධි නොවූ ලාභයන් ආකාරයටම ඉවත් කෙරෙන නමුත්, එය සිදු කෙරනුයේ කිසිදු හානිකරණ සාක්ෂියක් නොමැති තාක් දුරට පමණි.

### 3.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

සියලුම විදේශ මුදල් ගනුදෙනු අදාළ ගනුදෙනු සිදුකෙරුණු දිනයේ පැවති තත්‍ය විනිමය අනුපාත අනුව ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. මේ සම්බන්ධයෙන්, සමූහයෙහි ක්‍රියාමාර්ගය වනුයේ ගනුදෙනු සිදු කළ දිනයේ මධ්‍ය විනිමය අනුපාතය යොදා ගැනීමයි.

වාර්තාකරණ දිනයේදී විදේශ මුදල් ඒකකවලින් දැක්වෙන මුදල් වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනයේ පවතින තත්‍ය විනිමය අනුපාතය අනුව ක්‍රියාකාරී මුදල් ඒකකය වෙත ප්‍රතිපරිවර්තනය කෙරේ. මුදල් අයිතම මත විදේශ මුදල් ඒකක ලාභය හෝ අලාභය වනුයේ, සඵල පොලී අනුපාතයට ගළපන ලද වසර ආරම්භයේදී ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි ක්‍රමක්ෂය පිරිවැය හා වසර තුළ සිදු කරන ලද ගෙවීමේ සහ වාර්තාකරණ දිනයේදී විනිමය අනුපාතය අනුව පරිවර්තනය කරන ලද විදේශ මුදල් ඒකකයන්හි ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස වේ.

විදේශ මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැයට අදාළව මනින ලද මුදල් නොවන අයිතම හඳුනාග ැනීමේ දිනයේදී තත්‍ය විනිමය අනුපාතය යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ මුදල් ඒකකයකින් සාධාරණ අගයට මනින ලද මුදල් නොවන අයිතම සාධාරණ අගය නිර්ණය කරන ලද දිනයේ පැවති තත්‍ය විනිමය අනුපාත අනුව පරිවර්තනය කෙරේ.

### 3'3 SLFRS 15 - **ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලද ආදායම**

''ආදායම'' පිළිබඳ LKAS 18 ප්‍රමිතිය, ''ඉදිකිරීම් ගිවිසුම්'' පිළිබඳ LKAS 11 ප්‍රමිතිය සහ ''ගනුදෙනුකාර හිතෛෂීත්ව වැඩසටහන්' පිළිබඳ IFRIC 13 ප්‍රමිතිය ඇතුළුව ආදායම් හඳුනාග ැනීමේ මාර්ගෝපදේශයන් SLFRS 15 මගින් ප්‍රතිස්ථාපනය කෙරෙන අතර, එය 2018 අප්‍රේල් 01 දින හෝ එයට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ.

SLFRS 15 මගින් ආදායම කොපමණ ප්‍රමාණයක්, කුමන අවස්ථාවේදී හඳුනාගන්නේද යන්න තීරණය කිරීම සඳහා විස්තරාත්මක රාමුවක් සපයයි. SLFRS 15 අනුව නව තුලනාත්මක හා ප්‍රමාණාත්මක අනාවරණවලින් ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන්හි ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාව අවබෝධ කර ගැනීමට මූල්‍ය ප්‍රකාශ භාවිත කරන පරිශීලකයන්ට හැකියාව ඇති කිරීමට උත්සහ කරයි.

මෙහිදී සමාගම් මගින් ආදායම කුමන කාලයකදී කවර වටිනාකමකින් තීරණය කරන්නේද යන්න හඳුනාගැනීම සඳහා පියවර පහක ආකෘතියක් යොදා ගැනීම අවශ්‍ය වේ. මෙම ආකෘතිය මගින් සමාගමක් විසින් එය අපේක්ෂා කරන ආදායම ලබාගැනීම සඳහා කිසියම් ගනුදෙනුකරුවකු වෙත භාණ්ඩ හෝ සේවාවන්හි පාලනය මාරු කරනු ලබන අවස්ථාවේදී ආදායම හඳුනාගත යුතු බවට විශේෂ කොට දැක්වේ.

### 3.4 බලාත්මක වීමට නියමිත සහ සංශෝධිත ප්‍රමිතිය සහ අර්ථකථනය

මෙම මූල්‍ය ප්‍රකාශයන්හිදී, සමූහය විසින් මූල්‍ය වාර්තාකරණය සඳහා, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 1" SLFRS 9" LKAS 16 සහ LKAS 37 වෙත සංශෝධන සිදු කොට ඇති අතර ඒවා 2022 ජනවාරි 1 වැනි දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා ප්‍රථම වරට බලාත්මක විය. සමූහය මගින්, නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන කිසිදු වෙනත් ප්‍රමිතියක්, අර්ථදැක්වීමක් හෝ සංශෝධනයක් කල්තබා ආදේශ කර නොගැනුණි.

#### SLFRS 1 **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ප්‍රථම වරට යොදා ගැනීම - පළමු වරට ප්‍රමිතීන් යොදා ගන්නෙකු වශයෙන් පරිපාලිතය**

SLFRS ප්‍රමිති ක්‍රියාවලිය සඳහා 2018-2020 වාර්ෂික වැඩිදියුණු කිරීමේ අංගයක් ලෙස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් SLFRS 1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ප්‍රථම වරට යොදා ගැනීම (SLFRS 1) සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. තවද මව් සමාග මෙහි සංක්‍රාන්ති දිනය මත පදනම්ව, මව් සමාගම විසින් වාර්තා කරන ලද ප්‍රමාණයන් භාවිත කරමින් සමුච්චිත පරිවර්තන වෙනස්කම් මැනීම සඳහා, SLFRS 1 හි D16(අ) ඡේදය යොදා ගැනීමට තෝරා ගන්නා පරිපාලිත ආයතනයකට මෙම සංශෝධනය මගින් අනුමැතිය හිමි වේ. මෙම සංශෝධනය, SLFRS 1 හි D16(අ) ඡේදය යොදා ගැනීමට තෝරා ගන්නා ආශ්‍රිත සමාගමට හෝ හවුල් ව්‍යාපාරයටද අදාළ වේ.

#### SLFRS 9 **මූල්‍ය සාධන පත්‍ර - මූල්‍ය වගකීම් හඳුනාගැනීම සඳහා 'සියයට 10' පරීක්ෂණයේ ගාස්තු**

SLFRS ප්‍රමිති ක්‍රියාවලියෙහි 2018-2020 වාර්ෂික වැඩිදියුණු කිරීමේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් SLFRS 9 මූල්‍ය සාධන පත්‍ර (SLFRS 9) සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. නව හෝ නවීකරණය කරන ලද මූල්‍ය වගකීම්වල නියමයන් මුල් මූල්‍ය වගකීම්වල නියමයන්ට වඩා සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කරන්නේද යන්න තක්සේරු කිරීමේදී ආයතනයක් සඳහා ඇතුළත් කරන ගාස්තු සංශෝධනය මගින් පැහැදිලි කරයි. මෙම ගාස්තුවලට ඇතුළත් වන්නේ ණය ගැණුම්කරු සහ ණය දෙන්නා අතර ගෙවූ හෝ ලැබුණු ගාස්තු පමණි. මේ සඳහා අනෙක් තැනැත්තා වෙනුවෙන් ණය ගැණුම්කරු හෝ ණය දෙන්නා විසින් ගෙවන ලද හෝ ලබා ගන්නා ලද ගාස්තු ඇතුළත් වේ. ආයතනයක් විසින් සංශෝධන ප්‍රථම වරට යොදා ගන්නා ලද වාර්ෂික වාර්තාකරණ කාල සීමාව ආරම්භයේදී හෝ ඉන් පසුව වෙනස් කරන ලද හෝ හුවමාරු කරන ලද මූල්‍ය වගකීම් සඳහා වන සංශෝධනය, ආයතනය සඳහා අදාළ වේ.

#### SLFRS 3 **සඳහා වන සංශෝධන**

සංශෝධන මගින් SLFRS 3 යාවත්කාලීන කරන අතර එමගින් එය 1989 රාමුව වෙනුවට 2018 සංකල්පීය රාමුව වෙත යොමු වේ. LKAS 37 හි විෂය පථය තුළ ඇති බැඳීම් සඳහා, අත්පත් කරගත් දිනයේදී අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා අත්පත් කර ගන්නෙකු LKAS 37 අදාළ කර ගැනීමේ අවශ්‍යතාවයක්ද එකී සංශෝධන මගින් SLFRS 3 හි දක්වයි. IFRIC 21 බදු විෂය පථය තුළ පවතින බද්දක් සඳහා, බද්ද ගෙවීමට වගකීමක් ඇති කරන අනිවාර්ය සිදුවීම අත්පත් කර ගැනීමේ දිනය වන විට සිදු වී තිබේද යන්න තීරණය කිරීම සඳහා අත්පත් කරන්නා විසින් IFRIC 21 යොදා ගනු ලැබේ. අවසාන වශයෙන්, ව්‍යාපාර සංයෝජනයකින් අත්පත් කරගත් අවිනිශ්චිත වත්කම් අත්පත් කර ගන්නෙකු විසින් හඳුනානොග න්නා බවට පැහැදිලි ප්‍රකාශයක් සංශෝධනයන්හි ඇතුළත් වේ.

#### **දේපළ, පිරියත සහ උපකරණ: අපේක්ෂිත භාවිතයට පෙර ලැබෙන ආදායම** - LKAS 16 **සඳහා වන සංශෝධන**

2021 මාර්තු මාසයේදී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ - අපේක්ෂිත භාවිතයට පෙර ආදායමට සංශෝධන සම්මත කර ගන්නා ලදී. එමගින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලැබෙන කිසියම් ආදායමක්, යම් වත්කමක් අදාළ ස්ථානයට ගෙන ඒමේ සහ එකී වත්කම කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක කිරීමට හැකි තත්ත්වයට ගෙන ඒමේ ක්‍රියාවලිය අතරතුරදී දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැයෙන් අඩු කිරීමට ආයතනයකට ඉඩ නොදෙයි. ඒ වෙනුවට, ආයතනයක් එවැනි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම සහ එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පිරිවැය, ලාභ හෝ අලාභයන්හි හඳුනාගනී.

**භාරදූර ගිවිසුම් - ගිවිසුමක් ඉටු කිරීම සඳහා වන පිරිවැය - LKAS 37 සඳහා වන සංශෝධන**

2021 මාර්තු මාසයේදී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් LKAS 37 සඳහා වන සංශෝධන සම්මත කර ගනු ලැබුවේ ගිවිසුමක් භාරදූර ගිවිසුමක්ද පාඩු ලබන්නක්ද යන්න තක්සේරු කිරීමේදී ආයතනයක් ඇතුළත් කළ යුතු පිරිවැය පැහැදිලිව දැක්වීමටය.

"සෘජුවම සම්බන්ධ පිරිවැය ප්‍රවේශයක්" මෙම සංශෝධන සඳහා අදාළ වේ. භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන කොන්ත්‍රාත්තුවට සෘජුවම සම්බන්ධ වන පිරිවැය සඳහා වර්ධක පිරිවැය සහ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්වලට සෘජුවම අදාළ පිරිවැය වෙන් කිරීම යන දෙඅංශයම ඇතුළත් වේ. සාමාන්‍ය සහ පරිපාලන වියදම් කොන්ත්‍රාත්තුවක් සමඟ සෘජුව සම්බන්ධ නොවන අතර කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රතිපාර්ශ්වයට පැහැදිලිව අය කළ නොහැකි නම් හැර ඒවා බැහැර කරනු ලැබේ.

## 3.5 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනාගැනීම සහ පශ්චාත් මිනුම්කරණය

### 3.5.1. හඳුනාගැනීමේ දිනය

'නිත්‍ය මාර්ග වෙළඳාම' හැර සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් මූලිකව වෙළඳාම් දිනයේදී හඳුනාගැනේ. එනම්, සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදන සඳහා සමූහය පාර්ශ්වකරුවෙකු බවට පත්වන දිනය වේ. ''නිත්‍ය මාර්ග වෙළෙඳාම'' යනු රොගුලාසි හෝ වෙළෙඳපොළ සම්මුති මගින් පොදුවේ ස්ථාපිත කාලසීමාවක් තුළ වත්කම් බෙදාහැරීම අවශ්‍ය වන ආකාරයේ මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම වේ. එම වෙළෙඳාම් පියවීමේ දිනයේදී මූලිකව හඳුනාගැනේ.

### 3.5.2. මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පශ්චාත් මිනුම්කරණය

SLFRS 9 අනුව, සමූහය මඟින් ස්වකීය සියලුම මූල්‍ය වත්කම් අදාළ වත්කම් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආකෘතිය අනුව වර්ගීකරණය කෙරෙන අතර වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි පහත දැක්වෙන අයුරින් මනිනු ලැබේ:

- ක්‍රමක්ෂය පිරිවැය අනුව
- සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් (FVOCI)
- සාධාරණ අගයේ වෙනස්වීම් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළින් (FVOCI)

මූල්‍ය වත්කම්වල පශ්චාත් මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**ව්‍යාපාර ආකෘතිය ඇගයුම**

2018 අප්‍රියෙල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, සමූහය මඟින් වත්කමක් කළඹ මට්ටමේ රඳවා ගනිමින් සාධන පත්‍රයෙන් සාධන පත්‍රයට යන පදනමින් ඇගයුමට ලක් නොකරන ආකාරයේ ව්‍යාපාර ආකෘතියක අරමුණ සම්බන්ධ ඇගයුමක් සිදු කරනු ලබන්නේ මෙය ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකාරිත්වයට තොරතුරු සැපයෙන ආකාරය වඩාත් හොඳින් පිළිබිඹු කරන බැවිනි. සලකා බලන ලද තොරතුරු පහත දැක්වෙන පරිදි වේ:

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති හා අරමුණු සහ අදාළ ප්‍රතිපත්ති ප්‍රායෝගිකව මෙහෙයවීම. නිශ්චිතවම, කළමනාකාරිත්වයේ ක්‍රමෝපාය මඟින් ගිවිසුම්ගත පොලී ආදායම උපයා ගැනීම, නිශ්චිත පොලී අනුපාත ස්වභාවයක් පවත්වා ගෙන යාම, මූල්‍ය වත්කම්වල කාලසීමාව අදාළ වත්කම් සඳහා මූල්‍යකරණය සිදු කරනු ලබන වගකීම්වල කාලසීමාව සමඟ ගැළපීම හෝ අදාළ වත්කම් විකිණීම ඔස්සේ මූල්‍ය ප්‍රවාහ උපලබ්ධි කිරීම කෙරෙහි අවධානය යොමු වන්නේද යන වග:
- කළඹෙහි කාර්යසාධනය ඇගයුමට ලක් කෙරෙන සහ සමූහ කළමනාකාරිත්වය වෙත වාර්තා කෙරෙන ආකාරය:
- ව්‍යාපාර ආකෘතියෙහි කාර්යසාධනය කෙරෙහි බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවා ගැනෙන මූල්‍ය වත්කම්) සහ අදාළ අවදානම් කළමනාකරණය කරනු ලබන ආකාරය:
- ව්‍යාපාරයෙහි කළමනාකරුවන් වෙත ප්‍රතිලාභ පිරිනැමෙන ආකාරය - උදා: ප්‍රතිලාභය කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ අගය මත පදනම් වන්නේද නැතිනම් එක්රැස් කරනු ලබන ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ මත පදනම් වන්නේද යන්න: සහ
- පෙර වාර්තාවන්හි විකුණුම් සම්බන්ධ වාර ගණන, පරිමාව සහ කාලගණනය, එබඳු විකුණුම් සඳහා හේතු සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාව. කෙසේවුවද, විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු, හුදෙකලාව සැලකිල්ලට ගනු නොලබන අතර, මූල්‍ය වත්කම් කළමනාකරණයට සම්බන්ධ සමූහයේ ප්‍රකාශිත අරමුණ සපුරාලන ලද ආකාරය සහ මූල්‍ය ප්‍රවාහ උපලබ්ධි වූ ආකාරය සම්බන්ධ සමස්ත ඇගයුමක කොටසක් වශයෙන් සැලකිල්ලට ගැනේ.

ව්‍යාපාර ආකෘති ඇගයුම සාධාරණ ලෙස අපේක්ෂිත තත්ත්වයන් මත පදනම් වන අතර එහිදී ''නරකම තත්ත්වය' හෝ 'ආතති තත්ත්වය' සැලකිල්ලට නොගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසු මූල්‍ය ප්‍රවාහ සමූහයේ මුල් අපේක්ෂාවන්ට වෙනස් ආකාරයකින් උපලබ්ධි වුවහොත්, සමූහය මඟින් එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවාගෙන ඇති ඉතිරි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය වෙනස් නොකරන නමුත්, ඉදිරියට යාමේදී අලුතින් අරඹන ලද හෝ අලුතින් මිලදී ගන්නා ලද මූල්‍ය වත්කම් ඇගයීමේදී අදාළ තොරතුරු ඇතුළත් කෙරේ.

**ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ හුදෙක් මුල් මුදල සහ පොලිය ගෙවීම්ද යන්න තක්සේරු කිරීම.** (SPPI test)

සිය වර්ගීකරණ ක්‍රියාවලියෙහි දෙවැනි පියවරක් වශයෙන් මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි මඟින් SPPI පරීක්ෂණය සපුරාලන්නේ දැයි හඳුනාගැනීම සඳහා සමූහය විසින් ඒවා ඇගයුමට ලක් කෙරේ.

මෙම ඇගයුම සඳහා, ''මුල් මුදල'' යන්න මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය වශයෙන් සහ එය මූල්‍ය වත්කමෙහි ජීව කාලය පුරා වෙනස් විය හැකි බවට නිර්වචනය කෙරේ. (උදාහරණයක් ලෙස, වාරික/වට්ටම් සඳහා මූලික ගෙවීමක් හෝ ක්‍රමක්ෂයක් තිබේ නම්).

''පොලිය'' යන්න නිර්වචනය කෙරෙනුයේ මුදලෙහි කාල වටිනාකම සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා හිඟ මුල් මුදල ආශ්‍රිත ණය අවදානම සඳහා සහ සෙසු මූලික ණය දීමේ අවදානම් සහ පිරිවැය මෙන්ම ආන්තික සඳහාද වන ප්‍රතිශ්ඨාව වශයෙනි.

මෙයට ප්‍රතිවිරුද්ධ වශයෙන්, අවදානම කෙරෙහි නිරාවරණය අවම කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන ගිවිසුම්ගත කොන්දේසි හෝ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් උද්ගත නොකරන මූලික ණය ලබාදීමේ කටයුත්ත ආශ්‍රිත නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි උච්චාවචනයන් හුදෙක් හිඟ මුල් මුදලෙහි මුල් මුදල සහ පොලී ගෙවීම් වේ. එවැනි අවස්ථාවන්හිදී, අදාළ මූල්‍ය වත්කම ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට මැනිය යුතු වේ.

ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් හුදෙක් හිඟ මුල් මුදලෙහි ගෙවීම සහ පොලී ගෙවීම්ද යන්න ඇගයුමට ලක් කිරීමේදී, සමූහය විසින් සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත කොන්දේසි සැලකිල්ලට ගනු ලැබේ. මෙයට අදාළ මූල්‍ය වත්කම මෙම කොන්දේසිය සපුරාලීමට අපොහොසත් වන ආකාරයෙන් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන්හි කාලගණනය හෝ වටිනාකම වෙනස් කළ හැකි ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසියකින් යුක්ත වේද යන්න ඇගයුමට ලක් කිරීම ඇතුළත් වේ. ඇගයුම සිදුකිරීමේදී සමූහය මඟින් පහත දක්වෙන කරුණු සැලකිල්ලට ගැනේ:

- මූල්‍ය ප්‍රවාහයන්හි කාලගණනය හෝ වටිනාකම වෙනස් කළ හැකි අසම්භාව්‍ය සිදුවීම්:
- වගකීම් ඉටු කිරීම (Leverage) පිළිබඳ විශේෂාං:
- පෙරදායකවීම් සහ විස්තාරණ කොන්දේසි:
- විශේෂිත වත්කම්වලින් මූල්‍ය ප්‍රවාහ සඳහා සමූහයෙහි හිමිකම්පෑම සීමා කෙරෙන කොන්දේසි: සහ
- මුදලෙහි කාල වටිනාකමෙහි ප්‍රතිශ්ඨාව වෙනස් කරන ආකාරයේ විශේෂාංග

ආවර්තිත ප්‍රතිසැකසුම් දිනයන්හිදී පොලී අනුපාතය සංශෝධනය කිරීම සඳහා යෝජනා කළ හැකි ආකාරයේ වරණයක් සහිත දිගු කාලීන ස්ථාවර අනුපාත ණය කළඹක් සමූහය සතු වේ. මෙම ප්‍රතිසැකසුම් අයිතීන් අදාළ සංශෝධනය සිදු කරනු ලබන අවස්ථාවේ පවතින වෙළඳපොළ අනුපාතයන්ට සීමා වේ. ණය ගැණුම්කරුවන්ට සංශෝධිත අනුපාතය පිළිගැනීමට හෝ දඩ මුදලකින් තොරව ණය මුදල නිදහස් කර ගැනීමට විකල්පයක් ඇත. සමූහය මඟින් මෙම ණය මුදල්වල ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් හුදෙක් මුල් මුදල සහ පොලිය ගෙවීම් වශයෙන් නිශ්වය කරනු ලැබ ඇති අතර එයට හේතුව මෙම වරණය මඟින් හිඟ මුල් මුදල් වටිනාකම ආශ්‍රිත මුදලෙහි කාල වටිනාකම, ණය අවදානම, සෙසු මූලික ණය ලබාදීමේ අවදානම් සහ පිරිවැය සඳහා ප්‍රතිශ්ඨාවට බලපාන අයුරින් පොලී අනුපාතය විචලනය වීමයි.

විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

**ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එය පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි සාධාරණ අගයට නම් කර නොමැති විටය:

- වත්කම ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ එක්රැස් කරගැනීමේ අරමුණින් වත්කම් රඳවාගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ රඳවාගෙන පැවතීම: සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන්හිදී මූල්‍ය ප්‍රවාහයන් ඇති කරයි. ඒවා හුදෙක් මූලික ගෙවීම සහ හිඟ ප්‍රධාන මුදල සඳහා පොලිය පමණි.

ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය වත්කම් පිටු අංක 262,263,265,281,283,296 සහ 304 හි සටහන් 22,23,25,26,28 සහ 35 සිට 40 දක්වා ඉදිරිපත් කෙරේ.

**සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඔස්සේ මනින ලද මූල්‍ය වත්කම්**

වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද ණය සහ හිමිකම් සාධන පත්‍රවලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් පිටු අංක 268 හි සටහන 27 හි දැක්වේ.

**සාධාරණ අගයේ වෙනස්වීම් ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ මනින ලද මූල්‍ය වත්කම්**

SLFRS 9 අනුව, ක්‍රමක්ෂය පිරිවැය යටතේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට මනින ලද වශයෙන් වර්ගීකරණය නොකරන ලද සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්, වෙළඳාම සඳහා රඳවාගත් හෝ කළමනාකරණය කෙරෙන මූල්‍ය වත්කම් සහ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ එක්රැස් කරගැනීමට රඳවාගෙන හෝ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ එක්රැස් කරගැනීමට සහ මූල්‍ය වත්කම් විකිණුමට යන දෙකම සඳහා නොවන බැවින් සාධාරණ අගය මත එහි කාර්යසාධනය මනිනු ලබන මූල්‍ය වත්කම්වලින්, සහ පිටු අංක 283 හි සටහන 24 හි සාකච්ඡා කෙරෙන ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ මූලිකව සාධාරණ අගයට මූලිකව හඳුනාගැනීමෙන් පසු නම් කරන ලද මූල්‍ය වත්කම් සමන්විත වේ.

**ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද මූල්‍ය වත්කම්**

SLFRS 9 අනුව, මූලික හඳුනාගැනීමේදී, සමූහය මගින් මූල්‍ය වත්කමක් නැවත අවලංගු කළ නොහැකි පරිදි නම් කරනු ලබන්නේ, නැතිනම් එය ක්‍රමක්ෂය පිරිවැය අනුව හෝ ඍඕඡබ හිදී ඍඨක්‍ෂ අනුව මැනීම සඳහා අවශ්‍යතා සපුරාලමින් එකී නම් කිරීම ඉවත්වීම හෝ නැතිනම් වත්කම් හෝ වගකීම් හෝ ලාභ හෝ අලාභ හෝ වෙනස් පදනමකින් මැනීමෙන් ඇති විය හැකි ගිණුම්කරණ නොගැළපීම සැලකිය යුතු අන්දමින් පහත හෙළීම උදෙසාය.

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසන් වන විට සමූහය මගින් කිසිදු මූල්‍ය වත්කමක් මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරනු ලැබ නැත.

### 3.5.3. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීම

**මූල්‍ය වත්කම්**

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන අවස්ථාවන්හිදී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පහත අවස්ථාවලදී හඳුනා නොගැනේ.

- අදාළ මූල්‍ය වත්කමෙන් මූල්‍ය ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් අහෝසි වූ විට
- සමූහය සහ සමාගම මගින් මූල්‍ය වත්කමෙන් මූල්‍ය ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් පවරන ලද විට හෝ 'හුවමාරු වැඩපිළිවෙළක්' යටතේ තෙවන පාර්ශ්වයක් වෙත මූර්ත ප්‍රමාදයකින් තොරව ලද මූල්‍ය ප්‍රවාහ ගෙවීම සඳහා බැඳීමක් උපකල්පනය කරන ලද අවස්ථාවකදී; සහ
- සමූහය සහ සමාගම මගින් වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පවරන ලද අවස්ථාවකදී; හෝ
- සමූහය සහ සමාගම මගින් වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පැවරීම හෝ රඳවාගැනීම සිදුකොට නැතත්, වත්කමෙහි පාලනය පවරා ඇති විටකදී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය සහ ලද ප්‍රතිශ්ධාව අතර වෙනස සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගන්නා ලද කවර හෝ සමුච්චිත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

සමූහය සහ සමාගම විසින් මූල්‍ය වත්කමෙන් මූල්‍ය ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් පවරන ලද විට හෝ හුවමාරු වැඩපිළිවෙළක් වෙත මාරු වූ විට, සහ වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පැවරීම හෝ රඳවාගැනීම සිදුනොකොට, වත්කමෙහි පාලනයද පවරා නොමැති අවස්ථාවකදී වත්කම ආශ්‍රිතව සමූහයේ අඛණ්ඩ සහභාගීත්වයේ ප්‍රමාණය දක්වා වත්කම හඳුනාගැනේ. එහිදී, සමූහය මගින්ද ආශ්‍රිත වගකීමක් හඳුනාගැනේ. සමූහය මගින් රඳවාගන්නා ලද හිමිකම් සහ බැඳීම් පිළිබිඹු වන පදනමකින් පවරන ලද වත්කම් සහ ආශ්‍රිත වගකීම් මනිනු ලැබේ.

පවරන ලද වත්කම මත ඇපකරයක ස්වභාවය ගන්නා අඛණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ වත්කමෙහි මුල් ධාරණ අගය සහ සමූහය වෙත ආපසු ගෙවීමට සිදුවිය හැකි ප්‍රතිශ්ධාවේ උපරිම වටිනාකම යන දෙකෙන් අඩු අගය අනුවය.

**මූල්‍ය වගකීම්**

වගකීම යටතේ ඇති බැඳීම නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කරනු ලැබේ. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණයහිමියා වෙතින් වෙනත් පාර්ශ්වයක් විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කර ඇති විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සලකනු ලබන අතර නව වගකීමක් හඳුනා ගැනේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය හා ගෙවන ලද ප්‍රතිශ්ධාව අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගැනේ.

### 3.5.4. මූල්‍ය සාධන පත්‍ර හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කොට, ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කරනු ලබන්නේ, හඳුනාගත් මුදල් පියවීමට දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් තිබේ නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමට අදහස් කරන්නේ නම් හෝ වත්කම උපලබ්ධි කර ගැනීම සහ වගකීම එකවර පියවන්නේ නම් පමණි. ප්‍රධාන ශුද්ධ ගිවිසුම් සම්බන්ධයෙන් මෙය සාමාන්‍යයෙන් සිදු නොවේ. එබැවින් අදාළ වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දළ වශයෙන් ඉදිරිපත් කර ඇත.

ආදායම් සහ වියදම් ශුද්ධ පදනම මත ඉදිරිපත් කරනු ලබන්නේ LKAS / SLFRS යටතේ අවසර දී ඇති විට හෝ සමූහයේ වෙළඳ ක්‍රියාකාරකම් වැනි සමාන ගනුදෙනු සමූහයකින් ඇතිවන ලාභ සහ අලාභ සඳහා පමණි.

### 3.5.5. සාධාරණ අගය නිර්ණය කිරීම

වාර්තාකරණ දිනයේදී ක්‍රියාකාරී වෙළඳපොළවල වෙළඳාමේ යෙදවෙන මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩුකිරීමකින් තොරව, ඒවායේ සඳහන් වෙළඳපොළ මිල හෝ අලෙවි නියෝජිත මිලකැඳවුම් (දිගු තත්ත්වයන් සඳහා ලංසු මිල සහ කෙටි තත්ත්වයන් සඳහා ඉල්ලුම් මිල) මත පදනම් වේ.

මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගයන් පිළිබඳ විශ්ලේෂණයක් සහ මිනුම්කරණය පිළිබඳ වැඩිදුර විස්තර පිටු අංක 255 හි සටහන 21 හි දැක්වේ.

### 3.6 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

වත්කමක් හානිකරණයට ලක් විය හැකි බවට ඇඟවීමක් තිබේද යන්න දැන ගැනීම සඳහා විලම්භිත බදු වත්කම් හැර සමූහයේ මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයන් සෑම වාර්තා කිරීමේ දිනයකදීම සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වූ විට, සමූහය වත්කම් ආපසු අයකර හැකි මුදල ඇස්තමේන්තු කරයි. වත්කමක අයකරගත හැකි මුදල වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ වටිනාකමට වඩා වැඩි අගයක් වන අතර එය විකුණුම් පිරිවැයට සහ එහි ප්‍රයෝජ්‍ය වටිනාකමට වඩා අඩු වේ. වත්කමක හෝ මුදල් - උත්පාදන ඒකකයේ ධාරණ අගය එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන විට, වත්කම හානිකරණයට ලක් වූවක් ලෙස සලකනු ලබන අතර එය ආපසු ලබාගත හැකි මුදලට ලියා ඇත.

ප්‍රයෝජ්‍ය වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ බදු වලට පෙර වට්ටම් අනුපාතයක් භාවිත කරමින් මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරු කිරීම් පිළිබිඹු කරයි. විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ අගය තීරණය කිරීමේදී, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිත කරයි. මෙම ගණනයන් ආගණන ගුණිත, ප්‍රසිද්ධියේ වෙළඳාම් සිදු කරනු ලබන පරිපාලිතවල ප්‍රකාශිත කොටස් ලැයිස්තු මිල ගණන් හා සෙසු පවතින වටිනාකම් දර්ශක මගින් සනාථ කෙරේ.

කීර්ති නාමය හැර සෙසු වත්කම් සම්බන්ධයෙන්, එක් එක් වර්තාකරණ දිනයේදී, පෙර හඳුනාගත් හානිකරණ අලාභ සම්බන්ධ කවර හෝ දර්ශකයක් තවදුරටත් නොපවතීද නැතිනම් පහළ ගොස් ඇතිද යන්න ඇගයුමට ලක් කෙරේ. එබඳු දර්ශකයක් පැවතියහොත්, සමාගම මගින් අදාළ වත්කම හෝ මුදල් උත්පාදන ඒකකයෙහි පියවාගත හැකි වටිනාකම ඇස්තමේන්තුගත කෙරේ. පෙර හඳුනාගන්නා ලද හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ, අවසන් හානිකරණ අලාභය හඳුනාගන්නා ලද අවස්ථාවේ සිට අදාළ වත්කමෙහි පියවාගත හැකි වටිනාකම නිර්ණය කිරීම සඳහා යොදාගනු ලැබූ උපකල්පනයන්හි වෙනසක් පැවතියහොත් පමණි. මෙම ප්‍රතිවර්තනය, වත්කමෙහි ධාරණ අගය එහි පියවාගත හැකි වටිනාකම ඉක්මවා නොයාම, නැතහොත් ක්ෂය අඩු කළ පසුව නිශ්චය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයාම, පෙර වසරවලදී කිසිදු හානිකරණ අලාභයක් හඳුනානොගැනීම යන කරුණුවලට සීමා වේ. එබඳු ප්‍රතිවර්තනයන් ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

### 3.7 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, සහ අදාළ බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ආශ්‍රිත සම්පත්වල පිටතට ගලායාමක් පැවතීමේ හැකියාවක් ඇති විට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 37 - ''වෙන්කිරීම, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්'' අනුව එම බැඳීමේ අගය පිළිබඳව

විශ්වසනීය අයුරින් ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටකදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. අදාළ දිනයේදී බැඳීම් ආශ්‍රිත අවදානම් සහ අවිනිශ්චිතතා සැලකීමේදී, හඳුනාගනු ලබන වටිනාකම වාර්තාකරණ දිනයේදී වර්තමාන බැඳීම බේරුම් කිරීම සඳහා වන ප්‍රශස්තතම ප්‍රතිශ්ඨාව සම්බන්ධ ඇස්තමේන්තුව වේ. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදමක් කවර හෝ ප්‍රතිපූරණයකින් ශුද්ධව ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

### 3.8 ණය ලබාගැනීමේ පිරිවැය

''ණය ලබාගැනීමේ පිරිවැය'' සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 23 අනුව, සමූහය මඟින් වත්කමක් සුදුසුකම් ලැබීම සඳහා වන අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා ඍජුව ආරෝපණය කළ හැකි ණය ලබාගැනීම් පිරිවැය අදාළ වත්කමෙහි කොටසක් වශයෙන් ප්‍රාග්ධනීකරණය කෙරේ. සුදුසුකම් ලබන වත්කමක් යනු එහි අභිප්‍රේත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කමකි. අනෙකුත් ණය ලබාගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

GRI 207-1,207-2,207-3,207-4,3-3

### 3.9 ආදායම් බදු

'ආදායම් බදු වියදම' පිළිබඳ විස්තර පිටු අංක 249 හි මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන 17 හි දැක්වේ.

GRI 207-1,207-2,207-3,207-4,3-3

### 3.10 විලම්භිත බදු

'විලම්භිත බදු' පිළිබඳ විස්තර පිටු අංක 309 හි මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන 44 හි දැක්වේ.

### 3.11 වගා රක්ෂණ ගාස්තුව (CIL)

2013 අංක 12 දරන මුදල් පනතෙහි වගන්ති 14 ප්‍රතිපාදන අනුව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ ගාස්තුව හඳුන්වාදෙන ලද අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. වර්තමානයේදී, වගා රක්ෂණ ගාස්තුව බදුවලට පසු ලාභයෙන් 1% කි.

### 3.12 මූල්‍ය සේවා මත බදු

මූල්‍ය සේවා පිළිබඳ එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පිළිබඳ විස්තර පිටු අංක 248 හි මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන 16 හි දැක්වේ.

## 4 නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලාත්මක නොවන ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති පහත දක්වෙන SLFRS ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කරන ලද නමුත් ඒවා 2023 මාර්තු 31 දිනට බලාත්මක නොවීය. ඒ අනුව මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී යොදා නොගැනුණි. පහත දැක්වෙන සංශෝධනය අනාවැකි පළ කළ හැකි අනාගත කාලයක් සඳහා සමාගමෙහි/සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි වාස්තවික බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

**IFRS 17- රක්ෂණ ගිවිසුම්**

SLFRS 17 යනු හඳුනාගැනීම සහ මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම ආවරණය වන රක්ෂණ ගිවිසුම් සඳහා වූ නව පුළුල් ගිණුම්කරණ ප්‍රමිතියකි. බලාත්මක වූ පසු, SLFRS 17 මඟින් IFRS 4 රක්ෂණ ගිවිසුම් (SLFRS 4) ප්‍රතිස්ථාපනය කරනු ඇත. SLFRS 17 සියලුම වර්ගයේ රක්ෂණ ගිවිසුම් (එනම්, ජීවිත, ජීවිත නොවන, ඍජු රක්ෂණ සහ ප්‍රති-රක්ෂණ), ඒවා නිකුත් කරන ආයතන වර්ගය කුමක් වුවත්, අභිමත සහභාගිත්ව විශේෂාංග සහිත ඇතැම් ඇපකර සහ මූල්‍ය උපකරණ සඳහා අදාළ වේ. විෂය පථ ව්‍යතිරේක කිහිපයක් අදාළ වේ. SLFRS 17 හි සමස්ත අරමුණ වන්නේ රක්ෂණකරුවන්ට වඩාත් ප්‍රයෝජනවත් සහ ස්ථාවර රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණ ආකෘතියක් සැපයීමයි. බොහෝ දුරට පෙර පැවති දේශීය ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් නොවන පරිදි සකස් කොට තිබෙන SLFRS 4 හි අවශ්‍යතාවයන් හා සැසඳීමේදී, SLFRS 17 මඟින් අදාළ සියලුම ගිණුම්කරණ අංශ ආවරණය වන පරිදි රක්ෂණ ගිවිසුම් සඳහා පුළුල් ආකෘතියක් සපයනු ලැබේ. SLFRS 17 හි හරය සාමාන්‍ය ආකෘතිය වන අතර පහත සඳහන් දෑ එයට අතිරේකව සපයනු ලැබේ:

- ඍජු සහභාගීත්ව ලක්ෂණ සහිත ගිවිසුම් සඳහා නිශ්චිත අනුවර්තනයක් (විචල්‍ය ගාස්තු ප්‍රවේශය).
- ප්‍රධාන වශයෙන් කෙටි කාලීන ගිවිසුම් සඳහා සරල ප්‍රවේශයක් (වාරික වෙන්කිරීමේ ප්‍රවේශය).

2023 ජනවාරි 01 හෝ එයට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා SLFRS 17 බලපැවැත්වේ. සමාගමක් මඟින් එය පළමු වරට SLFRS 17 ආදේශ කර ගනු ලබන දින හෝ එයට පෙර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9 ''මූල්‍ය සාධනපත්‍ර'' සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 15 ''ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් ලද ආදායම'' යන ද්විත්වය සඳහාම අයදුම් කරනු ලබන්නේ නම් කල්තබා අයදුම් කිරීම සඳහා අනුමැතිය හිමි වේ.

**ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා නිර්වචන LKAS 8 සඳහා වන සංශෝධන**

සංශෝධන මඟින් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ දෝෂ නිවැරදි කිරීම අතර වෙනස පැහැදිලි කරයි. එසේම, ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීම සඳහා ආයතන විසින් මිනුම් ශිල්පීය ක්‍රම සහ යෙදවුම් භාවිත කරන ආකාරය එකී සංශෝධන මඟින් පැහැදිලි කෙරේ. සංශෝධිත ප්‍රමිතිය මඟින් පැහැදිලි කෙරෙන්නේ යෙදවුමක වෙනසක් හෝ මිනුම් තාක්ෂණයක වෙනසක් පිළිබඳ ගිණුම්කරණ ඇස්තමේන්තුවකට ඇති වන බලපෑම්, පූර්ව කාල පරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලයක් නොවන්නේ නම් ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම් බවයි.

2023 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා සංශෝධන කලින් සම්මත කර ගැනීමට අවසර දී ඇත.

**තනි ගනුදෙනුවකින් පැන නගින වත්කම් සහ වගකීම් සම්බන්ධ විලම්භිත බද්ද - LKAS 12 සඳහා වන සංශෝධන**

වගකීමක් පියවීම සඳහා සිදු කරන ගෙවීම් බදු අරමුණු සඳහා අඩු කළ හැකි ආකාර සංශෝධන මඟින් පැහැදිලි කරයි. එම සංශෝධන මූල්‍ය ප්‍රකාශවල (සහ පොලී වියදම්) හඳුනාගෙන ඇති වගකීම්වලට හෝ අදාළ වත්කම් සංරචකයට (සහ පොලී වියදම) එවැනි අඩු කිරීම් බදු අරමුණු සඳහා ආරෝපණය කළ හැකිද යන්න (අදාළ බදු නීතිය සලකා බැලීමෙන්) විනිශ්චය කිරීමේ කාරණයකි. වත්කම් සහ වගකීම් මූලික වශයෙන් හඳුනාගැනීමේදී යම් තාවකාලික වෙනස්කම් තිබේද යන්න තීරණය කිරීමේදී මෙම විනිශ්චය වැදගත් වේ.

2023 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා මෙම සංශෝධන බලාත්මක වේ.

**ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම - LKAS 1 LKAS 1 සඳහා සංශෝධන සහ IFRS ප්‍රායෝගික ප්‍රකාශය 2 සඳහා සංශෝධන**

ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් සඳහා ප්‍රමාණාත්මක විනිශ්චයන් යොදා ගැනීමට ආයතනවලට අවශ්‍ය මාර්ගෝපදේශ සහ උදාහරණ සැපයීම, ප්‍රමාණාත්මක විනිශ්චයන් සිදු කිරීම හරහා සිදු වේ. මෙම සංශෝධන මඟින් වඩාත් ප්‍රයෝජනවත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් සැපයීමට ආයතනවලට උපකාර කිරීම අරමුණු කරයි:

- ආයතනයන්හි 'සුවිශේෂී' ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළි කිරීමේ අවශ්‍යතාව වෙනුවට ඒවාහි 'ප්‍රමාණාත්මක' ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළි කිරීමේ අවශ්‍යතාව ඇති කිරීම
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේදී ආයතන මඟින් ප්‍රමාණාත්මක සංකල්පය අදාළ කරගන්නා ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම

2023 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා සංශෝධන බලාත්මක වේ.

**LKAS 1 සඳහා වන සංශෝධනː ජංගම හෝ ජංගම නොවන ලෙස වගකීම් වර්ගීකරණය**

LKAS 1 සඳහා වන සංශෝධනː වගකීම්, ජංගම හෝ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම මඟින් දැක්වේ. පහත සඳහන් කරුණු සංශෝධන මඟින් පැහැදිලි කෙරේ -

- බේරුම්කරණය කල් දැමීමේ අයිතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
- වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ කල් දැමීමේ අයිතියක් තිබිය යුතු බව
- ආයතනයක් විසින් කල් දැමීම සඳහා වන අයිතිය යොදා ගනු ලැබීමේ සම්භාවිතාව මඟින් එම වර්ගීකරණයට බලපෑමක් සිදු නොවන බව.
- පරිවර්තනය කළ හැකි වගකීමක නිහිත ව්‍යුත්පන්නයක් හිමිකම් සාධන පත්‍රයක් නම් පමණක් වගකීමක නියමයන් එහි වර්ගීකරණයට බලනොපාන බව

2023 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා සංශෝධන බලපැවැත්වෙන අතර, ඒවා නැවත සලකා බැලිය යුතුය. සමාගම/සමූහය මේ වනවිට මෙම සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස එහි මූල්‍ය ප්‍රකාශවලට ඇති විය හැකි බලපෑම තක්සේරු කරමින් සිටී.

5. දළ ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

ආදායම හඳුනා ගැනෙනුයේ සමාගම/සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදුවිය හැකි ප්‍රමාණයට සහ එය විශ්වසනීය අයුරින් මැනිය හැකි තාක් දුරට වේ. එක් එක් වර්ගයේ ආදායම් සඳහා විශේෂිත හඳුනා ගැනීමේ ක්‍රියා පටිපාටිය, අදාළ ආදායම් සටහන් යටතේ දක්වා ඇත.

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 239 | 30,196,588 | 23,881,526 | 33,406,918 | 25,926,792 |
| ශුද්ධ ඉපැයුම් ආදායම | 7 | 240 | - | - | 4,673,853 | 4,939,071 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 8 | 241 | 1,265,287 | 1,876,524 | 691,195 | 1,321,513 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 9 | 242 | 9,143 | 26,783 | 4,168 | 86,525 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 10 | 242 | 547,290 | 956,547 | 386,511 | 357,085 |
| එකතුව | | | 32,018,308 | 26,741,380 | 39,162,645 | 32,630,986 |

6. ශුද්ධ පොලී ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**ආදායම් සහ වියදම් හි ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුනා ගැනීම**

ආදායම හඳුනා ගැනෙනුයේ සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදුවිය හැකි ප්‍රමාණයට සහ එය විශ්වසනීය අයුරින් මැනිය හැකි තාක් දුරට වේ.

**පොලී ආදායම සහ වියදම්**

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන සියලුම මූල්‍ය සාධන පත්‍ර සඳහා පොලී ආදායම හෝ වියදම එලදායී පොලී අනුපාතික (EIR) භාවිත කරමින් වාර්තා කෙරේ. එලදායී පොලී අනුපාතිකය යනු, ගැළපෙන පරිදි මූල්‍ය සාධන පත්‍රවල අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාල සීමාවක් තුළින් ඇස්තමේන්තුගත මූල්‍ය ගෙවීම් හෝ ලැබීම්වලින් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්වල ශුද්ධ ධාරණ අගයට අඩු කරනු ලබන අනුපාතිකයයි. මෙම ගණනය කිරීම් සඳහා මූල්‍ය සාධන පත්‍රවල සියලුම ගිවිසුම් කොන්දේසි සැලකිල්ලට ගන්නා අතර (උදා, පෙරගෙවුම් විකල්ප), සාධන පත්‍ර සඳහා සෘජුව ආරෝපණය කළ හැකි ගාස්තු හෝ වර්ධක පිරිවැය ඇතුළත් වේ. එය ඉදිරි ණය අලාභවල හැර එලදායී පොලී අනුපාතිකයේ අනිවාර්ය අංගයකි.

සමූහය මඟින් එහි ගෙවීම් හෝ ලැබීම් ඇස්තමේන්තු සංශෝධනය කරන්නේ නම් මූල්‍ය වත්කම් හි හෝ වගකීම් හි ධාරණ අගය ගළපනු ලැබේ. ගළපන ලද ධාරණ අගය මුල් එලදායී පොලී අනුපාතිකය පදනම් කරගනිමින් ගණනය කෙරෙන අතර, ධාරණ අගයෙහි වෙනස මූල්‍ය වත්කම් සඳහා 'පොලී ආදායම' ලෙස සහ මූල්‍ය වගකීම් සඳහා 'පොලී වියදම' වශයෙන් වාර්තා කෙරේ. කෙසේ වුවද, නැවත වර්ගීකණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා එම මුදල් ලැබීම්වල ප්‍රතිසාධනය වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස, සමාගම විසින් අනාගත මුදල් ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පසුව වැඩි කරන අතර, ඇස්තමේන්තු වෙනස් වූ දින සිට එම වැඩි වීමේ බලපෑම, එලදායී පොලී අනුපාතික වෙත ගැළපීමක් ලෙස හඳුනා ගැනේ.

SLFRS 9 යටතේ, පිළිවෙළින් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනින ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා පොලී ආදායම සහ පොලී වියදම එලදායී පොලී අනුපාතිකය භාවිත කරමින් වාර්තා කෙරේ.

ආදායම් හඳුනාගත හැකි වනුයේ ගනුදෙනුව ආශ්‍රිත හිමිවිය හැකි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ දී පමණි. කෙසේ වෙතත්, අයකර ගැනීම් පිළිබඳ අවිනිශ්චිතතාවක් ඇති වුවහොත් ආදායම් හඳුනා ගැනීම අවසන් වේ. SLFRS 9 - "මූල්‍ය සාධන පත්‍ර" යොදා ගැනීමත් සමඟ, ගනුදෙනුකාර පැහැර හැරීමේ අවස්ථාව (අයකර ගැනීම් පිළිබඳ අවිනිශ්චිතතාව) කල් ඉකුත් වූ දින අනුවක් වශයෙන් වෙනස් කර ඇත. ඒ අනුව SLFRS 9 ට අනුව පොලී ආදායම හඳුනාගත හැකි වනුයේ කල් ඉකුත් වූ දින (90) ක් දක්වා පමණි.

**හිග කුලී මත පොලිය**

හිග කුලී මත පොලිය මුදල් පදනමකින් ගිණුම් ගත කර ඇත.

## 6. ශුද්ධ පොලී ආදායම

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 239 | 30,196,588 | 23,881,526 | 33,406,918 | 25,926,792 |
| පොලී වියදම | 6.2 | 239 | 18,206,943 | 10,832,186 | 19,270,402 | 11,205,126 |
| ශුද්ධ පොලී ආදායම | | | 11,989,645 | 13,049,340 | 14,136,516 | 14,721,666 |

## 6.1 පොලී ආදායම

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| මුදල් සහ මුදල් සමාන දෑ | | | 877,597 | 159,743 | 884,520 | 176,533 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ඇති ශේෂය | | | 2,968,570 | 443,816 | 3,028,775 | 587,209 |
| ණය සහ ලැබිය යුතු දෑ | 6.1.1 | 239 | 23,517,789 | 22,633,122 | 25,479,889 | 24,170,060 |
| ණය සාධන පත්‍රය - ක්‍රමක්ෂය පිරිවැය | | | 2,832,632 | 644,845 | 4,013,734 | 992,990 |
| මුළු පොලී ආදායම | | | 30,196,588 | 23,881,526 | 33,406,918 | 25,926,792 |

### 6.1.1 පොලී ආදායම - ණය සහ ලැබිය යුතු

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| කල් බදු/ඉජාරා - ලැබිය යුතු | 11,349,795 | 12,449,735 | 11,353,503 | 12,453,101 |
| කුලී-මිලදී ගැනීම/මුරාබා - ලැබිය යුතු | 1,119 | 1,628 | 758,514 | 791,468 |
| කාලීන ණය සහ ලැබිය යුතු | 12,166,876 | 10,181,759 | 13,367,873 | 10,925,491 |
| | 23,517,789 | 22,633,122 | 25,479,889 | 24,170,060 |

## 6.2 පොලී වියදම්

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| බැංකු සඳහා ගෙවිය යුතු | 6.2.1 | 240 | 1,611,082 | 903,595 | 2,233,489 | 1,117,531 |
| පාරිභෝගිකයන් සඳහා ගෙවිය යුතු | 6.2.1 | 240 | 14,803,475 | 7,802,922 | 15,305,829 | 8,057,701 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 6.2.1 | 240 | 1,555,403 | 1,875,532 | 1,539,300 | 1,859,429 |
| බදු වගකීම් | 40 | 304 | 236,983 | 250,137 | 191,784 | 170,465 |
| මුළු පොලී වියදම් | | | 18,206,943 | 10,832,186 | 19,270,402 | 11,205,126 |

## 6. ශුද්ධ පොලී ආදායම (සබැඳේ...)

### 6.2.1 පොලී වියදම් - සැලසුම් වශයෙන්

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| **බැංකු වෙත ගෙවිය යුතු** | | | | | | |
| බැංකු අයිරා මත පොලී | | | 605 | 1,027 | 193,068 | 34,866 |
| කෙටි කාලීන ණය සඳහා පොලිය | | | 49,260 | - | 49,261 | 11 |
| කාලීන ණය සඳහා පොලී | | | 954,474 | 235,166 | 1,384,418 | 415,253 |
| සුරැකුම්කරණ පොලී | | | 606,743 | 667,402 | 606,742 | 667,401 |
| උප එකතුව | | | 1,611,082 | 903,595 | 2,233,489 | 1,117,531 |
| **ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු** | | | | | | |
| තැන්පතු සඳහා පොලී පිරිවැය | | | 14,803,475 | 7,802,922 | 15,305,829 | 8,057,701 |
| උප එකතුව | | | 14,803,475 | 7,802,922 | 15,305,829 | 8,057,701 |
| **නිකුත් කළ ණය සුරැකුම්පත්** | | | | | | |
| ණයකර සඳහා පොලී | 37.1 | 299 | 1,555,403 | 1,875,532 | 1,539,300 | 1,859,429 |
| උප එකතුව | | | 1,555,403 | 1,875,532 | 1,539,300 | 1,859,429 |
| **බදු වගකීම්** | | | | | | |
| කල්බදු වගකීම් සඳහා පොලී | | | 236,983 | 250,137 | 191,784 | 170,465 |
| උප එකතුව | | | 236,983 | 250,137 | 191,784 | 170,465 |
| මුළු පොලී වියදම් | | | 18,206,943 | 10,832,186 | 19,270,402 | 11,205,126 |

## 7. ශුද්ධ ඉපැයුම් වාරික

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**රක්ෂණ සහ ආයෝජන ගිවිසුම්වල සැලසුම් වර්ගීකරණය**

SLFRS 4- "රක්ෂණ ගිවිසුම්" සඳහා පවරනු ලබන රක්ෂණ අවදානම් මට්ටම මත පදනම්ව, රක්ෂකයා විසින් 'රක්ෂණ ගිවිසුම්' හෝ 'ආයෝජන ගිවිසුම්' වශයෙන් වර්ගීකරණය කිරීමට ලියන ලද ගිවිසුම් අවශ්‍ය වේ.

රක්ෂණ ගිවිසුම් යනු, රක්ෂණ හිමියන් වෙත විශේෂිත අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීම) හේතුවෙන් අහිතකර බලපෑමක් ඇති වූ විට, අදාල රක්ෂණ හිමියන් වෙත හානිපූරණය කිරීමට එකග වෙමින් සමාගම විසින් (රක්ෂකයා) වෙනත් පාර්ශ්වයක් (රක්ෂණ හිමියන්) වෙතින් සැලකිය යුතු රක්ෂණ අවදානමක් බාරගන්නා ගිවිසුම් වේ. පොදු මාර්ගෝපදේශයක් වශයෙන්, රක්ෂිත සිදුවීම සිදු නොවුවහොත්, ගෙවන ලද ප්‍රතිලාභ සහ ගෙවිය යුතු ප්‍රතිලාභ සංසන්දනය කරමින් සැලකිය යුතු රක්ෂණ අවදානමක් ඇතිද යන්න සමාගම විසින් නිර්ණය කරනු ලබයි. රක්ෂණ ගිවිසුම්වලදී මූල්‍ය අවදානම පැවරීමද සිදුකළ හැකිවේ.

ආයෝජන ගිවිසුම් යනු සැලකිය යුතු රක්ෂණ අවදානමක් නොමැති, සැලකිය යුතු මූල්‍ය අවදානමක් පැවරෙන ගිවිසුම් වේ. මූල්‍ය අවදානම යනු, කොන්ත්‍රාත්තුවේ පාර්ශ්වයකට විශේෂිත නොවන බව මූල්‍ය නොවන විචල්‍යයක් සම්බන්ධයෙන් සපයා ඇති නිශ්චිත පොලී අනුපාතිකයක හෝ කිහිපයක, මූල්‍ය සාධන පත්‍රයක මිලක, භාණ්ඩ මිලක, විදේශ විනිමය අනුපාතිකයක, මිල හෝ අනුපාත ලැයිස්තුවක, ණය ශ්‍රේණිගත කිරීම් හෝ වෙනත් විචල්‍යයන්වල සිදුවිය හැකි අනාගත වෙනසක් හේතුවෙන් උද්ගත වන අවදානම වේ.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් වර්ගීකරණය කළ පසු, හිමිකම් සහ බැඳීම් අවසන් වීම හෝ කල් ඉකුත් වීම සිදු නොවුණේ නම්, මෙම කාල සීමාව තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු ආකාරයෙන් අඩු වුවද, රක්ෂණ ගිවිසුමක් එහි ඉතිරි ජීව කාලය තුළ රක්ෂණ ගිවිසුමක් වශයෙන් පවතී. කෙසේ වුවද රක්ෂණ අවදානම ආරම්භ වීම සැලකිය යුතු මට්ටමකට පැමිණි පසු ආයෝජන ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කළ හැකි වේ.

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී ( පීපල්ස් ලීසිං හි පරිපාලිතය) අලෙවි කරනු ලබන සියලුම සැලසුම් රක්ෂණ සැලසුම් වන බැවින්, SLFRS 4 - රක්ෂණ ගිවිසුම් යටතේ රක්ෂණ ගිවිසුම් වශයෙන් වර්ගීකරණය කෙරේ. එම නිසා වාර්තා කරන දින වන විට, නිෂ්පාදන සැලසුම් කළඹ තුළ කිසිදු ආයෝජන ගිවිසුමක් නොවිය.

**දළ ලිඛිත වාරිකයෙහි ආදායම් හඳුනා ගැනීම**

දළ ලිඛිත වාරිකය (GWP) මඟින් අවදානම් භාරගැනීම වෙනුවෙන් සමාගම් විසින් අයකරනු ලබන වාරිකය නියෝජනය කරයි. දළ ලිඛිත වාරිකය උපචිත පදනම මත ගිණුම්ගත කෙරේ.

ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද ගිවිසුම් මඟින් සපයන ලද, මුළු ආවරණ කාලපරිච්ඡේදයට අදාළ ලද/ලැබිය යුතු සමස්ත වාරිකවලින් දළ ලිඛිත වාරිකය සමන්විත වන අතර, රක්ෂණය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනා ගැනේ.

හිමිකම් නොපෑමේ ප්‍රතිදානය වැනි වාරික අනුපාතයෙහි අංගයක් නිරූපණය කරනු ලබන ප්‍රතිදානයන් දළ ලිඛිත වාරිකයෙන් අඩු කෙරේ.

**රක්ෂණ - දළ ලිඛිත වාරිකයෙහි ආදායම් හඳුනා ගැනීම**

ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මඟින් සපයන ලද, මුළු ආවරණ කාලපරිච්ඡේදයට අදාළ ලැබිය යුතු සමස්ත වාරිකවලින් ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකය සමන්විත වන අතර, රක්ෂණය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනා ගැනේ.

**ප්‍රතිරක්ෂණ වාරිකය**

කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මඟින් සපයන ලද, මුළු ආවරණයට අදාළ ගෙවිය යුතු සමස්ත වාරිකයෙන් ජීවිත නොවන දළ ප්‍රතිරක්ෂණ වාරිකය සමන්විත වන අතර, රක්ෂණය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනා ගැනේ. පෙර ගිණුම්කරණ කාලපරිච්ඡේදයන්හිදී ඇරඹුනු ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන්, මෙම ගිණුම්කරණ කාලපරිච්ඡේදයේදී උද්ගත වූ කවර හෝ ගැළපීමක් වාරිකයේ ඇතුළත් වේ.

**නොඉපැයූ වාරික සංචිතය**

නොඉපැයූ වාරික සංචිතය මඟින් කල්ඉකුත් නොවූ ආවරණ කාලසීමාවට අදාළ, වසර තුළ ලියන ලද වාරික කොටස නියෝජනය වේ. නොඉපැයූ වරික 365 පදනමින් ගණනය කෙරේ.

**නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිත**

නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය යනු, වසරකදී ලියන ලද වාර්තාකරණ දිනයෙන් පසු අවදානම් කාලපරිච්ඡේදයන් හා සම්බන්ධ වාරිකයේ කොටස වේ. නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය, පාදක වන සෘජු රක්ෂණයන්ගේ කාලසීමාව පුරා වෙනස් වේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023<br>රු. '000 | 2022<br>රු. '000 | 2023<br>රු. '000 | 2022<br>රු. '000 |
| දළ ලිඛිත වාරිකය | - | - | 5,819,786 | 6,049,693 |
| අඩු: ප්‍රතිරක්ෂණකරුවන්ට පවරන ලද වාරිකය | - | - | 1,383,534 | 1,142,976 |
| අඩු: නොඉපැයූ වාරික සංචිතයේ වෙනස | - | - | (237,601) | (32,354) |
| මුළු එකතුව | - | - | 4,673,853 | 4,939,071 |

## 8. ගාස්තු සහ කොමිස් ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**ගාස්තු සහ කොමිස් ආදායම**

සමූහය විසින් තම ගනුදෙනුකරුවන්ට සපයන විවිධ වූ සේවා මඟින් ගාස්තු සහ කොමිස් ආදායම උපයා ගනී. කොමිස් ආදායම උපචිත පදනම මත හඳුනාගැනේ. ගාස්තු ආදායම පහත සඳහන් කාණ්ඩ දෙකකට බෙදිය හැකිය;

**නිශ්චිත කාලසීමාවක් තුළ සපයනු ලබන සේවාවන්ගෙන් ඉපැයූ ගාස්තු ආදායම**

යම් කාලපරිච්ඡේදයක් තුළ සේවා සැපයීම සඳහා උපයන ගාස්තු එම කාලයේ උපචිත වේ.

**ගනුදෙනු සේවා සැපයීමේ ගාස්තු ආදායම**

ලේඛන සැකසීම සහ වාහන පරීක්ෂා කිරීම වැනි තුන්වන පාර්ශ්වයක් සඳහා ගනුදෙනුවක් සාකච්ඡා කිරීම හෝ ඊට සහභාගී වීමෙන් පැන නගින ගාස්තු, එයට පාදක වූ ගනුදෙනු අවසන් වූ පසු හඳුනා ගැනේ. යම් කාර්යසාධනයකට සම්බන්ධ ගාස්තු හෝ සංරචක අදාළ ක්‍රියාපටිපාටිය සම්පූර්ණ කිරීමෙන් පසුව හඳුනා ගැනේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023<br>රු. '000 | 2022<br>රු. '000 | 2023<br>රු. '000 | 2022<br>රු. '000 |
| සේවා ගාස්තු | 494,523 | 522,316 | 107,464 | 160,404 |
| සෙසු ගාස්තු සහ කොමිස් | 770,764 | 1,354,208 | 583,731 | 1,161,109 |
| මුළු එකතුව | 1,265,287 | 1,876,524 | 691,195 | 1,321,513 |

### 9. මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 රු. '000 | 2022 රු. '000 | 2023 රු. '000 | 2022 රු. '000 |
| ශුද්ධ වෙළඳපොළ (අලාභ)/ලාභ | 9,053 | (8,496) | (6,133) | 30,325 |
| ශුද්ධ ප්‍රාග්ධන ලාභය | 90 | 35,279 | 10,301 | 56,200 |
| එකතුව | 9,143 | 26,783 | 4,168 | 86,525 |

### 10. වෙනත් මෙහෙයුම් ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

වෙනත් මෙහෙයුම් ආදායම, සමූහයේ සාමාන්‍ය මෙහෙයුම්වලට සෘජුව සම්බන්ධ නොවූ වෙනත් මූලාශ්‍රයන්ගෙන් උපයන ලද ආදායම්වලින් සමන්විත වන අතර, ඒවා උපචිත පදනම මත හඳුනා ගැනේ.

**ලාභාංශ ආදායම**

ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

**මෝටර් රථ අලෙවි කිරීමෙන් ලද ශුද්ධ වෙළඳ ආදායම**

ආනයනිත මෝටර් රථ අලෙවියෙන් ලැබෙන ආදායම, සාමාන්‍යයෙන් අදාළ රථය ලබා දීමේදී, එනම් හිමිකාරිත්වය සම්බන්ධ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීමෙන් පසු හඳුනා ගැනේ.

**මෙහෙයුම් කල්බදු ආදායම**

මෙහෙයුම් කල්බදුවලින් ඇති වන ආදායම, දැනට පවතින කල්බදුවල කොන්දේසි අනුව සරල මාර්ගික පදනමින් ගිණුම්ගත කෙරෙන අතර, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ දක්වනු ලැබේ.

**දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත ලාභය හෝ අලාභය**

දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීමෙන් ඇති වන ලාභය හෝ අලාභය, අදාළ අලෙවිය සිදු කරන ලද කාලපරිච්ඡේදයේදී ලාභ හෝ අලාභ ප්‍රකාශයේ මුදල් පදනමින් ගිණුම්ගත කෙරේ.

**කුලී ආදායම**

මෝටර් රථ කුලියට දීමෙන් වන කුලී ආදායම, වසර සඳහා හිමිකරු සහ කුලීකරු අතර ඇති වූ එකඟත්වය පදනම්ව, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**තක්සේරු ආදායම**

ඒවා උපලබ්ධි වූ පසු හෝ උපලබ්ධි කළ හැකි විට, තක්සේරු ආදායම හඳුනා ගැනේ.

**රක්ෂණ ගාස්තු ආදායම**

රක්ෂණවර පරිපාලන සේවා සහ වෙනත් ගිවිසුම්ගත ගාස්තු වෙනුවෙන් රක්ෂණ හිමියන්ගෙන් අය කිරීම් සිදු කෙරේ. ලද පසු හෝ ගෙවීමට නියමිත වූ විට මෙම ගාස්තු ආදායම හඳුනා ගැනේ.

**වෙනත් ආදායම්**

වෙනත් ආදායම්, උපචිත පදනමින් හඳුනා ගැනේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත වන ලාභය | 22,189 | 17,529 | 22,189 | 55,778 |
| කුලී ආදායම | - | - | 463 | 2,436 |
| මෙහෙයුම් කල්බදු ආදායම | - | - | 7,366 | 25,030 |
| ආයෝජන දේපළවලින් ලද කුලී ආදායම | - | - | 78,392 | 75,712 |
| මෝටර් රථ අලෙවි කිරීමෙන් ලද ශුද්ධ වෙළඳ ආදායම | - | 99 | - | 99 |
| ලාභාංශ ආදායම - විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයෙන් | 4,487 | 5,591 | 4,487 | 5,591 |
| - පරිපාලිත | 513,828 | 930,625 | - | - |
| - ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයෙන් | 2,527 | 625 | 2,527 | 625 |
| ආයෝජන දේපළවල ලාභය/(අලාභය) | - | - | 94,692 | - |
| තක්සේරු ආදායම | - | - | 55,363 | 106,662 |
| රක්ෂණ ගාස්තු ආදායම | - | - | 82,590 | 57,588 |
| වෙනත් ආදායම් | 4,259 | 2,078 | 38,442 | 27,564 |
| එකතුව | 547,290 | 956,547 | 386,511 | 357,085 |

## 11. ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායනය සහ වෙනත් අලාභ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගම සහ සමූහය මගින් "SLFRS 9" මූල්‍ය සාධන පත්‍ර අනුව ණය සහ ලැබිය යුතු දෑ සම්බන්ධ අපහායන ප්‍රතිපාදනවල වෙනස්කම් හඳුනා ගනු ලැබේ. සමාගම් සහ සමූහය මගින් ඒ සඳහා යොදා ගනු ලබන ක්‍රමවේදය පිළිබඳ මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිටු අංක 265 සටහන 25 හි පැහැදිලි කෙරේ.

**කපාහැරීම ඇතුළුව ඇප බැහැර කිරීම් මත අලාභය**

අයකර ගැනීමේ ප්‍රායෝගික අවස්ථාවක් නොමැති විටදී, ණය සහ ලැබිය යුතු දෑ (සහ අදාළ අපහායන දීමනා ගිණුම්) කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් කපා හැරේ. ණය සහ ලැබිය යුතු දෑ පියවා ගැනීමේ දී සාමාන්‍යයෙන් ඇපයක් ඇති විට ඇපය උපලබ්ධි කිරීමෙන් කවර හෝ ආදායමක් ලැබීමෙන් පසු මෙය සිදු කෙරේ.

**අයකරගත් බොල් ණය**

බොල් ණය සහ අවිනිශ්චිත ණය වශයෙන් කපා හැරුණු මුදල් අය කර ගැනීම, මුදල් පදනමකින් හඳුනා ගැනේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| කෝවල හානිකරණ | 11.3/11.4 | 245 | 490,044 | 487,288 | 490,044 | 487,288 |
| සාමූහික හානිකරණ | 11.3/11.4 | 245 | 31,642 | 132,344 | 213,684 | 442,868 |
| වෙනත් ලැබිය යුතු දෑ | | | - | 6,760 | (43,760) | (5,623) |
| කපාහැරීම ඇතුළුව ඇප බැහැර කිරීම් මත අලාභය | | | 96,679 | 104,746 | 96,679 | 104,746 |
| කපා හැරුණු ණය/ බැහැර කරන ලද අලාභ අය කර ගැනීම | | | (49,880) | (75,713) | (52,685) | (77,523) |
| එකතුව | 11.1/11.2 | 244 | 568,485 | 655,425 | 703,962 | 951,756 |

## 11. ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායනය සහ වෙනත් අලාභ (සබැදේ)

### 11.1 ණය සඳහා අපහායනය (ප්‍රතිවර්තනය) සහ සෙසු අලාභ (විස්තරාත්මක බෙදීයාම) - සමාගම

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2023 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 46,181 | 1,280,342 | (1,457,062) | (130,539) |
| ලැබිය යුතු කුලී පිට ගැණුම්/මුරාබා | (6,795) | 7,441 | (9,307) | (8,661) |
| කාලීන ණය සහ ලැබිය යුතු දෑ | 7,413 | 2,101,527 | (1,401,255) | 707,685 |
| එකතුව | 46,799 | 3,389,310 | (2,867,624) | 568,485 |

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 28,415 | 2,766,525 | (2,187,125) | 607,815 |
| ලැබිය යුතු කුලී පිට ගැණුම්/මුරාබා | (6,795) | 17,586 | (10,232) | 559 |
| කාලීන ණය සහ ලැබිය යුතු දෑ | 7,413 | 2,078,221 | (2,045,342) | 40,292 |
| වෙනත් ලැබිය යුතු දෑ | - | 389,417 | (382,658) | 6,759 |
| එකතුව | 29,033 | 5,251,749 | (4,625,357) | 655,425 |

### 11.2 ණය සඳහා අපහායනය (ප්‍රතිවර්තනය) සහ සෙසු අලාභ (විස්තරාත්මක බෙදීයාම) - සමූහය

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2023 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 46,181 | 1,280,342 | (1,457,062) | (130,539) |
| ලැබිය යුතු කුලී පිට ගැණුම්/මුරාබා | (6,795) | 7,441 | (153,797) | (153,151) |
| කාලීන ණය සහ ලැබිය යුතු දෑ | 4,608 | 2,428,059 | (1,401,255) | 1,031,412 |
| වෙනත් ලැබිය යුතු දෑ | - | (43,760) | - | (43,760) |
| එකතුව | 43,994 | 3,672,082 | (3,012,114) | 703,962 |

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 28,415 | 2,766,525 | (2,187,125) | 607,815 |
| ලැබිය යුතු කුලී පිට ගැණුම්/මුරාබා | (6,795) | 73,823 | (10,232) | 56,796 |
| කාලීන ණය සහ ලැබිය යුතු දෑ | 5,603 | 2,332,507 | (2,045,342) | 292,768 |
| වෙනත් ලැබිය යුතු දෑ | - | 377,035 | (382,658) | (5,623) |
| එකතුව | 27,223 | 5,549,890 | (4,625,357) | 951,756 |

## 11.3 ආදායම් ප්‍රකාශය වෙත අපහායන ගාස්තුව - සමාගම

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2023 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දෑ** | | | | |
| - කේවල අපහායනය | - | - | 490,044 | 490,044 |
| - සාමූහික අපහායනය | (429,686) | (67,893) | 529,221 | 31,642 |
| එකතුව | (429,686) | (67,893) | 1,019,265 | 521,686 |

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දෑ** | | | | |
| - කේවල අපහායනය | - | - | 487,288 | 487,288 |
| - සාමූහික අපහායනය | 506,739 | (222,248) | (152,147) | 132,344 |
| එකතුව | 506,739 | (222,248) | 335,141 | 619,632 |

## 11.4 ආදායම් ප්‍රකාශය වෙත අපහායන ගාස්තුව - සමූහය

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2023 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දෑ** | | | | |
| - කේවල අපහායනය | - | - | 490,044 | 490,044 |
| - සාමූහික අපහායනය | (454,680) | 117,728 | 550,636 | 213,684 |
| එකතුව | (454,680) | 117,728 | 1,040,680 | 703,728 |

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දෑ** | | | | |
| - කේවල අපහායනය | - | - | 487,288 | 487,288 |
| - සාමූහික අපහායනය | 720,725 | (226,076) | (51,781) | 442,868 |
| එකතුව | 720,725 | (226,076) | 435,507 | 930,156 |

## 12. කාර්ය මණ්ඩල වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

කාර්ය මණ්ඩල වියදම් සඳහා වැටුප්, දිරිදීමනා, සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ සහ සෙසු ආශ්‍රිත වියදම් අඩංගු වේ. බැඳීමක් පියවීම් සඳහා ආර්ථික ප්‍රතිලාභ ආශ්‍රිත සම්පත් ඉවතට ගලා යෑමක් සිදු කළ යුතු බවට සහ බැඳීමේ වටිනාකම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටකදී දිරිදීමනා සඳහා ප්‍රතිපාදන හඳුනා ගැනේ.

අදාළ නීති සහ රෙගුලාසි අනුව සේවකයින්, සේවක අර්ථ අර්ථසාධක අරමුදල් (EPF) දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් (ETF) දායකත්වය සඳහා සුදුසුකම් ලබයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 19 - සේවක ප්‍රතිලාභ අනුව, පාරිතෝෂික වගකීම් සම්බන්ධයෙන් ආයුගණන තක්සේරුවක් මත පදනම්ව ආදායම් ප්‍රකාශයේදී විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් හඳුනා ගැනේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පාරිශ්‍රමික | | | 4,071,654 | 3,675,122 | 5,221,557 | 4,536,777 |
| සේවක ප්‍රතිලාභ - අර්ථ සාධක දායක සැලසුම් - EPF | | | 208,985 | 195,504 | 270,711 | 247,093 |
| සේවක ප්‍රතිලාභ - අර්ථ සාධක දායක සැලසුම් - ETF | | | 52,237 | 48,895 | 65,149 | 60,674 |
| සේවක ප්‍රතිලාභ - විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂිකය | 43 | 307 | 155,670 | 82,893 | 174,517 | 102,203 |
| එකතුව | | | 4,488,546 | 4,002,414 | 5,731,934 | 4,946,747 |

## 13. ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය

**ක්ෂයවීම්**

දේපළ, පිරියත සහ උපකරණවල එක් එක් කොටසක ඇස්තමේන්තුගත සඵල ජීව කාලය පුරා ඒවායේ අවශේෂ වටිනාකම් වෙත සරල මාර්ගික පදනමකින් ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී ක්ෂයවීම් හඳුනා ගැනේ. මෙම ක්‍රමය මගින් අදාළ වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත ක්‍රමය සමීපව පිළිබිඹු කෙරේ. ඉඩම් ක්ෂයවීමට ලක් නොවේ.

**අපේක්ෂිත සඵල ජීවකාලයන් පහත දැක්වෙන පරිදි වේ;**

| වත්කම් කාණ්ඩය | % වසරකට | කාලසීමාව |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2 | අවුරුදු 50 |
| බදු දේපළ වැඩිදියුණු කිරීම් | 25 | අවුරුදු 4 |
| මෝටර් රථ | 12.5 - 20 | අවුරුදු 5 - 8 |
| පරිගණක දෘඩාංග | 20 | අවුරුදු 5 |
| කාර්යාල උපකරණ | 10 - 20 | අවුරුදු 5 -10 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 20 | අවුරුදු 5 |

ඉහත දැක්වෙන අනුපාතයන් සමූහයේ සියලුම සමාගම් මගින් සංගතව භාවිත කෙරේ. කළමනාකාරිත්වය විසින් අදහස් කරන පරිදි භාවිතයට සුදුසු තත්ත්වයට පත්කිරීමෙන් අනතුරුව, පරිශ්‍රයේ පවතින විට දේපළ, පිරියත සහ උපකරණවල එක් එක් සැලකිය යුතු කොටස් සඳහා ක්ෂයවීමේ අනුපාතයන් වෙන වෙනම තීරණය කෙරේ. කිසියම් වත්කමක් විකිණීම සඳහා රඳවාගෙන ඇති බවට හෝ අදාළ වත්කම් හඳුනා ගැනීමෙන් බැහැර කිරීම යන දින දෙකෙන් කලින් එළැඹෙන දිනයේදී වත්කමක ක්ෂය වීම අවසන් වේ. එක් එක් වාර්තා කරන දිනයේ දී ක්ෂයවීමේ ක්‍රම, සඵල ජීව කාලයන් සහ අවශේෂ වටිනාකම් ප්‍රතිතක්සේරු ගතකොට සුදුසු පරිදි ගළපනු ලැබේ.

වසර ආරම්භයේ දී සහ වසර අවසානයේදී ධාරණ අගයන් සහ සමුච්චිත ක්ෂයවීම් ගැළපුම්ද ඇතුළත්ව සියලුම දේපළ පිරියත සහ උපකරණ කාණ්ඩයන් පිටු අංක 289 සටහන 32 හි දැක්වේ.

**භාවිත හිමිකම් වත්කම් ක්‍රමක්ෂය**

භාවිත හිමිකම් වත්කම් පසුව ක්ෂයවීමට ලක් වේ. වත්කමෙහි සඵල ජීවකාලය සහ කල්බදු කාලසීමාව යන දෙකෙන් කෙටි කාලසීමාව පුරා ක්ෂයවීම සිදු කෙරේ.

**අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය**

පහත දක්වෙන විශේෂිත අනුපාතයන් අනුව ඒවායේ ඇස්තමේන්තුගත සඵල ජීවකාලය පුරා අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය ඒවායේ අවශේෂ වටිනාකම්වලට ලියා තැබීම සඳහා සරල මාර්ගික ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය ගණනය කෙරේ;

| වත්කම් කාණ්ඩය | % වසරකට | කාලසීමාව |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 20 | අවුරුදු 5 |

සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය නොකරන ලද ශේෂයන්, හානිකරණය සඳහා වාර්ෂිකව සමාලෝචනයට ලක් කරන අතර, හානිකරණය පිළිබඳ කවර හෝ දර්ශකයක් ඇත්නම් තවදුරටත් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභවලින් අයකර ගත නොහැකි තාක් දුරට ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගැනේ.

වසර ආරම්භයේ දී සහ වසර අවසානයේදී ධාරණ අගයන් සහ සමුච්චිත ක්‍රමක්ෂය ගැළපුම්ද ඇතුළත්ව සියලුම අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩයන් පිටු අංක 294 සටහන 34 හි දැක්වේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | පිටු | 2023 | 2022 | 2023 | 2022 |
| | සටහන | අංකය | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම | 32 | 289 | 165,015 | 168,564 | 284,076 | 296,458 |
| ක්‍රමක්ෂය - භාවිත හිමිකම් වත්කම් | 33 | 293 | 523,101 | 518,284 | 361,012 | 325,327 |
| ක්‍රමක්ෂය - අස්පෘශ්‍ය වත්කම් | 34 | 294 | 10,456 | 13,195 | 15,045 | 16,879 |
| එකතුව | | | 698,572 | 700,043 | 660,133 | 638,664 |

## 14. ප්‍රතිලාභ, හිමිකම් පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**දළ හිමිකම්පෑම් හඳුනා ගැනීම**

වාර්තා කළ හෝ නොකළ, වසර තුළ ඇති වූ සියලුම හිමිකම්, හිමිකම්පෑම් සැකසීම සහ පියවීම් සඳහා සෘජුව සම්බන්ධ ආශ්‍රිත බාහිර හිමිකම්පෑම් හි පරිහරණ පිරිවැය, සුන්බුන් සහ වෙනත් අයකරවා ගත හැකි අගයෙන් අඩු කිරීමක්, සහ පසුගිය වසරවලින් හිඟ හිමිකම්පෑම් සඳහා කවර හෝ ගැළපුමක් ආදියෙන් ජීවිත නොවන රක්ෂණ සඳහා දළ හිමිකම්පෑම් සමන්විත වේ. කේවල හිමිකම්පෑම් ලිපිගොනු යොදා ගනිමින් හිඟ හිමිකම් ඇගයුමට ලක් කෙරෙන අතර හිමිකම්පෑම් පියවීම සඳහා වන අවසන් පිරිවැය ඇස්තමේන්තුගත කෙරේ.

සෘජු රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් හිඟ හිමිකම්පෑම් සඳහා හිමිකම්පෑම් වියදම් සහ වගකීම් හඳුනා ගැනේ. වගකීම් මඟින් වාර්තා කරන ලද නමුත් නොපියවන ලද, දරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) හිමිකම්පෑම් සහ අදාළ හිමිකම්පෑම් පියවීමේදී අපේක්ෂිත සෘජු හා වක්‍ර පිරිවැය ආවරණය වේ. අතීත අත්දැකීම් සහ ප්‍රවණතා මත පදනම්ව අනාගත වගකීම් පිළිබඳ වඩාත් යථාර්ථවාදී ඇස්තමේන්තුවක් තහවුරු කරනු පිණිස IBNR ආශ්‍රිත ප්‍රතිපාදන කාර්තුමය පදනමක් මත ආයුගණක තක්සේරුවකට ලක් කෙරේ.

දැනට පවතින තොරතුරු මත පදනම්ව හිමිකම්පෑම් සඳහා වෙන් කිරීම සාධාරණව ප්‍රකාශිත බවට අධ්‍යක්ෂවරුන් සලකන අතර, පසුව උද්ගතවන තොරතුරු සහ සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අවසාන වගකීම වෙනස් විය හැකිය. මෙය දක්වා ඇති ප්‍රමාණයන් සඳහා ගැළපීමට හේතු විය හැකිය. එවැනි වටිනාකම් අදාළ කාල පරිච්ඡේදය සඳහා වන මූල්‍ය ප්‍රකාශවල දක්වනු ලැබේ. යොදාගනු ලබන ක්‍රමවේදයන් සහ සිදු කරනු ලබන ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ.

**ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් හඳුනා ගැනීම්**

අදාළ ගිවිසුමෙහි කොන්දේසි අනුව ආශ්‍රිත දළ රක්ෂණ හිමිකම් පෑම් හඳුනා ගැනීමේදී ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් හඳුනා ගැනේ.

ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුත්තේ සැලසුම් වර්ගීකරණය සැලකිල්ලට ගනිමින්, ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුත්ත සෘජු රක්ෂණ ව්‍යාපාර කටයුත්තක් ලෙස සලකමින් සමාන ආකාරයෙන්ම උපකල්පිත ප්‍රතිරක්ෂණය සම්බන්ධ හිමිකම්පෑම් ආදායම් හෝ වියදම් වශයෙන් හඳුනා ගැනේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් | - | - | 2,790,316 | 2,704,556 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කරගැනීමේ පිරිවැය | - | - | 461,355 | 523,919 |
| එකතුව | - | - | 3,251,671 | 3,228,475 |

## 15. වෙනත් මෙහෙයුම් වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම් අතර ඍජු සම්බන්ධය මත පදනම්ව වෙනත් මෙහෙයුම් වියදම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. වසර සඳහා ලාභය නිර්ණය කිරීමේදී ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව යොදා ගැනීම සඳහා දරන ලද සියලු වියදම් ආදායම් ප්‍රකාශය වෙත අය කෙරේ.

**වගා රක්ෂණ බද්ද** (CIL)

2013 අංක 12 දරන මුල්‍ය පනතේ වගන්ති 14 හි විධිවිධාන ප්‍රකාරව, 2013 අප්‍රේල් පළවෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලද අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. දැනට, වගා රක්ෂණ බද්ද බදු වලට පසු ලාභයෙන් 1% වශයෙන් ගෙවිය යුතු වේ.

**අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්**

අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද ගාස්තුවලින් සමන්විත වේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් | 5,726 | 4,939 | 14,794 | 12,711 |
| විගණකවරුන්ගේ ගාස්තු | 7,032 | 7,385 | 14,630 | 14,444 |
| විගණකවරුන් වෙත විගණන නොවන ගාස්තු | 1,406 | 1,317 | 1,406 | 1,317 |
| වෘත්තීය ගාස්තු | 37,658 | 23,689 | 41,813 | 34,112 |
| ප්‍රචාරණ ගාස්තු | 39,529 | 12,618 | 75,804 | 53,709 |
| නීති ගාස්තු | 7,529 | 8,702 | 15,492 | 12,829 |
| තැන්පතු රක්ෂණ වාරිකය | 147,584 | 148,678 | 147,584 | 148,678 |
| වගා රක්ෂණ බද්ද | 37,689 | 45,973 | 37,689 | 45,973 |
| ආයෝජන දේපළ මගින් උද්ගත වන මෙහෙයුම් වියදම් | - | - | 9,700 | 11,145 |
| කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම් | 1,798,385 | 1,881,196 | 2,181,848 | 2,272,562 |
| එකතුව | 2,082,538 | 2,134,497 | 2,540,760 | 2,607,480 |

## 16. මූල්‍ය සේවා මත බදු

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**මූල්‍ය සේවා මත වැට්**

මූල්‍ය සේවා මත වැට් ගණනය කරනු ලබන්නේ 2002 අංක 14 දරන අගය එකතු කළ බදු (වැට්) පනත සහ ඊට පසුව සිදු කරන ලද සංශෝධන අනුවය. මූල්‍ය සේවා මත අගය එකතු කළ බදු ගණනය සඳහා අගය පදනම ගණනය කරනු ලබන්නේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කරන ලද අනුපාත මත ගණනය කරන ලද ආර්ථික ක්ෂයවීම්, ආදායම් බදු සහ ගෙවිය යුතු වැටුප්වලට පෙර ගිණුම් ලාභයට ගැළපීමෙන්ය. වැටුප් ගෙවිය යුතු සඳහා මුදල් ප්‍රතිලාභ, මුදල් නොවන ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ ඇතුළත් වේ. වත්මන් මූල්‍ය වර්ෂය සඳහා අදාළ මූල්‍ය සේවා අනුපාතය මත වැට් බද්ද 18% (2021/22 - 15% - 18%) වේ.

**මූල්‍ය සේවා මත SSCL**

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ (SSCL පනත) දෙවන උපලේඛනයේ දක්වා ඇති වගකීම් පිරිවැටුම මත, 2022 ඔක්තෝම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි, 2.5% ක අනුපාතයකට, මූල්‍ය සේවා සැපයීමේදී ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ඕනෑම පුද්ගලයෙකු විසින් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ගෙවිය යුතුය. මූල්‍ය සේවා වෙත ආරෝපණය කළ හැකි අගය එකතු කිරීමේ 100% මත SSCL ගෙවිය යුතුය. 2022 අංක 14 දරන අගය එකතු කළ බදු පනතේ III අ පරිච්ඡේදයේ දක්වා ඇති ආරෝපණය කළ හැකි ක්‍රමය යොදා ගනිමින් මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයේ SSCL ගෙවීම සඳහා මූල්‍ය සේවා සඳහා අදාළ කළ හැකි අගය එකතු කිරීම ගණනය කළ යුතුය.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| මූල්‍ය සේවා මත වැට් | 1,526,568 | 1,645,111 | 1,565,971 | 1,705,797 |
| මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 104,900 | - | 107,609 | - |
| එකතුව | 1,631,468 | 1,645,111 | 1,673,580 | 1,705,797 |

## 17. ආදායම් බදු වියදම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

ආදායම් බදු වියදම, ජංගම බදු වියදම් සහ විලම්භිත බදු වියදම් /(ආපසු හැරවීම) වලින් සමන්විත වේ. ආදායම් බදු වියදම හිමිකම් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් හි සෘජුවම පිළිගත් අයිතමවලට අදාළ වන ප්‍රමාණයට හැර, ආදායම් ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත.

**ජංගම බදු**

වත්මන් වර්ෂය සහ පෙර වර්ෂ සඳහා ජංගම බදු වත්කම් සහ වගකීම්, බදුකරණ අධිකාරි වෙතින් ප්‍රතිසාධනයට හෝ වෙත ගෙවීමට අපේක්ෂිත අගයට මනිනු ලැබේ. ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිත කරනු ලබන බදු අනුපාත සහ බදු නීති වාර්තා කරන දිනයට පනවනු ලබන හෝ මූලිකව පනවනු ලබන්නක් වේ.

ඒ අනුව, සමාගම විසින් 2022/2023 වරිපනම් වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක ආදායම් බදු අනුපාතයක් ඔස්සේ ආදායම් බදු වගකීම ගණනය කරන ලදී. 2022/2023 වරිපනම් වර්ෂයේ දෙවන මාස හය සඳහා සමාගමේ ආදායම් බදු වගකීම ගණනය කිරීම සඳහා 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුකූලව 30% ක සංශෝධිත ආදායම් බදු අනුපාතිකය සහ අනෙකුත් සංශෝධන යොදා ගන්නා ලදී.

**අධිභාර බදු**

2022 අංක 14 දරන අධිභාර බදු පනතට අනුව, 2020/21 වරිපනම් වර්ෂයට අදාළව රුපියල් මිලියන 7,788.66 ක බදු අය කළ හැකි ආදායමෙන් රුපියල් මිලියන 1,947.16 ක අධිභාර බද්දකට සමාගම යටත් වේ. ඉහත පනතට අනුව, අධිභාර බද්ද, 2020 ජනවාරි 01 වැනි දින පටන් මූල්‍ය ප්‍රකාශවල වියදමක් ලෙස සලකනු ලැබේ. පනතට වඩා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා බලපැවැත්වෙන බැවින්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අධිභාර බද්ද සඳහා ගිණුම්කරණය පිළිබඳ SoAT මගින් දක්වා ඇති පරිදි අධිභාර බදු වියදම් ගිණුම් කොට ඇත. ඒ අනුව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී, සමාගම විසින් අධිභාර බද්ද සඳහා වන සම්පූර්ණ වගකීම, 2022 අප්‍රේල් 01 දිනට ආරම්භක රඳවාගත් ඉපැයීම් සඳහා ගැළපීමක් ලෙස හඳුනා ගෙන ඇත.

**විලම්භිත බදුකරණය**

2023 මාර්තු 31 දිනට සමාගමේ විලම්භිත බදු වත්කම්/වගකීම්, 30% සංශෝධිත ආදායම් බදු අනුපාතිකය භාවිතයෙන් ගණනය කරන ලදී. ගිණුම් ප්‍රතිපත්ති සහ විලම්භිත බදු ඇස්තමේන්තුව පිළිබඳ විස්තරාත්මක හෙළිදරව් කිරීම මූල්‍ය ප්‍රකාශවල සටහන 44 හි දක්වා ඇත.

| සමාගම | | පිටු | ජංගම බදු අනුපාතය | |
|---|---|---|---|---|
| | සටහන | අංකය | 2023 | 2022 |
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | | | 24%-30% | 24% |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | | 24%-30% | 24% |
| පීපල්ස් මයික්‍රො - කොමර්ස් ලිමිටඩ් | | | 24%-30% | 24% |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 17.1 | 249 | 24%-30% | 24% |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | 17.2 | 250 | 20%-30% | 20%-24% |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | 17.3 | 250 | 10% | Exempt |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | 17.4 | 250 | 40.00% | 40.00% |

### 17.1 පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී

ජංගම බදු යනු, වාර්තාකරණ දිනට බලාත්මක කරන ලද හෝ පසුව බලාත්මක කරන ලද බදු අනුපාතය භාවිත කරමින්, බදුවලට යටත් යන ආදායම මත ගෙවිය යුතු බවට අපේක්ෂිත බදු සහ පෙර වසර සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු වෙත කවර හෝ ගැළපුමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු වේ. බදුකරණය සඳහා වන ප්‍රතිපාදන, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව බදුකරණ කාර්යයන් සඳහා සකස් කරන ලද වර්ෂය සඳහා වන ලාභය මත පදනම් වේ.

ජංගම ආදායම් බදු වත්කම් හා වගකීම් සඳහා, පෙර කාලපරිච්ඡේදය සම්බන්ධ ගෙවිය යුතු හෝ අයකරගත යුතු යැයි අපේක්ෂිත බදු සඳහා වන ගැළපීම් ඇතුළත් වේ. අදාළ බදු රෙගුලාසි අර්ථදැක්වීමට යටත් වන අවස්ථාවන්හිදී, ප්‍රතිපාදන වෙන් කරමින් අදාළ තත්ත්වයන් සම්බන්ධ බදු ආදායම් ආශ්‍රිතව ගනු ලැබූ පියවර කළමනාකාරිත්වය විසින්, අදාළ පරිදි කලින් කලට විමර්ශනය කරනු ලැබේ. 2022/2023 වරිපනම් වර්ෂයේ පළමු මාස හය සඳහා ආදායම් බදු අනුපාත ආදායම් බද්ද 24% ක් යෙදීමට සමාගම යටත් වේ. 2022/2023 වරිපනම් වර්ෂයේ දෙවන මාස හය සඳහා සමාගමේ ආදායම් බදු වගකීම ගණනය කිරීම සඳහා 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුකූලව 30% ක සංශෝධිත ආදායම් බදු අනුපාතිකය සහ අනෙකුත් සංශෝධන යොදා ගන්නා ලදී.

### 17. ආදායම් බදු වියදම (සබැඳේ)

### 17.2 පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්

ආයෝජන මණ්ඩල පනතෙහි වගන්ති 17 ප්‍රකාරව, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් 2008 දෙසැම්බර් 3 දිනැති ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග එළඹි ගිවිසුම ප්‍රකාරව, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් මගින් ලාභ උපයන බවට හඳුනාගැනීමේ වසරේ සිට වසර පහක කාලපරිච්ඡේදයක් සඳහා හෝ සිය වාණිජ මෙහෙයුම් අරඹන ලද්දේ යයි හඳුනාගනු ලබන වසරේ සිට වසර දෙකක් පසු නොවූ කවර ඇගයුම් වසරක් හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය තෙක් ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම සම්බන්ධ දේශීය ආදායම් පනත අදාළ නොවේ. සමාගම බදු විරාම කාලපරිච්ඡේදයේ අවසන් දිනය අවසන් වූ වහාම වසර 2 ක් සඳහා 10% ක සහන බදු අනුපාතිකයකට සහ 10% ක සහන බදු කාලපරිච්ඡේදය කල් ඉකුත්වීමෙන් පසුව 20% ක සහන බදු කාලසීමාවකටද සුදුසුකම් ලබයි. ආයෝජන මණ්ඩල නොවන ආදායම 30% ක සාමාන්‍ය අනුපාතයකට වගකිව යුතුය.

### 17.3 පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්

මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් ආයෝජන මණ්ඩල නීතියේ වගන්ති 17 අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග 2010 දෙසැම්බර් 16 වැනි දින එළඹි ගිවිසුම ප්‍රකාරව, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් මගින් ලාභ උපයන බවට හඳුනාගැනීමේ වසරේ සිට වසර පහක කාලපරිච්ඡේදයක් සඳහා හෝ සිය වාණිජ මෙහෙයුම් අරඹන ලද්දේ යයි හඳුනාගනු ලබන වසරේ සිට වසර දෙකක් පසු නොවූ කවර ඇගයුම් වසරක් හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය තෙක් ආදායම් බදු පැනවීම, ගෙවීම සහ අයකිරීම සම්බන්ධ දේශීය ආදායම් පනත අදාළ නොවේ. සමාගම බදු විරාම කාලපරිච්ඡේදයේ අවසන් දිනය අවසන් වූ වහාම වසර 2 ක් සඳහා 10% ක සහන බදු අනුපාතිකයකට සහ 10% ක සහන බදු කාලපරිච්ඡේදය කල් ඉකුත්වීමෙන් පසුව 20% ක සහන බදු කාලසීමාවකටද සුදුසුකම් ලබයි.

### 17.4 ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්

1984 බංග්ලාදේශ ආදායම් බදු පනත සහ එහි සංශෝධන ප්‍රකාරව, ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත 40%ක බදු අනුපාතයක් අදාළ වේ.

### 17.5 ආදායම් බදු වියදම

| | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | 2023 රු. '000 | 2022 රු. '000 | 2023 රු. '000 | 2022 රු. '000 |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශය** | | | | | | |
| ජංගම ආදායම් බදු ගාස්තුව | 17.6 | 251 | 1,471,393 | 2,664,536 | 2,132,725 | 3,173,817 |
| වසර සඳහා විලම්බිත බදු (ප්‍රතිවර්තනය)/ගාස්තුව | 44 | 309 | (147,275) | (673,452) | (244,223) | (766,656) |
| ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගත් ආදායම් බදු වියදම | | | 1,324,118 | 1,991,084 | 1,888,502 | 2,407,161 |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** | | | | | | |
| වසර සඳහා විලම්බිත බදු ගාස්තුව/ (ප්‍රතිවර්තනය) | 44 | 309 | (41,460) | (57,433) | (54,418) | (57,612) |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් ආදායම් බදු ගාස්තුව/(ප්‍රතිවර්තනය)** | | | (41,460) | (57,433) | (54,418) | (57,612) |
| සඵල බදු අනුපාතය (විලම්භිත බදු හැර) | | | 33.89% | 40.07% | 40.01% | 43.93% |
| සඵල බදු අනුපාතය | | | 30.50% | 29.94% | 35.43% | 33.32% |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශය** | | | | | | |
| වසර තුළ සංචලන මත ඇති වූ ගාස්තු/(ප්‍රතිවර්තන) | | | (78,471) | 673,452 | (176,951) | (766,656) |
| බදු අනුපාතිකවල වෙනස්කම් හේතුවෙන් ගාස්තු/(ප්‍රතිවර්තන) | | | (68,804) | - | (67,272) | - |
| | | | (147,275) | 673,452 | (244,223) | (766,656) |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | | | | |
| වසර තුළ සංචලන මත ඇති වූ ගාස්තු/(ප්‍රතිවර්තන) | | | (33,168) | (57,433) | (43,536) | (57,612) |
| බදු අනුපාතිකවල වෙනස්කම් හේතුවෙන් ගාස්තු/(ප්‍රතිවර්තන) | | | (8,292) | - | (10,882) | - |
| | | | (41,460) | (57,433) | (54,418) | (57,612) |

### 17.6 ගිණුම්ගත ලාභය සහ බදුවලට යටත් වන ආදායම අතර සැසඳුම

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| ලාභ හෝ අලාභ ප්‍රකාශය අනුව ලාභය | | | 4,341,756 | 6,650,093 | 5,330,203 | 7,225,330 |
| එකතු කිරීම: අනුමත නොකළ වියදම් | | | 3,216,890 | 3,537,261 | 4,159,442 | 4,057,954 |
| එකතු කිරීම: අයකරගත හැකි කල්බදු ප්‍රාග්ධනය | | | 817,039 | 5,788,713 | 817,039 | 5,788,713 |
| අඩු කිරීම: අනුමත කළ වියදම් | | | 2,709,307 | 4,363,762 | 2,859,307 | 4,711,073 |
| අඩු කිරීම: නිදහස් කරන ලද/අනුමත කළ ආදායම් | | | 319,717 | 4,483 | 402,401 | 236,240 |
| ව්‍යවස්ථාපිත ආදායම | | | 5,346,661 | 11,607,822 | 7,044,977 | 12,124,684 |
| අඩු කිරීම: වසර තුළදී භාවිත කරන ලද බදු අලාභය | 17.7 | 251 | - | - | - | - |
| තක්සේරු කළ ආදායම | | | 5,346,661 | 11,607,822 | 7,044,977 | 12,124,684 |
| බදු වලට යටත් වන ආදායම | | | 5,346,661 | 11,607,822 | 7,044,977 | 12,124,684 |
| ව්‍යවස්ථාපිත ආදායමේදී ආදායම් බදු වියදම | 17.8 | 251 | 1,471,393 | 2,712,280 | 2,132,725 | 3,221,561 |
| (අධි)/අව ප්‍රතිපාදන - පෙර වසරවල | | | - | (47,744) | - | (47,744) |
| වසර සඳහා ලාභ මත ජංගම බදු | | | 1,471,393 | 2,664,536 | 2,132,725 | 3,173,817 |
| වසර සඳහා විලම්භිත බදු (ප්‍රතිවර්තනය)/ගාස්තුව | 44.1 | 310 | (147,275) | (673,452) | (244,223) | (766,656) |
| වසර සඳහා බදු වියදම | | | 1,324,118 | 1,991,084 | 1,888,502 | 2,407,161 |

### 17.7 වර්ෂය තුළදී ඉදිරියට ගෙන එන ලද සහ භාවිත කළ බදු අලාභ

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| ඉදිරියට ගෙනා බදු අලාභ | - | - | 67,971 | 67,971 |
| වසර තුළදී භාවිත කළ බදු අලාභ | - | - | - | - |
| භාවිත නොකළ සහ ඉදිරියට ගෙනා බදු අලාභ | - | - | 67,971 | 67,971 |

### 17.8 ව්‍යවස්ථාපිත ආදායමේදී ආදායම් බදු වියදම

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 1,471,393 | 2,712,280 | 1,471,393 | 2,712,280 |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | - | - | 20,363 | 68,653 |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | - | - | 28,333 | 93,247 |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | - | - | 458,219 | 219,958 |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | - | - | 36,096 | 26,562 |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | - | - | 118,321 | 100,861 |
| සඵල අනුපාතිකය යටතේ මුළු ආදායම් බදු | 1,471,393 | 2,712,280 | 2,132,725 | 3,221,561 |

## 17. ආදායම් බදු වියදම් (සැබැඳේ)

### 17.9 වසර තුළදී ගෙවන ලද බදු පිළිබඳ සාරාංශය

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 රු. '000 | 2022 රු. '000 | 2023 රු. '000 | 2022 රු. '000 |
| සෘජු බදු | | | | |
| ආදායම් බදු | 2,309,372 | 1,175,310 | 2,619,752 | 1,958,933 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | 1,629,017 | 1,568,235 | 1,668,229 | 1,597,458 |
| මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 77,808 | - | 79,857 | - |
| වගා රක්ෂණ බදු | 39,637 | 48,509 | 47,817 | 60,462 |
| අධිභාර බදු | 1,947,167 | - | 2,493,093 | - |
| මුළු සෘජු බදු | 6,003,001 | 2,792,054 | 6,908,748 | 3,616,853 |
| වක්‍ර බදු (රැස් කළ සහ ගෙවූ) | | | | |
| එකතු කළ අගය මත බදු | 138,697 | 148,433 | 736,548 | 529,610 |
| වෙනත් ආදායම් පදනම මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 11,060 | - | 78,479 | - |
| මුද්දර ගාස්තු | 141,341 | 173,443 | 149,012 | 181,192 |
| ලාභාංශ සහ පොලිය මත රඳවා ගැනීමේ බදු | 100,781 | - | 105,142 | - |
| උපයන විට ගෙවීමේ බදු /අත්තිකාරම් පුද්ගල ආදායම් බදු | 87,568 | 33,987 | 95,828 | 35,394 |
| මුළු වක්‍ර බදු | 479,447 | 355,863 | 1,165,009 | 746,196 |
| මූල්‍ය වර්ෂය තුළ ගෙවන ලද මුළු බදු | 6,482,448 | 3,147,917 | 8,073,757 | 4,363,049 |

## 18. සාමාන්‍ය කොටසකට මූලික/තනුක ඉපැයීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමාගමෙහි සාමාන්‍ය කොටස් හිමියන් වෙත ආරෝපණය කළ හැකි ලාභය හෝ අලාභය අදාළ කාලපරිච්ඡේදය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන්, මූලික කොටසකට ඉපැයීම් ගණනය කෙරේ. කොටසකට තනුක ඉපැයීම් ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන ලාභ හෝ අලාභ සහ සියලු තනුක විභවය සහිත සාමාන්‍ය කොටස්වල බලපෑම සඳහා හිගව පවතින සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍යය මත පදනම්වය.

| මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 රු. '000 | 2022 රු. '000 | 2023 රු. '000 | 2022 රු. '000 |
| සමාගමේ හිමිකම් දරන්නන්ට අරෝපණය කළ හැකි ලාභය (රු.) | 3,017,638,245 | 4,659,008,652 | 3,507,013,959 | 4,805,730,508 |
| 2023 මාර්තු 31 දිනට සාමාන්‍ය කොටස් සංඛ්‍යාව (2022 - ප්‍රතිප්‍රකාශිත) | 2,041,883,116 | 2,041,883,116 | 2,041,883,116 | 2,041,883,116 |
| සාමාන්‍ය කොටසකට මූලික/තනුක ඉපැයුම් (රු.) | 1.48 | 2.28 | 1.72 | 2.35 |

### 19. සාමාන්‍ය කොටසකට ලාභාංශය

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම 2023 | සමාගම 2022 |
|---|---|---|
| ගෙවන ලද කොටස් ලාභාංශය/මුදල් ලාභාංශය (රු.) | 943,597,501 | 2,179,924,683 |
| ගෙවන ලද මුළු ලාභාංශය (රු.) | 943,597,501 | 2,179,924,683 |
| සාමාන්‍ය කොටසකට ලාභාංශය (රු.) | 0.50 | 1.25 |

### 20. මිනුම්කරණ පදනම අනුව මූල්‍ය සාධන පත්‍ර පිළිබඳ විශ්ලේෂණය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

මූල්‍ය සාධන පත්‍ර සාධාරණ අගය හෝ ක්‍රමක්ෂය පිරිවැය පදනමක් මත අඛණ්ඩව මිනුම්ගත කෙරේ. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය මගින්, එක් එක් මූල්‍ය සාධන පත්‍ර කාණ්ඩය මිනුම්කරණය කරන ලද ආකාරය සහ සාධාරණ අගය ලාභ සහ අලාභ ඇතුළුව ආදායම් සහ වියදම්, හඳුනා ගන්නා ලද ආකාරය විස්තර කෙරේ. පහත වගුව මගින්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9 "මූල්‍ය සාධන පත්‍ර ፡ හඳුනා ගැනීම සහ මිනුම්කරණය"මගින් නිර්වචනය කර ඇති පරිදි කාණ්ඩ වශයෙන් මූල්‍ය සාධන පත්‍රවල ධාරණ අගයන් විශ්ලේෂණය කෙරේ.

#### 20.1 සමාගම

| 2023 මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා ලද මූල්‍ය සාධන පත්‍ර (FVTPL) රු. '000 | ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය සාධන පත්‍ර (AC) රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගන්නා ලද මූල්‍ය සාධනපත්‍ර (FVOCI) රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 262 | - | 5,844,798 | - | 5,844,798 |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්වල ශේෂයන් | 23 | 263 | - | 29,839,914 | - | 29,839,914 |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 24 | 263 | 203,975 | - | - | 203,975 |
| ණය සහ ලැබිය යුතු දෑ | 25 | 265 | - | 114,277,945 | - | 114,277,945 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීරණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 27 | 282 | - | - | 944,653 | 944,653 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධන පත්‍ර | 28 | 283 | - | 10,903,577 | - | 10,903,577 |
| වෙනත් මූල්‍ය වත්කම් | 31 | 288 | - | 100,306 | - | 100,306 |
| **මුළු මූල්‍ය වත්කම්** | | | 203,975 | 160,966,540 | 944,653 | 162,115,168 |
| **වගකීම්** | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 35 | 296 | - | 7,724,671 | - | 7,724,671 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 36 | 298 | - | 100,935,114 | - | 100,935,114 |
| නිකුත් කරන ලද ණය සුරැකුම්පත් | 37 | 299 | - | 16,706,049 | - | 16,706,049 |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 301 | - | 1,457,388 | - | 1,457,388 |
| කල්බදු වගකීම් | 40 | 304 | - | 1,753,723 | - | 1,753,723 |
| **මුළු මූල්‍ය වගකීම්** | | | - | 128,576,945 | - | 128,576,945 |

## 20. මිනුම්කරණ පදනම අනුව මූල්‍ය සාධන පත්‍ර පිළිබඳ විශ්ලේෂණය (සබැඳේ)

### 20.2 සමාගම

| 2022 මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට ගන්නා ලද මූල්‍ය සාධන පත්‍ර (FVTPL) රු. '000 | ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය සාධන පත්‍ර (AC) රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගන්නා ලද මූල්‍ය සාධනපත්‍ර (FVOCI) රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 262 | - | 4,668,830 | - | 4,668,830 |
| බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂයන් | 23 | 263 | - | 5,117,866 | - | 5,117,866 |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 24 | 263 | 25,140 | - | - | 25,140 |
| ණය සහ ලැබිය යුතු දෑ | 25 | 265 | - | 151,274,454 | - | 151,274,454 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට | 27 | 282 | - | - | 1,333,278 | 1,333,278 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධන පත්‍ර | 28 | 283 | - | 9,827,221 | - | 9,827,221 |
| වෙනත් මූල්‍ය වත්කම් | 31 | 288 | - | 108,493 | - | 108,493 |
| **මුළු මූල්‍ය වත්කම්** | | | 25,140 | 170,996,864 | 1,333,278 | 172,355,282 |
| **වගකීම්** | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 35 | 296 | - | 11,749,332 | - | 11,749,332 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 36 | 298 | - | 103,367,904 | - | 103,367,904 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 37 | 299 | - | 17,244,313 | - | 17,244,313 |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 301 | - | 3,636,528 | - | 3,636,528 |
| කල්බදු වගකීම් | 40 | 304 | - | 2,059,050 | - | 2,059,050 |
| **මුළු මූල්‍ය වගකීම්** | | | - | 138,057,127 | - | 138,057,127 |

### 20.3 සමූහය

| 2022 මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට ගන්නා ලද මූල්‍ය සාධන පත්‍ර (FVTPL) රු. '000 | ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය සාධන පත්‍ර (AC) රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගන්නා ලද මූල්‍ය සාධනපත්‍ර (FVOCI) රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 262 | - | 6,316,003 | - | 6,316,003 |
| බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂයන් | 23 | 263 | - | 34,224,917 | - | 34,224,917 |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 24 | 263 | 345,093 | - | - | 345,093 |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය අනුව | 25 | 265 | | 125,377,904 | - | 125,377,904 |
| ලැබිය යුතු රක්ෂණ හා ප්‍රතිරක්ෂණ | 26 | 281 | - | 1,498,065 | - | 1,498,065 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට | 27 | 282 | - | - | 1,372,962 | 1,372,962 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධන පත්‍ර | 28 | 283 | - | 15,859,672 | - | 15,859,672 |
| **මුළු මූල්‍ය වත්කම්** | | | 345,093 | 183,276,561 | 1,372,962 | 184,994,616 |
| **වගකීම්** | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 35 | 296 | - | 11,068,522 | - | 11,068,522 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 36 | 298 | - | 107,979,956 | - | 107,979,956 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 37 | 299 | - | 16,564,956 | - | 16,564,956 |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 301 | - | 1,709,574 | - | 1,709,574 |
| රක්ෂණ වගකීම් හා ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 39 | 302 | - | 5,206,622 | - | 5,206,622 |
| කල්බදු වගකීම් | 40 | 304 | - | 1,477,875 | - | 1,477,875 |
| **මුළු මූල්‍ය වගකීම්** | | | - | 144,007,505 | - | 144,007,505 |

## 20.4 සමූහය

| 2022 මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට සාධන පත්‍ර හඳුනාගන්නා ලද මූල්‍ය සාධන පත්‍ර (FVTPL) රු. '000 | ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය සාධන පත්‍ර (AC) රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගන්නා ලද මූල්‍ය සාධනපත්‍ර (FVOCI) රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 262 | - | 5,402,587 | - | 5,402,587 |
| බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂයන් | 23 | 263 | - | 9,529,518 | - | 9,529,518 |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 24 | 263 | 849,298 | - | - | 849,298 |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය අනුව | 25 | 265 | - | 163,320,846 | - | 163,320,846 |
| ලැබිය යුතු රක්ෂණ හා ප්‍රතිරක්ෂණ | 26 | 282 | - | 1,322,528 | - | 1,322,528 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට | 27 | 282 | - | - | 1,632,941 | 1,632,941 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධන පත්‍ර | 28 | 283 | - | 16,013,525 | - | 16,013,525 |
| **මුළු මූල්‍ය වත්කම්** | | | 849,298 | 195,589,004 | 1,632,941 | 198,071,243 |
| **වගකීම්** | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 35 | 296 | - | 15,300,361 | - | 15,300,361 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 36 | 298 | - | 111,453,750 | - | 111,453,750 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 37 | 299 | - | 17,103,223 | - | 17,103,223 |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 301 | - | 4,043,322 | - | 4,043,322 |
| කල්බදු වගකීම් | 40 | 304 | - | 1,588,115 | - | 1,588,115 |
| රක්ෂණ වගකීම් හා ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 39 | 302 | - | 5,903,363 | - | 5,903,363 |
| **මුළු මූල්‍ය වගකීම්** | | | - | 155,392,134 | - | 155,392,134 |

## 21. වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

තක්සේරුකරණ ශිල්ප ක්‍රම භාවිත කරමින් සාධාරණ අගයට වාර්තාගත මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය නිර්ණය කරනු ලබන ආකාරය පහත විස්තර කෙරේ. වෙළඳපොළ සහභාගිවන්නෙකු සාධන පත්‍ර තක්සේරු කිරීමේදී කරන උපකල්පනවලට අදාළ සමූහයේ/සමාගමේ ඇස්තමේන්තු මේවාට ඇතුළත් වේ.

### 21.1 මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට

මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ආදායම මනිනු ලබන්නේ මූලිකව ලැයිස්තුගත ආයෝජන සුරැකුම්පත්වලින් සමන්විත මිලකරණ ආකෘතීන් හෝ තක්සේරුකරණ ශිල්ප ක්‍රම භාවිත කරමිනි. මෙම ලැයිස්තුගත ආයොජන සුරැකුම්පත් එක් එක් සුරැකුම්වල ක්‍රියාකාරී වෙළඳපොළ තුළ ප්‍රකාශ වෙළඳපොළ මිල භාවිත කරමින් තක්සේරු කෙරේ.

### 21.2 මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට

මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට තක්සේරු කරනු ලබන්නේ මූලිකව ලැයිස්තුගත ආයෝජනවලින් සමන්විත තක්සේරුකරණ ශිල්ප ක්‍රම භාවිත කරමිනි. මෙම ලැයිස්තුගත වත්කම් එක් එක් සුරැකුම්වල ක්‍රියාකාරී වෙළඳපොළ තුළ ප්‍රකාශ වෙළඳපොළ මිල භාවිත කරමින් තක්සේරු කෙරේ.

### 21.3 ක්‍රමක්ෂය පිරිවැය අනුව ධාරණය කෙරෙන මූල්‍ය වත්කම් සහ වගකීම්

ක්‍රමක්ෂය පිරිවැය අනුව ධාරණය කෙරෙන ස්ථාවර අනුපාත මූල්‍ය වත්කම්වල සාධාරණ අගය ඇස්තමේන්තු කෙරෙනුයේ වට්ටම්ගත මූල්‍ය ප්‍රවාහ එළඹුම් පදනම මතය. මෙම එළඹුම මගින් සාධාරණ අගය මැනීමේ සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුමක් වශයෙන් සමාන මූල්‍ය සාධන පත්‍රයන්හි ප්‍රවර්තන වෙළඳපොළ මිල භාවිත කෙරෙන අතර ඒ නිසාවෙන් එය සාධාරණ අගය ධූරාවලියෙහි 3 මට්ටම යටතේ වර්ග කෙරේ.

### 21. වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය (සබැඳේ)

### 21.4 සාධාරණ අගයට අනාවරණය කළ දේපළ, පිරියත හා උපකරණ

සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන දිනයෙහි ඒවායේ සාධාරණ අගය වශයෙන් ප්‍රත්‍යාගණන වටිනාකම අනුව හෙළිදරව් කෙරෙන අතර එහිදී පසුව සිදුවන කවර හෝ සමුච්චිත ක්ෂය හෝ සමුච්චිත හානිකරණ අලාභයෙන් අඩු කෙරේ.

### 21.5 තක්සේරුකරණ ආකෘතිය

බාහිර වශයෙන් ප්‍රකාශ මිල හෝ ආකෘතීන් වෙත නිරීක්ෂණය කළ හැකි මිලකරණ යෙදවුම් ආශ්‍රයෙන් සාධාරණ අගය නිර්ණය කෙරෙන සියලුම මූල්‍ය සාධන පත්‍රයන් සඳහා, ස්වාධීන මිල තීරණය කිරීමක් හෝ වලංගු කිරීමක් ලබා ගැනේ. අක්‍රිය වෙළඳපොළක් තුළ, වෙළඳ මිලක් සම්බන්ධ සෘජු නිරීක්ෂණය සිදු කළ නොහැකි විය හැක. මෙකී තත්ත්වයන්හිදී, සමාගම මඟින්, වඩාත් අදාළ සහ විශ්වසනීය තොරතුරු වෙත වැඩි සැලකිල්ලක් ලබාදෙමින්, මූල්‍ය සාධන පත්‍රයෙහි සාධාරණ අගය වලංගු කිරීම සඳහා විකල්ප වෙළඳපොළ තොරතුරු භාවිත කෙරේ.

**තක්සේරුකරණ රාමුව**

වෙළඳ හා ආයෝජන මෙහෙයුම් සහ සැලකිය යුතු සෙසු සියලු වත්කම් හා වගකීම්වල සාධාරණ අගය මැනීම සම්බන්ධයෙන් සමාගම මඟින් පාලන රාමුවක් ස්ථාපනය කරනු ලැබ ඇත. විශේෂිත පාලනයන් පහත දැක්වේ:

- නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්තවලට සාපේක්ෂව ආවර්තිතව (දෛනිකව, මාසිකව හෝ කාර්තුමය වශයෙන්) සාධාරණ අගය මිනුම් සමාලෝචනය කිරීම
- වෙළඳපොළ තත්ත්වයන්, සැලකිය යුතු විනිශ්චයන් සහ උපකල්පනයන්හි වෙනස්වීම්වලට සාපේක්ෂව ආවර්තිතව (අවම වශයෙන් වාර්ෂිකව) සාධාරණ අගය මිනුම් ආකෘතීන් සමාලෝචනය කිරීම

### 21.6 සාධාරණ අගය සහ සාධාරණ අගයෙහි ධුරාවලිය නිර්ණය කිරීම

තක්සේරුකරණ ශිල්ප ක්‍රම මඟින් මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය නිර්ණය කිරීම සහ අනාවරණය කිරීම සඳහා සමූහය මඟින් පහත දැක්වෙන ධුරාවලිය භාවිත කෙරේ.

මට්ටම 1: එක සමාන වත්කම් හෝ වගකීම්වල සක්‍රිය වෙළඳපොළ ලැයිස්තුගත (ගැළපුම් සිදු නොකරන ලද) මිල ගණන්

මට්ටම 2: සෘජුව හෝ වක්‍රව, වාර්තාගත සාධාරණ අගය වෙත සැලකිය යුතු බලපෑමක් නිරීක්ෂණය කළ හැකි සියලු යෙදවුම් සහිත වෙනත් ශිල්ප ක්‍රම

මට්ටම 3: නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත මත පදනම් නොවී වාර්තාගත සාධාරණ අගය වෙත සැලකිය යුතු බලපෑමක් සිදු කළ හැකි යෙදවුම් සහිත ශිල්ප ක්‍රම

පහත දැක්වෙන වගුව මඟින් සාධාරණ අගය ධුරාවලියේ මට්ටම අනුව සාධාරණ අගයට වාර්තාකළ/අනාවරණය කළ වත්කම් සහ වගකීම් පිළිබඳ විශ්ලේෂණයක් දැක්වේ.

| 2023 මාර්තු 31 දිනට<br>සමාගම | සටහන | පිටු අංකය | තක්සේරුකරණ දිනය | මට්ටම 1<br>රු.000 | මට්ටම 2<br>රු.000 | මට්ටම 3<br>රු.000 | එකතුව<br>රු.000 |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | | | | |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | | | | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 27 | 282 | 31.03.2023 | 228,541 | - | - | 228,541 |
| ණයකර | | | 31.03.2023 | - | - | 716,112 | 716,112 |
| උප එකතුව | | | | 228,541 | - | 716,112 | 944,653 |
| **මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 24 | 263 | 31.03.2023 | 203,975 | - | - | 203,975 |
| උප එකතුව | | | | 203,975 | - | - | 203,975 |
| **මූල්‍ය නොවන වත්කම් - ආයෝජන දේපළ** | | | | | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | | | 31.03.2023 | - | - | 284,961 | 284,961 |
| උප එකතුව | | | | - | - | 284,961 | 284,961 |
| එකතුව | | | | 432,516 | - | 1,001,073 | 1,433,589 |
| **සාධාරණ අගයට අනාවරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්** | | | | | | | |
| සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි (දේපළ, පිරියත සහ උපකරණ යටතේ ඇතුළත්) | 32.4 | 292 | | - | - | 1,243,058 | 1,243,058 |
| එකතුව | | | | - | - | 1,243,058 | 1,243,058 |

| 2022 මාර්තු 31 දිනට සමාගම | සටහන | පිටු අංකය | තක්සේරුකරණ දිනය | මට්ටම 1 රු. '000 | මට්ටම 2 රු. '000 | මට්ටම 3 රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | | | | |
| **මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 27 | 282 | 31.03.2022 | 231,838 | - | - | 231,838 |
| ණයකර | 27 | 282 | 31.03.2022 | - | - | 1,101,440 | 1,101,440 |
| උප එකතුව | | | | 231,838 | - | 1,101,440 | 1,333,278 |
| **මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 24 | 263 | 31.03.2022 | 25,140 | - | - | 25,140 |
| උප එකතුව | | | | 25,140 | - | - | 25,140 |
| එකතුව | | | | 256,978 | - | 1,101,440 | 1,358,418 |
| **සාධාරණ අගයට අනාවරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්** | | | | | | | |
| සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි (දේපළ, පිරියත සහ උපකරණ යටතේ ඇතුළත්) | 32.4 | 292 | | - | - | 1,047,943 | 1,047,943 |
| එකතුව | | | | - | - | 1,047,943 | 1,047,943 |

පහත දැක්වෙන වගුව මඟින් සාධාරණ අගය ධුරාවලියේ මට්ටම අනුව සාධාරණ අගයට වාර්තාගත/අනාවරණය කෙරුණු වත්කම් සහ වගකීම් පිළිබඳ විශ්ලේෂණයක් දැක්වේ:

| 2023 මාර්තු 31 දිනට සමාගම | සටහන | පිටු අංකය | තක්සේරුකරණ දිනය | මට්ටම 1 රු. '000 | මට්ටම 2 රු. '000 | මට්ටම 3 රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | | | | |
| **මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 27 | 282 | 31.03.2023 | 228,541 | - | - | 228,541 |
| භාණ්ඩාගාර බිල්පත් | 27 | 282 | 31.03.2023 | - | 428,309 | - | 428,309 |
| ණයකර | 27 | 282 | 31.03.2023 | - | - | 716,112 | 716,112 |
| උප එකතුව | | | | 228,541 | 428,309 | 716,112 | 1,372,962 |
| **මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 24 | 263 | 31.03.2023 | 345,093 | - | - | 345,093 |
| උප එකතුව | | | | 345,093 | - | - | 345,093 |
| **මූල්‍ය නොවන වත්කම් - ආයෝජන දේපළ** | | | | | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 30 | 287 | 31.03.2023 | - | - | 1,200,317 | 1,200,317 |
| උප එකතුව | | | | - | - | 1,200,317 | 1,200,317 |
| **එකතුව** | | | | 573,634 | 428,309 | 1,916,429 | 2,918,372 |

## 21. වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය (සබැඳේ)

| 2022 මාර්තු 31 දිනට<br>සමාගම | සටහන | පිටු අංකය | තක්සේරුකරණ දිනය | මට්ටම 1<br>රු. '000 | මට්ටම 2<br>රු. '000 | මට්ටම 3<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | | | | |
| **මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | 27 | 282 | 31.03.2022 | - | 299,663 | - | 299,663 |
| ලැයිස්තුගත ආයෝජන | 27 | 282 | 31.03.2022 | 231,838 | - | - | 231,838 |
| ණයකර | 27 | 280 | 31.03.2022 | - | - | 1,101,440 | 1,101,440 |
| උප එකතුව | | | | 231,838 | 299,663 | 1,101,440 | 1,632,941 |
| **මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 24 | 263 | 31.03.2022 | 174,801 | - | - | 174,801 |
| ඒකක භාර තුළ ආයෝජන | 24 | 263 | 31.03.2022 | - | 674,497 | - | 674,497 |
| **උප එකතුව** | | | | 174,801 | 674,497 | - | 849,298 |
| **මූල්‍ය නොවන වත්කම් - ආයෝජන දේපළ** | | | | | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 30 | 287 | 31.03.2022 | - | - | 820,664 | 820,664 |
| උප එකතුව | | | | - | - | 820,664 | 820,664 |
| **එකතුව** | | | | 406,639 | 974,160 | 1,922,104 | 3,302,903 |
| **සාධාරණ අගයට අනාවරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්** | | | | | | | |
| සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි (දේපළ, පිරියත සහ උපකරණ යටතේ ඇතුළත්) | 32.4 | 292 | | - | - | 6,297,943 | 6,297,943 |
| **එකතුව** | | | | - | - | 6,297,943 | 6,297,943 |

2022/2023 සහ 2021/2022 කාලය තුළ 1 මට්ටම සහ 2 මට්ටම අතර සැලකිය යුතු හුවමාරු කිරීමක් සිදු නොවිනි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - SLFRS 13 - සාධාරණ අගය අනුව වෘත්තීය සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් ඉඩම් සහ ගොඩනැගිලි සඳහා තක්සේරු කිරීම සිදු කරන ලදී.

අදාළ වර්ෂය අවසානයට වත්කම් සහ වගකීම්වලට අදාළව වර්ෂය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගෙන ඇති සම්පූර්ණ සාධාරණ වටිනාකම් ලාභ/අලාභයන් පහත වගුවේ දැක්වේ.

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | සමාගම<br>2023<br>රු. '000 | <br>2022<br>රු. '000 | සමූහය<br>2023<br>රු. '000 | <br>2022<br>රු. '000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| **මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට** | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 9,143 | 26,783 | 4,168 | 86,525 |
| **එකතුව** | 9,143 | 26,783 | 4,168 | 86,525 |

3 වන මට්ටම සාධාරණ අගය මිනුම්කරණය
**සංසන්දනය**

පහත සටහන මඟින් සාධාරණ අගය ධූරාවලියෙහි මට්ටම 3 තුළ සාධාරණ අගය මිනුම්වල ආරම්භක ශේෂයන් සහ අවසාන ශේෂයන් අතර සැසඳුමක් ඉදිරිපත් කෙරේ. සමාගම මඟින්, මූල්‍ය ප්‍රකාශයන්හි සාධාරණ අගය සඳහා ගිණුම්ගත කෙරෙන ආයෝජන දේපළ හැරුණු විට පහත දැක්වෙන මූල්‍ය නොවන වත්කම්වල සාධාරණ අගය අනාවරණය කොට ඇත.

| | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන දේපළ | සින්නක්කර ඉඩම් ගොඩනැගිලි | එකතුව | ආයෝජන දේපළ | සින්නක්කර ඉඩම් ගොඩනැගිලි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2021 අප්‍රේල් 1 දිනට ශේෂය | - | 864,058 | 864,058 | 820,664 | 5,143,394 | 5,964,058 |
| එකතුකිරීම් | - | 149,702 | 149,702 | - | 149,702 | 149,702 |
| ගොඩනැගිලි ක්ෂය වීම් | - | - | - | - | (63,805) | (63,805) |
| වසර තුළ අනාවරණය කරන ලද සාධාරණ අගය | - | 34,183 | 34,183 | - | 247,988 | 247,988 |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | - | 1,047,943 | 1,047,943 | 820,664 | 5,477,279 | 6,297,943 |
| | | | | | | |
| 2022 අප්‍රේල් 1 දිනට ශේෂය | - | 1,047,943 | 1,047,943 | 820,664 | 5,477,279 | 6,297,943 |
| එකතුකිරීම් | 284,961 | - | 284,961 | 284,961 | - | 284,961 |
| වසර තුළ අනාවරණය කරන ලද සාධාරණ අගය | - | - | - | 94,692 | - | 94,692 |
| ගොඩනැගිලි ක්ෂය වීම් | - | - | - | - | (63,805) | (63,805) |
| වසර තුළ අනාවරණය කරන ලද සාධාරණ අගය | - | 195,115 | 195,115 | - | 814,228 | 814,228 |
| 2023 මාර්තු 31 දිනට ශේෂය | 284,961 | 1,243,058 | 1,528,019 | 1,200,317 | 6,227,702 | 7,428,019 |

## 21. වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය (සබැඳේ)

### සාධාරණ අගය මැනීමේදී යොදා ගන්නා ලද නිරීක්ෂණය කළ නොහැකි ආදානයන්

පහත වගුව මගින් සාධාරණ අගය ධූරාවලියෙහි මට්ටම 3 වශයෙන් වර්ග කොට ඇති මූල්‍ය නොවන සාධන පත්‍ර මැනීමේදී 2023 මාර්තු 31 සහ 2022 මාර්තු 31 භාවිත කරන ලද සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ. මූල්‍ය ප්‍රකාශයන්හි සාධාරණ අගය සඳහා ගිණුම්ගත කෙරෙන ආයෝජන දේපළ හැරුණු විට පහත දැක්වෙන මූල්‍ය නොවන වත්කම්වල සාධාරණ අගය සමාගම විසින් අනාවරණය කොට ඇත.

| සාධන පත්‍රයෙහි වර්ගය | තක්සේරු දිනය | සාධාරණ අගය රු.'000 | තක්සේරු ශිල්ප ක්‍රමය | නිරීක්ෂණය කළ නොහැකි සුවිශේෂී ආදානයන් | නිරීක්ෂණය කළ නොහැකි ආදානයන් වෙනුවෙන් බර තබන ලද සාමාන්‍ය පරාසය | නිරීක්ෂණය කළ නොහැකි ආදානයන් සඳහා සාධාරණ අගය මිනුමෙහි සංවේදීතාවය |
|---|---|---|---|---|---|---|
| **සමාගම** | | | | | | |
| **2023 මාර්තු 31 දිනට** | | | | | | |
| **දේපළ, පිරියත සහ උපකරණ** | | | | | | |
| සින්නක්කර ඉඩම් | 31.12.2022 | 1,167,058 | MCM | පර්චසයක ඇස්තමේන්තුගත මිල | රු. 60,000 - 6,000,000 | * |
| සින්නක්කර ගොඩනැගිලි | 31.12.2022 | 76,000 | MCM | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල | රු. 1,000 - 4,000 | * |
| | | | ආදායම් පදනම | වර්ග අඩියක ඇස්තමේන්තුගත කුලී වටිනාකම | රු. 20 - 60 | * |
| **2022 මාර්තු 31 දිනට** | | | | | | |
| **දේපළ, පිරියත සහ උපකරණ** | | | | | | |
| සින්නක්කර ඉඩම් | 31.12.2019 | 1,005,343 | MCM | පර්චසයක ඇස්තමේන්තුගත මිල | රු. 60,000 - 6,000,000 | * |
| සින්නක්කර ගොඩනැගිලි | 31.12.2019 | 42,600 | MCM | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල | රු. 1,000 - 4,000 | * |
| | | | ආදායම් පදනම | වර්ග අඩියක ඇස්තමේන්තුගත කුලී වටිනාකම | රු. 20 - 60 | * |
| **සමූහය** | | | | | | |
| **2023 මාර්තු 31 දිනට** | | | | | | |
| **ආයෝජන දේපළ** | | | | | | |
| සින්නක්කර ඉඩම් | 31.12.2022 | 302,287 | MCM | පර්චසයක ඇස්තමේන්තුගත මිල | රු. 600,000 - 13,000,000 | * |
| සින්නක්කර ගොඩනැගිලි | 31.12.2022 | 613,068 | MCM | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල | රු. 200 - 300 | * |
| | | | ආදායම් පදනම | වර්ග අඩියක ඇස්තමේන්තුගත කුලී වටිනාකම | රු. 14,500 | * |
| **දේපළ, පිරියත සහ උපකරණ** | | | | | | |
| සින්නක්කර ඉඩම් | 31.12.2022 | 3,704,771 | MCM | පර්චසයක ඇස්තමේන්තුගත මිල | රු. 50,000 - 13,000,000 | * |
| සින්නක්කර ගොඩනැගිලි | 31.12.2022 | 2,522,932 | MCM | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල | Rරු. 500 - 11,000 | * |
| | | | ආදායම් පදනම | වර්ග අඩියක ඇස්තමේන්තුගත කුලී වටිනාකම | රු. 5 - 250 | * |
| **2022 මාර්තු 31 දිනට** | | | | | | |
| **ආයෝජන දේපළ** | | | | | | |
| සින්නක්කර ඉඩම් | 31.12.2021 | 261,075 | MCM | පර්චසයක ඇස්තමේන්තුගත මිල | රු. 600,000 - 13,000,000 | * |
| සින්නක්කර ගොඩනැගිලි | 31.12.2021 | 559,589 | MCM | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල | රු. 200 - 300 | * |
| | | | ආදායම් පදනම | වර්ග අඩියක ඇස්තමේන්තුගත කුලී වටිනාකම | රු. 14,500 | * |
| **දේපළ, පිරියත සහ උපකරණ** | | | | | | |
| සින්නක්කර ඉඩම් | 31.12.2021 | 3,209,268 | MCM | පර්චසයක ඇස්තමේන්තුගත මිල | රු. 50,000 - 13,000,000 | * |
| සින්නක්කර ගොඩනැගිලි | 31.12.2021 | 2,268,011 | MCM | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල | රු. 500 - 11,000 | * |
| | | | ආදායම් පදනම | වර්ග අඩියක ඇස්තමේන්තුගත කුලී වටිනාකම | රු. 15 - 250 | * |

MCM - වෙළඳපොළ සැසඳුම් ක්‍රමය

* තනිව මෙම යෙදවුම්හි කවර හෝ සැලකිය යුතු ඉහළයාමක් / (පහළයාමක්) සාධාරණ අගයෙහි සැලකිය යුතු ඉහළයාමක් / (පහළයාමක්) කෙරෙහි හේතු වේ.

### 21.1 සාධාරණ අගය අනුව ධාරණය නොකළ වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය

පහත වගුවෙහි දැක්වෙනුයේ මූල්‍ය ප්‍රකාශයන්හි සාධාරණ අගය අනුව ධාරණය නොකළ සමූහයෙහි / සමාගමෙහි මූල්‍ය සාධන පත්‍රයන්හි, කාණ්ඩය අනුව, ධාරණ අගය සහ සාධාරණ අගය අතර සැසඳුමකි. මූල්‍ය නොවන වත්කම්හි / මූල්‍ය නොවන වගකීම්හි සාධාරණ අගය මෙම වගුවෙහි ඇතුළත් නොවේ.

| මාර්තු 31 දිනට | 2023 | | | | | 2022 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමාගම | මට්ටම 1 | මට්ටම 2 | මට්ටම 3 | මුළු සාධාරණ අගය | ධාරණ අගය | මට්ටම 1 | මට්ටම 2 | මට්ටම 3 | මුළු සාධාරණ අගය | ධාරණ අගය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | - | 5,844,798 | - | 5,844,798 | 5,844,798 | - | 4,668,830 | - | 4,668,830 | 4,668,830 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ඇති ශේෂයන් | - | 29,900,057 | - | 29,900,057 | 29,839,914 | - | 5,117,307 | - | 5,117,307 | 5,117,866 |
| ණය සහ ලැබිය යුතු දෑ (දළ) | - | 122,796,426 | - | 122,796,426 | 124,687,201 | - | 161,878,020 | | 161,878,020 | 161,162,024 |
| ණය සාධන පත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | - | 10,936,265 | - | 10,936,265 | 10,903,577 | - | 9,804,639 | - | 9,804,639 | 9,827,221 |
| වෙනත් මූල්‍ය වත්කම් | - | 100,306 | - | 100,306 | 100,306 | - | 108,493 | - | 108,493 | 108,493 |
| | - | 169,577,852 | - | 169,577,852 | 171,375,796 | - | 181,577,289 | - | 181,577,289 | 180,884,434 |
| **මූල්‍ය වගකීම්** | | | | | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | - | 7,450,914 | - | 7,450,914 | 7,724,671 | - | 11,750,052 | - | 11,750,052 | 11,749,332 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | - | 101,524,558 | - | 101,524,558 | 100,935,114 | - | 102,854,237 | - | 102,854,237 | 103,367,904 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | - | 13,139,340 | - | 13,139,340 | 16,706,049 | - | 16,266,084 | - | 16,266,084 | 17,244,313 |
| වෙනත් මූල්‍ය වගකීම් | - | 1,457,388 | - | 1,457,388 | 1,457,388 | - | 3,636,528 | - | 3,636,528 | 3,636,528 |
| කල්බදු වගකීම් | - | 1,570,117 | - | 1,570,117 | 1,753,723 | - | 2,072,188 | - | 2,072,188 | 2,059,050 |
| | - | 125,142,317 | - | 125,142,317 | 128,576,945 | - | 136,579,089 | - | 136,579,089 | 138,057,127 |

| මාර්තු 31 දිනට | 2023 | | | | | 2022 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමූහය | මට්ටම 1 | මට්ටම 2 | මට්ටම 3 | මුළු සාධාරණ අගය | ධාරණ අගය | මට්ටම 1 | මට්ටම 2 | මට්ටම 3 | මුළු සාධාරණ අගය | ධාරණ අගය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මූල්‍ය වගකීම්** | | | | | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | - | 6,316,003 | - | 6,316,003 | 6,316,003 | - | 5,402,587 | - | 5,402,587 | 5,402,587 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ඇති ශේෂයන් | - | 34,164,468 | - | 34,164,468 | 34,224,917 | - | 9,492,331 | - | 9,492,331 | 9,529,518 |
| ණය සහ ලැබිය යුතු දෑ (දළ) | - | 135,077,403 | - | 135,077,403 | 136,885,374 | - | 174,545,177 | - | 174,545,177 | 174,162,982 |
| ණය සාධන පත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | - | 1,498,065 | - | 1,498,065 | 1,498,065 | - | 1,322,528 | - | 1,322,528 | 1,322,528 |
| වෙනත් මූල්‍ය වත්කම් | - | 15,854,167 | - | 15,854,167 | 15,859,672 | - | 15,765,803 | - | 15,765,803 | 16,013,525 |
| | - | 192,910,106 | - | 192,910,106 | 194,784,031 | - | 206,528,426 | - | 206,528,426 | 206,431,140 |
| **මූල්‍ය වගකීම්** | | | | | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | - | 10,340,197 | - | 10,340,197 | 11,068,522 | - | 15,389,574 | - | 15,389,574 | 15,300,361 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | - | 108,431,346 | - | 108,431,346 | 107,979,956 | - | 110,876,896 | - | 110,876,896 | 111,453,750 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | - | 12,998,247 | - | 12,998,247 | 16,564,956 | - | 16,124,318 | - | 16,124,318 | 17,103,223 |
| වෙනත් මූල්‍ය වගකීම් | - | 1,709,574 | - | 1,709,574 | 1,709,574 | - | 4,043,322 | - | 4,043,322 | 4,043,322 |
| ලැබිය යුතු රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ | - | 5,206,622 | - | 5,206,622 | 5,206,622 | - | 5,903,363 | - | 5,903,363 | 5,903,363 |
| කල්බදු වගකීම් | | 1,328,797 | | 1,328,797 | 1,477,875 | | 1,587,902 | | 1,587,902 | 1,588,115 |
| | - | 140,014,783 | - | 140,014,783 | 144,007,505 | - | 153,925,375 | - | 153,925,375 | 155,392,134 |

**සාධාරණ අගයට ධාරණය නොකරන ලද මූල්‍ය වත්කම් සහ වගකීම්හි සාධාරණ අගය**

සමූහයේ සාධාරණ අගයන් ස්ථාපනය කිරීම් සඳහා භාවිත කරන ලද තක්සේරුකරණ ශිල්ප ක්‍රම සාධාරණ අගයට ධාරණය කරන ලද මූල්‍ය සාධන පත්‍රවල සාධාරණ අගයන් ගණනය කිරීම් සඳහා යොදා ගන්නා ලද ශිල්ප ක්‍රම සමග සංගත වේ. ගණනය කරන ලද සාධාරණ අගයන් හෙළිදරව් කිරීමේ අරමුණු සඳහා පමණක් වන අතර එමඟින් සමූහයේ වාර්තා කරන ලද මූල්‍ය කාර්යසාධනය හෝ තත්ත්වය කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොකරයි. සමූහය මඟින් ගණනය කරන ලද සාධාරණ අගයයන්, මූල්‍ය සාධන පත්‍රය පියවීමේදී හෝ කල් පිරීමේ දී ලැබෙන/ගෙවන සැබෑ වටිනාකම්වලින් වෙනස් විය හැක. ඇතැම් මූල්‍ය සාදන පත්‍ර කාණ්ඩයන් අලෙවි නොකරෙන බැවින්, සාධාරණ අගය ගණනය කිරීමේදී සැලකිය යුතු මට්ටමේ කළමනාකරණ විනිසුමක් යොදා ගැනිණි.

මූල්‍ය ප්‍රකාශයන්හි දැනටමත් සාධාරණ අගයට වාර්තා නොකරන ලද මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගයන් නිර්ණය කිරීම සඳහා යොදා ගන්නා ලද ක්‍රමවේදයන් සහ උපකල්පන පහත විස්තර කෙරේ.

## 21. වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය (සබැඳේ)

**බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ඇති ශේෂයන්**

කෙටිකාලීන කල් පිරිමක් සහිත (මාස තුනකට අඩු) මූල්‍ය වත්කම් සහ වගකීම් සඳහා ඒවායේ ධාරණ අගය ඒවායේ සාධාරණ අගයට දළ වශයෙන් සමාන වන බවට උපකල්පනය කෙරේ. මෙම උපකල්පනය ඉල්ලුම් තැන්පතු සහ නිශ්චිත කල්පිරීමක් නොමැති ඉතුරුම් ගිණුම් සඳහාද අදාළ වේ.

**ණය සහ ලැබිය යුතු**

ණය පැතිරීම්වල කවර හෝ සැලකිය යුතු සංචලනයට යටත්ව, වසරකට අඩු කල් පිරිමක් සහිත ගනුදෙනුකරුවන් වෙත ණය සහ අත්තිකාරම්වල සාධාරණ අගය සාමාන්‍යයෙන් දළ වශයෙන් ධාරණ අගයට සමාන වේ. වසරකට වැඩි කල් පිරිමක් සහ සහිත ණය හා අත්තිකාරම්වල ඇස්තමේන්තුගත සාධාරණ අගය මගින් ලබා ගැනීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහවල වට්ටම් ගත වටිනාකම් නියෝජනය වේ. සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා අපේක්ෂිත මුදල් ප්‍රවාහ ප්‍රවර්තන අනුපාත (පොලී අනුපාතය) අනුව වට්ටම් ගත කෙරේ.

**ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු**

කල්පිරීමේ කාලසීමාවක් නොමැති තැන්පතු (ඉතුරුම් තැන්පතු) වල ඇස්තමේන්තුගත සාධාරණ අගය ඉල්ලීම මත ගෙවිය යුතු මුදල වේ. ප්‍රකාශිත වෙළඳපොළ මිල රහිත ස්ථාවර පොලී දරන තැන්පතු (ස්ථාවර තැන්පතු) වල ඇස්තමේන්තුගත සාධාරණ අගය සමාන අවදානම් සහ අවශේෂ කල්පිරීම සහිත ණය සඳහා පවතින වෙළඳපොළ අනුපාතයන් භාවිත කරමින් මුදල් ප්‍රවාහ වට්ටම්ගත කිරීම මත පදනම් වේ.

**බැංකු වෙත ගෙවිය යුතු සහ නිකුත් කරන ලද ණය සුරැකුම්පත්**

විචල්‍ය අනුපාතය යනු වෙළඳපොළ සංචලනයන් පිළිබිඹු කරන සාධාරණ මිනුමකි. එමනිසා ධාරණ අගය මගින් විචල්‍ය අනුපාත සාධන පත්‍රයන්හි සාධාරණ අගය නියෝජනය වේ.

ණය පැතිරීමේ කවර හෝ සැලකිය සංචලනයකට යටත්ව, වසරකට අඩු කල්පිරීමක් සහිත ස්ථාවර අනුපාත ණයගැනීම්වල සාධාරණ අගය සාමාන්‍යයෙන් දළ වශයෙන් ධාරණ අගයට සමාන වේ. වසරකට වැඩි කල්පිරීමක් සහිත ස්ථාවර අනුපාත ණයගැනීම්වල සාධාරණ අගය ඇස්තමේන්තුගත සාධාරණ අගය මගින් ගෙවීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්හි වට්ටම්ගත වටිනාකම නියෝජනය වේ. සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා අපේක්ෂිත මුදල් ප්‍රවාහ ප්‍රවර්තන වෙළඳපොළ අනුපාතයන් අනුව වට්ටම්ගත කෙරේ.

**කල්බදු වගකීම්**

කල්බදු වගකීම්වල ඇස්මේන්තුගත සාධාරණ අගය, අනාගතයේදී ලැබීමට අපේක්ෂිත කල්බදු ගෙවීමේ වට්ටම්ගත වටිනාකම නියෝජනය කරයි. අපේක්ෂිත මුදල් ප්‍රවාහ වාර්තාකරණ දිනයේදී වාරිකමය අනුපාතය භාවිත කරමින් වට්ටම් කෙරේ.

## 22. මුදල් සහ මුදල් සමාන දෑ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

මුදල් හා මුදල් සමාන දෑ අතැති මුදල්, බැංකුවල තැන්පතු සහ ඒක්ෂණ සහ කෙටි කාලීන දැනුම් දීමෙන් ලැබෙන ණයවලින් සමන්විත වන අතර ඒවා ඒවායේ සාධාරණ අගය වෙනස් වීම සම්බන්ධ සැලකිය යුතු නොවන අවදානමකට යටත් වේ. ඒවා සමූහය මගින් සිය කෙටි කාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගැනේ. ඒවා අදාළ අවස්ථාවන්හිදී, ඒවායේ ප්‍රකාශිත වටිනාකම හෝ දළ වටිනාකම අනුව මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කෙරේ. සමූහය මගින් භාවිතය සඳහා නොවන කිසිදු මුදලක් හෝ මුදලට සමාන දෙයක් සමූහයේ සමාගම් මගින් රඳවා ගැනීමක් සිදු නොකෙරිණි.

මුදල් සහ මුදල් සමාන දෑ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරිපත් කෙරේ.

**ප්‍රතිවර්ත්‍ය ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්**

නිශ්චිත අනාගත දිනයකදී නැවත විකිණීම සඳහා වන ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ හඳුනා ගැනේ. සමූහය මගින් ගනුදෙනුවෙහි ආර්ථික වැදගත්කම පිළිබිඹු කරමින් උපචිත පොලියද ඇතුළත්ව, ගෙවන ලද ප්‍රතිෂ්ඨාව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි 'මුදල් හා මුදල් සමාන දෑ' යටතේ වාර්තා කෙරේ. මිලදී ගැනීමේ සහ නැවත විකිණීමේ මිල අතර වෙනස පොලී ආදායමෙහි වාර්තා කෙරෙන අතර සඵල පොලී අනුපාතිකය භාවිත කරමින් ගිවිසුමෙහි කාලසීමාව පුරා උපචිත කෙරේ.

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| අතැති මුදල් | | | 1,004,152 | 1,135,991 | 1,018,947 | 1,157,668 |
| බැංකුවල ශේෂයන් | 22.1 | 262 | 1,748,726 | 1,693,626 | 2,097,659 | 2,202,565 |
| බැංකුවල ඉතුරුම් ගිණුම් | | | 231,172 | 1,339,182 | 338,649 | 1,367,071 |
| විදේශ ව්‍යවහාර මුදල්වලින් ඉතුරුම් තැන්පතු | | | 35 | 31 | 35 | 31 |
| ඒක්ෂණ තැන්පතු | | | 2,860,713 | - | 2,860,713 | - |
| ප්‍රතිවර්ත්‍ය මිලදීගැනීමේ ගිවිසුම් යටතේ සුරැකුම් | | | - | 500,000 | - | 675,252 |
| **එකතුව** | | | 5,844,798 | 4,668,830 | 6,316,003 | 5,402,587 |
| සාධාරණ අගය | | | 5,844,798 | 4,668,830 | 6,316,003 | 5,402,587 |

### 22.1 බැංකුවල ශේෂයන්

| මාර්තු 31 දිනට | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| දේශීය බැංකු | 1,748,726 | 1,693,626 | 2,097,659 | 2,202,565 |
| එකතුව | 1,748,726 | 1,693,626 | 2,097,659 | 2,202,565 |

## 23. බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂයන්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂයන්ට ස්ථාවර තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් වේ. බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ක්‍රමක්ෂය පිරිවැය අනුව දැක්වේ.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **ස්ථාවර තැන්පතු** | | | | |
| දේශීය මුදල් | 29,839,914 | 5,117,866 | 34,171,461 | 9,510,617 |
| විදේශ මුදල් | - | - | 53,456 | 18,901 |
| **එකතුව** | 29,839,914 | 5,117,866 | 34,224,917 | 9,529,518 |
| **සාධාරණ අගය** | 29,900,057 | 5,117,307 | 34,164,468 | 9,492,331 |

## 24. මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමූහය මගින් වෙළඳ ක්‍රියාකාරකම් ඔස්සේ කෙටි කාලීනව ලාභ ඉපැයීම සඳහා මූලිකව මිලදී ගන්නා ලද මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට හඳුනා හඳුනා ගැනේ. ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගය, සාධාරණ අගය අනුව වාර්තා කොට මනිනු ලබන අතර සාධාරණ අගයෙහි වෙනස් වීම් ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ / (අලාභ) - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගය යටතේ හඳුනා ගැනේ.

SLFRS 9 මගින් වත්කම් කළමනාකරණය සඳහා සමාගමෙහි ව්‍යාපාරික ආකෘතිය සහ සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණවල සංයෝගයක් මත පදනම්ව මූල්‍ය සාධන පත්‍රයන් වර්ගීකරණය අවශ්‍ය වේ. ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගය වෙත මූලිකවම කෙටි කාලීන ලාභය සඳහා අත්පත් කරගත් ලැයිස්තුගත හිමිකම් සුරැකුම් ඇතුළත් වන අතර කොළඹ කොටස් වෙළඳපොළ මගින් ප්‍රකාශයට පත් කරන ලද මිල ගණන් භාවිත කරමින් සාධාරණ අගයට වාර්තා කෙරේ.

තවද SLFRS 9 අනුව, ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට හඳුනාගත් මූල්‍ය වත්කම් වෙත වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට සහ ක්‍රමක්ෂය පිරිවැය අනුව වර්ග කළ ඒවා හැර සියලු මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

ගිවිසුමෙහි කොන්දේසි අනුව හෝ ගෙවීම් ලබා ගැනීමේ අයිතිය ස්ථාපනය වූ පසු ලාභාංශ ආදායම හෝ වියදම 'ශුද්ධ වෙළඳ ආදායම්' තුළ වාර්තා කෙරේ.

නුදුරු අනාගතයේදී විකිණීම සම්බන්ධ අරමුණ තවදුරටත් යෝග්‍ය වන්නේද යන්න නිර්ණය කිරීම සඳහා සමූහය මගින් සිය වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට කලඹ ඇගයීමට ලක් කෙරේ. අක්‍රිය වෙළඳපොළ නිසා මෙකී මූල්‍ය වත්කම් විකිණීමට සමූහය අපොහොසත් වන්නේ නම් සහ ඒවා නුදුරු අනාගතයේ දී විකිණීම සඳහා වන කළමනාකාරිත්වයෙහි අදහස සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්, සමූහය මගින් මෙම මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කෙරේ. වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට මූල්‍ය වත්කම්වල සාධාරණ අගය, කොළඹ කොටස් වෙළඳපොළෙන් ලබාගත් මිල ගණන් යොදා ගනිමින් මනිනු ලැබේ.

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | 2023 | 2022 | 2023 | 2022 |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැයිස්තුගත හිමිකම් සුරැකුම් | 24.1 | 264 | 203,975 | 25,140 | 345,093 | 174,801 |
| ඒකක භාරයන්හි ආයෝජන | 24.3 | 265 | - | - | - | 674,497 |
| **එකතුව** | | | 203,975 | 25,140 | 345,093 | 849,298 |
| **සාධාරණ අගය** | | | 203,975 | 25,140 | 345,093 | 849,298 |

## 24. මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට (සබැඳේ)

### 24.1 ලැයිස්තුගත හිමිකම් සුරැකුම්

| මාර්තු 31 දිනට | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් සංඛ්‍යාව | මුළු පිරිවැය | වෙළඳපොළ වටිනාකම | කොටස් සංඛ්‍යාව | මුළු පිරිවැය | වෙළඳපොළ වටිනාකම |
| සමාගම | | රු. '000 | රු. '000 | | රු. '000 | රු. '000 |
| **උපයෝගිතා අංශය** | | | | | | |
| වින්ඩ්ෆෝස් පීඑල්සී | - | - | - | 1,000,000 | 18,489 | 15,900 |
| **උප එකතුව** | - | - | - | - | 18,489 | 15,900 |
| **ප්‍රාග්ධන භාණ්ඩ** | | | | | | |
| ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | 1,364,108 | 188,294 | 190,975 | - | - | - |
| හේමාස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | 200,000 | 14,157 | 13,000 | 200,000 | 14,157 | 9,240 |
| උප එකතුව | - | 202,451 | 203,975 | - | 14,157 | 9,240 |
| **එකතුව** | - | 202,451 | 203,975 | - | 32,646 | 25,140 |
| වෙළඳපොළ ලාභ/(අලාභ) (Mark to market ) | - | 1,524 | - | - | (7,506) | - |
| **හිමිකම් සුරැකුම්වල වෙළඳපොළ වටිනාකම** | - | 203,975 | - | - | 25,140 | - |

| මාර්තු 31 දිනට | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| සමූහය | කොටස් සංඛ්‍යාව | මුළු පිරිවැය | වෙළඳපොළ වටිනාකම | කොටස් සංඛ්‍යාව | මුළු පිරිවැය | වෙළඳපොළ වටිනාකම |
| **ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත කොටස්** | | රු. '000 | රු. '000 | | රු. '000 | රු. '000 |
| **උපයෝගිතා අංශය** | | | | | | |
| වින්ඩ්ෆෝස් පීඑල්සී | - | - | - | 1,000,000 | 18,489 | 15,900 |
| උප එකතුව | - | - | - | - | 18,489 | 15,900 |
| **ප්‍රාග්ධන භාණ්ඩ** | | | | | | |
| ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | 1,364,108 | 188,294 | 190,975 | - | - | - |
| හේමාස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | 200,000 | 14,157 | 13,000 | 200,000 | 14,157 | 9,240 |
| **උප එකතුව** | - | 202,451 | 203,975 | - | 14,157 | 9,240 |
| **බංග්ලාදේශයේ ලැයිස්තුගත කොටස්** | | | | | | |
| බංග්ලාදේශ බ්‍රිටිෂ් ඇමරිකන් ටොබැකෝ | 10,000 | 19,990 | 15,829 | 10,000 | 22,716 | 20,269 |
| සීමාසහිත බර්ගර් පේන්ට්ස් බංග්ලාදේශ සමාගම | 999 | 5,470 | 5,284 | 1,000 | 6,241 | 6,081 |
| බෙක්සිම්කෝ ෆාමා | 12,000 | 7,182 | 5,354 | 12,000 | 8,162 | 7,332 |
| සීමාසහිත BRAC (බ්‍රැක්) බැංකුව | 30,000 | 4,552 | 3,525 | 25,000 | 4,761 | 4,309 |
| සීමාසහිත සිටි බැංකුව | 112,500 | 8,902 | 7,484 | 100,000 | 10,116 | 8,981 |
| සීමාසහිත ඩච් බංග්ලා බැංකුව | 55,000 | 12,543 | 10,507 | 50,000 | 14,253 | 12,912 |
| සීමාසහිත ඊස්ටර්න් බැංකුව | 35,000 | 3,666 | 3,396 | 25,000 | 3,399 | 3,329 |
| සීමාසහිත ග්‍රාමීන්ෆෝන් සමාගම | 28,000 | 29,386 | 24,488 | 17,300 | 22,696 | 19,731 |
| සීමාසහිත මැරිකෝ බංග්ලාදේශ් | 1,000 | 7,567 | 7,389 | 2,000 | 16,416 | 16,334 |
| රෙකිට් බෙන්කිසර් | 390 | 6,171 | 5,666 | 150 | 2,949 | 2,803 |
| සීමාසහිත ග්ලෝබල් ඉස්ලාමී බැංකුව | 413,291 | 12,612 | 11,351 | - | - | - |
| සීමාසහිත රෙනාටා සමාගම | - | - | - | 82 | 376 | 385 |
| සීමාසහිත ස්ක්වෙයාර් ෆාමසූටිකල්ස් සමාගම | 30,000 | 21,644 | 19,207 | 30,000 | 24,595 | 22,814 |
| සමිට් පවර් | 150,000 | 21,948 | 15,563 | 150,000 | 24,940 | 20,276 |
| වොල්ටන් හයි ටෙක් ඉන්ඩස්ට්‍රීස් | 1,900 | 6,398 | 6,075 | 1,100 | 4,350 | 4,105 |
| උප එකතුව | - | 168,031 | 141,118 | - | 165,970 | 149,661 |
| එකතුව | - | 370,481 | 345,093 | - | 198,616 | 174,801 |
| වෙළඳපොළ ලාභ/(අලාභ) (Mark to market ) | - | (25,388) | - | - | (23,815) | - |
| හිමිකම් සුරැකුම්වල වෙළඳපොළ වටිනාකම | - | 345,093 | - | - | 174,801 | - |

### 24.2 හිමිකම් සුරැකුම්වල කර්මාන්ත/ක්ෂේත්‍ර සංයුතිය - සමාගම සහ සමූහය

| මාර්තු 31 දිනට | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| සමාගම | මුළු පිරිවැය | වෙළඳපොළ වටිනාකම | සංයුතිය | මුළු පිරිවැය | වෙළඳපොළ වටිනාකම | සංයුතිය |
| කර්මාන්තය/ක්ෂේත්‍රය | රු. '000 | රු. '000 | % | රු. '000 | රු. '000 | % |
| උපයෝගිතා අංශය | - | - | 0.00% | 18,489 | 15,900 | 63.25% |
| ප්‍රාග්ධන භාණ්ඩ | 202,451 | 203,975 | 100.00% | 14,157 | 9,240 | 36.75% |
| උප එකතුව | 202,451 | 203,975 | 100.00% | 32,646 | 25,140 | 100.00% |
| වෙළඳපොළ ලාභ/(අලාභ) (Mark to market ) | 1,524 | | | (7,506) | | |
| හිමිකම් සුරැකුම්වල වෙළඳපොළ වටිනාකම | 203,975 | | | 25,140 | | |
| **සමූහය** | | | | | | |
| උපයෝගිතා අංශය | - | - | 0.00% | 18,489 | 15,900 | 63.25% |
| ඉදිකිරීම් සහ ඉංජිනේරු | - | - | 0.00% | - | - | 0.00% |
| ප්‍රාග්ධන භාණ්ඩ | 202,451 | 203,975 | 59.11% | 14,157 | 9,240 | 36.75% |
| බංග්ලාදේශයේ ලැයිස්තුගත කොටස් | 168,030 | 141,118 | 40.89% | - | - | 0.00% |
| උප එකතුව | 370,481 | 345,093 | 100.00% | 32,646 | 25,140 | 100.00% |
| වෙළඳපොළ ලාභ/(අලාභ) (Mark to market ) | (25,388) | | | (7,506) | | |
| හිමිකම් සුරැකුම්වල වෙළඳපොළ වටිනාකම | 345,093 | | | 25,140 | | |

මූල්‍ය වත්කම්වල සංවේදීතා විශ්ලේෂණය - FVTPL - හිමිකම් පිටු අංක 347 හි සටහන 56.4.3. හි දැක්වේ.

### 24.3 ඒකක භාරයන්හි ආයෝජන

| මාර්තු 31 දිනට | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | | 2023 | 2022 | | 2023 | 2022 |
| | ඒකක සංඛ්‍යාව | රු. '000 | රු. '000 | ඒකක සංඛ්‍යාව | රු. '000 | රු. '000 |
| එන්ඩීබී වෙල්ත් මනි මාර්කට් ප්ලස් ෆන්ඩ් | - | - | - | 2,052 | - | 51,679 |
| සීඒල් ඉන්වෙස්ට්මන්ට් | - | - | - | 16,805 | - | 362,795 |
| ජේබී වැන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ් | - | - | - | 8,693 | - | 260,023 |
| | | - | - | | - | 674,497 |

### 25. ණය සහ ලැබිය යුතු දේ - ක්‍රමක්ෂය පිරිවැය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

පහත දැක්වෙන දෑ හැරුණු විට, ණය සහ ලැබිය යුතු දෑ වශයෙන් වර්ග කෙරෙන මූල්‍ය වත්කම් ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ ප්‍රකාශයට පත්නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්වලින් සමන්විත වේ.

- සමූහය සහ සමාගම වහාම හෝ නුදුරු කාලයකදී විකිණීමට අදහස් කරන මූල්‍ය වත්කම් සහ මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, ලාභ හෝ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට නම් කෙරෙන මූල්‍ය වත්කම්
- සමූහය සහ සමාගම මගින් මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට වශයෙන් නම් කෙරෙන මූල්‍ය වත්කම්
- ණය පිරිහීම හේතුවෙන් හැරුණු කොට, සමූහය සහ සමාගම මගින් සිය මූලික ආයෝජනය ප්‍රමාණවත් ලෙස සම්පූර්ණයෙන් අයකර ගත නොහැකි මූල්‍ය වත්කම්

'ණය සහ ලැබිය යුතු දෑ' හානිකරණය සඳහා වෙන් කිරීම් අඩු කොට, ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන අත්පත් කර ගැනීමේ ගාස්තු සහ පිරිවැය මත කවර හෝ වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. ක්‍රමක්ෂය, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි පොලී ආදායම් යටතේ ඇතුළත් කෙරේ. හානිකරණයෙන් උද්ගත වන අලාභයන් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ 'ණය සහ ලැබිය යුතු දෑ සහ වෙනත් අලාභ සඳහා වන හානිකරණ ගාස්තු' යටතේ හඳුනා ගැනේ.

**කල්බදු**

කිසියම් විධිවිධානයක් කල්බදු ක්‍රමයක්ද, නැතහොත් එහි කල්බදු ඇතුළත්ද යන්න තීරණය කිරීම, විධිවිධානයේ හරය මත පදනම් වන අතර, විධිවිධානය ඉටු කිරීම නිශ්චිත වත්කමක් හෝ වත්කමක් භාවිත කිරීම මත රඳා පවතීද යන්න තක්සේරු කිරීම අවශ්‍ය වේ. මෙම විධිවිධානය මගින් වත්කම භාවිත කිරීමේ අයිතිය පැවරේ.

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

**සමූහය/සමාගම බදු ගැනුම්කරු ලෙස**

කල්බදු අයිතමයන්හි හිමිකාරිත්වයට අනන්‍ය වූ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සමූහය/සමාගම වෙත පවරනු නොලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කර ඇත. මෙහෙයුම් කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල මාර්ගික පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි වියදමක් වශයෙන් හඳුනා ගැනේ. ගෙවිය යුතු අසම්භාව්‍ය කුලිය ඒවා දරන ලද කාලපරිච්ඡේදයෙහිදී වියදමක් වශයෙන් හඳුනා ගැනේ.

**සමූහය/සමාගම බදු දීමනාකරු ලෙස**

වත්කමෙහි හිමිකාරිත්වයට අනන්‍ය වූ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සමූහය/සමාගම විසින් පවරනු නොලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කර ඇත. මෙහෙයුම් කල්බදු සාකච්ඡා කිරීමේදී ආරම්භක සෘජු පිරිවැය කල්බදු වත්කමෙහි ධාරණ අගයට එකතු කරනු ලබන අතර කුලී ආදායමට සමාන පදනමක් මත කල්බදු කාල සීමාව තුළ හඳුනා ගැනේ. ගෙවිය යුතු අසම්භාව්‍ය කුලිය ඒවා උපයන ලද කාලපරිච්ඡේදයෙහිදී ආදායමක් වශයෙන් හඳුනා ගැනේ.

**කල්බදු, කුලී පිට ගැණුම් සහ ඉස්ලාමීය මූල්‍ය මත ලැබිය යුතු දෑ**

SLFRS 16 අනුව, පාදක වන වත්කමකට අදාළව සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණාත්මක වශයෙන් පවරනු ලබන කල්බදු මූල්‍ය කල්බදු වශයෙන් වර්ග කෙරේ. ආරම්භක දිනයේදී, සමූහය මඟින් මූල්‍ය කල්බදු යටතේ රඳවා ගත් වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන අතර ඒවා ශුද්ධ ආයෝජනයෙහි වටිනාකමට සමානව ලැබිය යුතු කල්බදු වශයෙන් ඉදිරිපත් කෙරේ. ශුද්ධ ආයෝජනය ගණනය කරනු ලබන්නේ කල්බදුවල අන්තර්ගත අනුපාතය අනුව ලැබිය යුතු කල්බදු ගෙවීම් වට්ටම් කිරීමෙනි. එනම්, පාදක වන වත්කමෙහි සාධාරණ අගය සහ මූලික සෘජු පිරිවැයට සමාන කල් බදු ගෙවීම්වල ප්‍රවර්තන වටිනාකමට හේතුවන අනුපාතය වේ. කල්බදුවල ශුද්ධ ආයෝජනය මත අඛණ්ඩ අනුපාතික අදායමක් අත්පත් කර ගැනීම සඳහා ලැබිය යුතු මූල්‍ය ආදායම කල්බදු කාල සීමාව පුරා ''පොලී ආදායමෙහි'' හඳුනා ගැනේ.

**කාර්ය මණ්ඩල ණයවල පළමු දින වෙනස**

වෙළඳපොළ පොලී අනුපාතවලට වඩා අඩුවෙන් ලබා දෙන සියලුම කාර්ය මණ්ඩල ණය සාධාරණ වටිනාකමින් හඳුනාගනු ලැබිණි. සාධාරණ අගය සහ පිරිනමන ලද මුදල අතර වෙනස පළමු දින වෙනස වශයෙන් සැලකෙන අතර එය සඵල පොලී අනුපාතිකය භාවිත කරමින් ණය කාලසීමාව පුරා කාර්යමණ්ඩල පිරිවැය වශයෙන් ක්‍රමක්ෂය කෙරේ. කාර්ය මණ්ඩල ණය පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. පිටු අංක 289 හි සටහන 31.2 බලන්න.

**නැවත සාකච්ඡා කරන ලද ණය සහ ලැබිය යුතු දෑ**

හැකි අවස්ථාවන්හිදී, සමූහය/සමාගම ඇපය රඳවා ගැනීමට වඩා ණය සහ ලැබිය යුතු දෑ ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරයි. මෙයට ගෙවීමේ කටයුතු දීර්ඝ කිරීම් සහ නව ලැබීමේ කොන්දේසි වෙත එකඟවීම ඇතුළත් වේ. කොන්දේසි නැවත සාකච්ඡා කිරීමෙන් අනතුරුව, කවර හෝ හානිකරණයක් මුල් සඵල පොලී අනුපාතිකය භාවිත කරමින් මනිනු ලබන අතර, කොන්දේසි නවීකරණය කිරීමට පෙර ගණනය කර ලැබිය යුතු දෑ තව තවදුරටත් හිඟ වශයෙන් නොසැලකේ. සමස්ත ක්‍රියාපටිපාටිය සපුරාලන ලද බවට සහ අනාගත ගෙවීම් සිදුවිය හැකි බවට තහවුරු කරනු පිණිස කළමනාකාරිත්වය විසින් නැවත සාකච්ඡා කරන ලද ණය සහ ලැබිය යුතු දේ අඛණ්ඩව සමාලෝචනය කරයි. ලැබිය යුතු දෑ අඛණ්ඩවම කවර හෝ ක්‍රියාපටිපාටියකට යටත් වන අතර අනාගත ගෙවීම් සිදුවිය හැකි වේ. ණය සහ ලැබිය යුතු දෑ අඛණ්ඩවම ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලබන අතර එහිදී සඵල පොලී අනුපාතිකය භාවිත කෙරෙන අතර එය තේවල හෝ සාමූහික හානිකරණ තක්සේරුවකට යටත් වේ.

**ගනුදෙනුකරුවන් වෙත ණය සහ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වෙන්කිරීම**

ගනුදෙනුකරුවන් වෙත වන ණය සහ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වෙන්කිරීම පිළිබඳ විස්තර පිටු අංක 270 හි සටහන 25.7 හි දැක්වේ.

**හානිකරණ ප්‍රතිවර්තනය**

පසු කාලසීමාවකදී හානිකරණ අලාභ වටිනාකම පහළ යන්නේ නම්, සහ අදාළ පහළයාම හානිකරණය හඳුනා ගැනීමෙන් පසු සිදුවීමකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම්, අදාළ පරිදි හානිකරණ වෙන්කිරීම අඩු කිරීම මඟින් අතිරික්තය ආපසු ලියා තබනු ලැබේ. අදාළ ආපසු ලියා තැබීම ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

**කපා හරින ලද ණය සහ ලැබිය යුතු දෑ**

අයකර ගැනීමේ ප්‍රායෝගික මාර්ගයක් නොමැති වූ කළ ණය හා ලැබිය යුතු දෑ (කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්) කපා හැරේ. මෙය සාමාන්‍යයෙන් සිදු වන්නේ ණයගැතියා හට කපාහැරීමට යටත් වන මුදල් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ උපදවා ගැනීම සඳහා වත්කම් හෝ ආදායම් මූලයන් නොමැති බවට සමූහය නිර්ණය කිරීමෙන් පසුවය. කෙසේ වුවද, හිඟ මුදල් අයකර ගැනීමට සමූහයෙහි ක්‍රියාපටිපාටීන්ට අනුගත වීම සඳහා කපා හරින ලද මූල්‍ය වත්කම් වුවද නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට යටත් විය හැක.

| | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| මාර්තු 31 දිනට | | පිටු | 2023 | 2022 | 2023 | 2022 |
| | සටහන | අංකය | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ණය සහ ලැබිය යුතු දෑ | 25.1.2 | 268 | 124,687,201 | 161,162,024 | 136,885,374 | 174,162,982 |
| **(අඩුකිරීම)** | | | | | | |
| තනි හානිකරණ ගාස්තු | 25.7 | 277 | 2,145,506 | 1,655,462 | 2,145,506 | 1,655,462 |
| සාමූහික හානිකරණ ගාස්තු | 25.7 | 277 | 8,263,750 | 8,232,108 | 9,361,964 | 9,186,674 |
| ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ | | | 114,277,945 | 151,274,454 | 125,377,904 | 163,320,846 |
| සාධාරණ අගය | | | 122,796,426 | 161,878,020 | 135,077,403 | 174,545,177 |

## 25.1 විශ්ලේෂණය

### 25.1.1 අදියර වශයෙන් විශ්ලේෂණය

සමාගම

| 2023 මාර්තු 31 දිනට | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| ණය සහ ලැබිය යුතු දෑ | 92,643,506 | 14,701,075 | 17,342,620 | 124,687,201 |
| (අඩුකිරීම) | | | | |
| තනි හානිකරණ ගාස්තු | - | - | 2,145,506 | 2,145,506 |
| සාමූහික හානිකරණ ගාස්තු | 908,537 | 823,233 | 6,531,980 | 8,263,750 |
| ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ | 91,734,969 | 13,877,842 | 8,665,134 | 114,277,945 |

| 2022 මාර්තු 31 දිනට | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| ණය සහ ලැබිය යුතු දෑ | 124,054,490 | 16,207,503 | 20,900,031 | 161,162,024 |
| (අඩුකිරීම) | | | | |
| තනි හානිකරණ ගාස්තු | - | - | 1,655,462 | 1,655,462 |
| සාමූහික හානිකරණ ගාස්තු | 1,338,223 | 891,126 | 6,002,759 | 8,232,108 |
| ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ | 122,716,267 | 15,316,377 | 13,241,810 | 151,274,454 |

සමූහය

| 2023 මාර්තු 31 දිනට | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| ණය සහ ලැබිය යුතු දෑ | 100,865,905 | 17,257,359 | 18,762,110 | 136,885,374 |
| (අඩුකිරීම) | | | | |
| තනි හානිකරණ ගාස්තු | - | - | 2,145,506 | 2,145,506 |
| සාමූහික හානිකරණ ගාස්තු | 1,252,668 | 1,153,917 | 6,955,379 | 9,361,964 |
| ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ | 99,613,237 | 16,103,442 | 9,661,225 | 125,377,904 |

| 2022 මාර්තු 31 දිනට | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| ණය සහ ලැබිය යුතු දෑ | 134,631,929 | 17,272,072 | 22,258,981 | 174,162,982 |
| (අඩුකිරීම) | | | | |
| තනි හානිකරණ ගාස්තු | - | - | 1,655,462 | 1,655,462 |
| සාමූහික හානිකරණ ගාස්තු | 1,745,742 | 1,036,189 | 6,404,743 | 9,186,674 |
| ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ | 132,886,187 | 16,235,883 | 14,198,776 | 163,320,846 |

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

### 25.1.2 නිෂ්පාදනය වශයෙන් විශ්ලේෂණය

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදනය අනුව** | | | | | | |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 25.4.1/25.5.1 | 271/273 | 55,764,729 | 76,836,170 | 55,759,186 | 76,827,955 |
| ලැබිය යුතු කුලී පිට ගැණුම්/මුරාබා | 25.4.2/25.5.2 | 271/273 | 196,060 | 204,339 | 2,918,779 | 3,532,661 |
| කාලීන ණය සහ ලැබිය යුතු දෑ | 25.4.3/25.5.3 | 272/274 | 67,089,647 | 82,658,604 | 78,207,409 | 93,802,366 |
| සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු දේ | 25.2 | 269 | 1,636,765 | 1,462,911 | - | - |
| දළ එකතුව | | | 124,687,201 | 161,162,024 | 136,885,374 | 174,162,982 |

### 25.1.3 මුදල් ඒකකය අනුව විශ්ලේෂණය

| මාර්තු 31 දිනට | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් | 124,687,201 | 161,162,024 | 125,832,413 | 163,098,987 |
| බංග්ලාදේශ ටකා | - | - | 11,052,961 | 11,063,995 |
| දළ එකතුව | 124,687,201 | 161,162,024 | 136,885,374 | 174,162,982 |

### 25.1.4 කර්මාන්තය අනුව විශ්ලේෂණය

| මාර්තු 31 දිනට | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික, වන වගා සහ ධීවර | 27,151,036 | 32,571,677 | 27,709,320 | 33,958,216 |
| කලා, රසවින්දන සහ විනෝදාස්වාද | 954,545 | 1,314,458 | 956,091 | 1,314,458 |
| ඉදිකිරීම්, යටිතල පහසුකම් සංවර්ධන | 8,528,731 | 9,797,912 | 9,433,072 | 10,631,366 |
| පරිභෝජන | 8,013,864 | 8,618,671 | 8,781,028 | 10,188,492 |
| අධ්‍යාපන | 1,707,696 | 2,090,854 | 1,707,696 | 2,090,854 |
| මූල්‍ය සේවා | 8,776,851 | 10,787,171 | 12,776,951 | 10,719,757 |
| සෞඛ්‍ය, සමාජ සේවා සහ සහායක සේවා | 7,354,251 | 9,010,963 | 9,185,041 | 11,498,386 |
| තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන | 1,304,974 | 1,726,877 | 1,399,371 | 1,968,838 |
| නිෂ්පාදන | 7,247,716 | 9,441,731 | 10,617,109 | 14,135,330 |
| වෘත්තීය, විද්‍යාත්මක සහ තාක්ෂණික සේවා | 10,064,883 | 13,558,688 | 10,069,976 | 14,364,143 |
| සංචාරක | 2,689,999 | 3,314,785 | 2,699,305 | 3,328,350 |
| ප්‍රවාහන සහ ගබඩා | 24,861,237 | 35,116,000 | 24,989,315 | 35,254,791 |
| තොග සහ සිල්ලර වෙළඳාම | 14,994,171 | 20,787,613 | 15,481,123 | 21,336,335 |
| වෙනත් | 1,037,247 | 3,024,624 | 1,079,976 | 3,373,666 |
| දළ එකතුව | 124,687,201 | 161,162,024 | 136,885,374 | 174,162,982 |

## 25.2 සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු දෑ

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 රු. '000 | 2022 රු. '000 | 2023 රු. '000 | 2022 රු. '000 |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | 528,249 | 560,310 | - | - |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 1,320 | 3,528 | - | - |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | 1,043,582 | 835,187 | - | - |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | 10,405 | 1,495 | - | - |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 26,589 | 35,236 | - | - |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | 26,620 | 27,155 | - | - |
| එකතුව | 1,636,765 | 1,462,911 | - | - |

## 25.3 වසර තුළ දළ ණය සහ ලැබිය යුතු දෑ හි වෙනස්වීම

2022/23 දළ ණය සහ ලැබිය යුතු දෑ හි වෙනස්වීම - සමාගම

| | අදියර 1 රු. '000 | අදියර 2 රු. '000 | අදියර 3 රු. '000 | අදියර 4 රු. '000 |
|---|---|---|---|---|
| 2022 අප්‍රේල් 1 දිනට දළ ධාරණ වටිනාකම | 124,054,490 | 16,207,503 | 20,900,031 | 161,162,024 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 24,572,528 | 361,926 | 77,170 | 25,011,624 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපාහැරීම් හැර) | (47,358,272) | (7,465,019) | (6,656,062) | (61,479,353) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (14,813,857) | 9,470,397 | 5,343,460 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 4,048,153 | (5,547,139) | 1,498,986 | - |
| අදියර 2 සහ 2 වෙත මාරුකිරීම් | 2,140,464 | 1,673,407 | (3,813,871) | - |
| කපා හරින ලද වටිනාකම් | - | - | (7,094) | (7,094) |
| 2023 මාර්තු 31 දිනට දළ ධාරණ වටිනාකම | 92,643,506 | 14,701,075 | 17,342,620 | 124,687,201 |

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

**දළ ණය සහ ලැබීම්වල වෙනස්වීම 2021/22 - සමාගම**

| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| 2021 අප්‍රේල් 1 දිනට දළ ධාරණ අගය | 91,721,453 | 30,256,132 | 28,678,260 | 150,655,845 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 65,130,966 | 1,874,077 | 1,211,963 | 68,217,006 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපාහැරීම් හැර) | (37,547,489) | (10,439,345) | (9,718,930) | (57,705,764) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (8,524,274) | 6,540,158 | 1,984,116 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 9,306,431 | (13,243,054) | 3,936,623 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 3,967,403 | 1,219,535 | (5,186,938) | - |
| කපාහැරි ප්‍රමාණය | - | - | (5,063) | (5,063) |
| 2022 මාර්තු 31 දිනට දළ ධාරණ අගය | 124,054,490 | 16,207,503 | 20,900,031 | 161,162,024 |

**දළ ණය සහ ලැබීම්වල වෙනස්වීම 2022/23 - සමූහය**

| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| 2022 අප්‍රේල් 1 දිනට දළ ධාරණ අගය | 134,631,929 | 17,272,072 | 22,258,981 | 174,162,982 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 31,727,096 | 1,085,962 | 82,391 | 32,895,449 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපාහැරීම් හැර) | (56,107,111) | (6,223,770) | (6,319,132) | (68,650,012) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (15,110,134) | 9,659,805 | 5,450,329 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 4,452,968 | (6,101,853) | 1,648,885 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 2,354,510 | 1,840,748 | (4,195,258) | - |
| කපාහැරි ප්‍රමාණය | | | (15,922) | (15,922) |
| විදේශ විනිමය ගැළපුම් | (1,083,353) | (275,605) | (148,164) | (1,507,122) |
| 2023 මාර්තු 31 දිනට දළ ධාරණ අගය | 100,865,905 | 17,257,359 | 18,762,110 | 136,885,374 |

**ණය සහ ලැබීම්වල වෙනස්වීම 2021/22 - සමූහය**

| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| 2021 අප්‍රේල් 1 දිනට දළ ධාරණ අගය | 92,517,093 | 35,084,515 | 31,622,920 | 159,224,528 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 74,010,141 | 2,035,752 | 1,377,459 | 77,423,352 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපාහැරීම් හැර) | (40,640,670) | (13,175,141) | (11,751,547) | (65,567,358) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (8,694,759) | 6,690,802 | 2,003,957 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 10,237,076 | (13,976,868) | 3,739,792 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 4,364,143 | 563,448 | (4,927,591) | - |
| කපාහැරි ප්‍රමාණය | - | - | (5,063) | (5,063) |
| විදේශ විනිමය ගැළපුම් | 2,838,904 | 49,564 | 199,054 | 3,087,522 |
| 2022 මාර්තු 31 දිනට දළ ධාරණ අගය | 134,631,929 | 17,272,072 | 22,258,981 | 174,162,982 |

## 25.4 ඉතිරි ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය - සමාගම

### 25.4.1 ලැබිය යුතු කල්බදු/ඉජාරා

| මාර්තු 31 දිනට | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු දළ කුලී | 34,877,887 | 33,566,958 | 35,300 | 68,480,145 | 40,144,122 | 55,166,643 | 143,004 | 95,453,768 |
| අඩු කිරීම: නොඉපැයූ ආදායම | 7,634,808 | 5,078,328 | 1,477 | 12,714,613 | 9,383,677 | 9,225,344 | 6,816 | 18,615,836 |
| ලැබිය යුතු ශුද්ධ කුලී | 27,243,079 | 28,488,630 | 33,823 | 55,765,532 | 30,760,445 | 45,941,299 | 136,189 | 76,837,932 |
| අඩු කිරීම: කල්තබා ලද කුලී | | | | 803 | | | | 1,762 |
| හානිකරණ වෙන්කිරීමට පෙර ලැබිය යුතු කල්බදු/ඉජාරා ලැබීම් | | | | 55,764,729 | | | | 76,836,170 |
| අඩු කිරීම: හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | - | | | | - |
| අදියර 2 | | | | - | | | | - |
| අදියර 3 | | | | - | | | | - |
| මුළු කේවල හානිකරණය | | | | - | | | | - |
| සාමූහික හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | 622,874 | | | | 831,062 |
| අදියර 2 | | | | 559,881 | | | | 643,743 |
| අදියර 3 | | | | 2,438,367 | | | | 2,323,037 |
| මුළු සාමූහික හානිකරණය | | | | 3,621,122 | | | | 3,797,842 |
| මුළු ලැබිය යුතු ශුද්ධ කුලී | 27,243,079 | 28,488,630 | 33,823 | 52,143,607 | 30,760,445 | 45,941,298 | 136,189 | 73,038,328 |

### 25.4.2 ලැබිය යුතු කුලී පිට ගැණුම්/මුරාබා

| මාර්තු 31 දිනට | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු දළ කුලී | 207,793 | 3,211 | - | 211,004 | 213,214 | 6,822 | - | 220,036 |
| අඩු කිරීම: නොඉපැයූ ආදායම | 14,705 | 65 | - | 14,770 | 15,345 | 178 | - | 15,523 |
| ලැබිය යුතු ශුද්ධ කුලී | 193,088 | 3,146 | - | 196,234 | 197,869 | 6,644 | - | 204,513 |
| අඩු කිරීම: කල්තබා ලද කුලී | | | | 174 | | | | 174 |
| හානිකරණ වෙන්කිරීමට පෙර ලැබිය යුතු කල්බදු/ඉජාරා ලැබීම් | | | | 196,060 | | | | 204,339 |
| අඩු කිරීම: හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | - | | | | - |
| අදියර 2 | | | | - | | | | - |
| අදියර 3 | | | | - | | | | - |
| මුළු කේවල හානිකරණය | | | | - | | | | - |
| සාමූහික හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | 81 | | | | 23 |
| අදියර 2 | | | | - | | | | 223 |
| අදියර 3 | | | | 188,440 | | | | 190,140 |
| මුළු සාමූහික හානිකරණය | | | | 188,521 | | | | 190,386 |
| මුළු ලැබිය යුතු ශුද්ධ කුලී | 193,088 | 3,146 | - | 7,539 | 197,869 | 6,644 | - | 13,953 |

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

### 25.4.3 කාලසීමා ණය සහ ලැබිය යුතු දෑ

| මාර්තු 31 දිනට | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| මෝටර් වාහන ණය | 12,132,928 | 18,250,910 | 41,723 | 30,425,561 | 15,038,440 | 31,941,065 | 187,072 | 47,166,577 |
| කෙටි හා මධ්‍යම ණය | 4,960,282 | 3,555,325 | 43,594 | 8,559,201 | 5,096,841 | 5,308,971 | 100,925 | 10,506,738 |
| පැහැදිළි පදනම් ණය තොග | 836,317 | 29,316 | - | 865,633 | 830,176 | 64,652 | - | 894,828 |
| සෙල්ෆ් ර්කෑෂ් ණය | 3,465,791 | 1,606,759 | - | 5,072,551 | 2,315,513 | 598,809 | - | 2,914,322 |
| ෆාස්ට් ට්‍රැක් ණය | 896,100 | 92,235 | - | 988,335 | 2,020,498 | 605,689 | - | 2,626,187 |
| වෙළඳ මුරාබා | 181,068 | 22,846 | 45,535 | 249,449 | 248,779 | 59,022 | - | 307,800 |
| මුෂාරකා | 1,136,527 | 1,435,060 | 8,052 | 2,579,639 | 1,491,411 | 2,744,510 | 27,526 | 4,263,447 |
| රන් ණය | 9,194,726 | - | - | 9,194,726 | 2,658,471 | - | - | 2,658,471 |
| සාධකකරණ ලැබීම් | 1,507,410 | - | - | 1,507,410 | 2,111,469 | - | - | 2,111,469 |
| ආන්තික වෙළඳාම | 6,632,491 | - | - | 6,632,491 | 8,387,793 | - | - | 8,387,793 |
| කර්ය මණ්ඩල ණය | 180,883 | 454,141 | 192,458 | 827,481 | 192,171 | 418,747 | 2,993 | 613,911 |
| වෙනත් ණය | 164,157 | 23,312 | - | 187,470 | 184,773 | 23,106 | - | 207,879 |
| අඩු කිරීම: පෙරදයක කුලිය | (300) | - | - | (300) | (819) | - | - | (819) |
| හානිකරණ වෙන්කිරීමට පෙර ලැබිය යුතු ණය | 41,288,381 | 25,469,904 | 331,362 | 67,089,647 | 40,575,517 | 41,764,571 | 318,517 | 82,658,604 |
| | | | | | | | | |
| අඩු කිරීම: හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | - | | | | - |
| අදියර 2 | | | | - | | | | - |
| අදියර 3 | | | | 2,145,506 | | | | 1,655,462 |
| මුළු කේවල හානිකරණය | | | | 2,145,506 | | | | 1,655,462 |
| | | | | | | | | |
| සාමූහික හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | 285,582 | | | | 507,138 |
| අදියර 2 | | | | 263,352 | | | | 247,160 |
| අදියර 3 | | | | 3,905,173 | | | | 3,489,582 |
| මුළු සාමූහික හානිකරණය | | | | 4,454,107 | | | | 4,243,880 |
| මුළු ලැබිය යුතු ශුද්ධ කුලී | 41,288,381 | 25,469,904 | 331,362 | 60,490,034 | 40,575,517 | 41,764,571 | 318,517 | 76,759,262 |

## 25.5 අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය (සමූහය)

### 25.5.1 ලැබිය යුතු කල්බදු/ඉජාරා

| මාර්තු 31 දිනට | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු දළ කුලී | 34,876,040 | 33,560,590 | 35,301 | 68,471,931 | 40,142,275 | 55,160,275 | 143,004 | 95,445,554 |
| අඩු කිරීම: නොඉපැයූ ආදායම | 7,635,488 | 5,077,648 | 1,477 | 12,714,613 | 9,384,357 | 9,224,664 | 6,816 | 18,615,837 |
| ලැබිය යුතු ශුද්ධ කුලී | 27,240,552 | 28,482,942 | 33,824 | 55,757,318 | 30,757,918 | 45,935,611 | 136,188 | 76,829,717 |
| අඩු කිරීම: කල්තබා ලද කුලී | | | | 803 | | | | 1,762 |
| හානිකරණ වෙන්කිරීමට පෙර ලැබිය යුතු කල්බදු/ඉජාරා ලැබීම් | | | | 55,756,515 | | | | 76,827,955 |
| අඩු කිරීම: හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | - | | | | - |
| අදියර 2 | | | | - | | | | - |
| අදියර 3 | | | | - | | | | - |
| මුළු කේවල හානිකරණය | | | | - | | | | - |
| සාමූහික හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | 622,874 | | | | 831,062 |
| අදියර 2 | | | | 559,881 | | | | 643,743 |
| අදියර 3 | | | | 2,438,367 | | | | 2,323,037 |
| මුළු සාමූහික හානිකරණය | | | | 3,621,122 | | | | 3,797,842 |
| මුළු ලැබිය යුතු ශුද්ධ කුලී | 27,240,552 | 28,482,942 | 33,824 | 52,135,393 | 30,757,918 | 45,935,611 | 136,188 | 73,030,113 |

### 25.5.2 ලැබිය යුතු කුලී පිට ගැණුම් /මුරාබා

| මාර්තු 31 දිනට | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු දළ කුලී | 1,779,431 | 2,177,218 | - | 3,956,649 | 1,958,654 | 2,911,695 | - | 4,870,349 |
| අඩු කිරීම: නොඉපැයූ ආදායම | 536,448 | 501,248 | - | 1,037,696 | 630,350 | 707,164 | - | 1,337,514 |
| ලැබිය යුතු ශුද්ධ කුලී | 1,242,983 | 1,675,970 | - | 2,918,953 | 1,328,304 | 2,204,531 | - | 3,532,835 |
| අඩු කිරීම: කල්තබා ලද කුලී | | | | 174 | | | | 174 |
| හානිකරණ වෙන්කිරීමට පෙර ලැබිය යුතු කුලී පිට ගැණුම්/මුරාබා | | | | 2,918,779 | | | | 3,532,661 |
| අඩු කිරීම: හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | - | | | | - |
| අදියර 2 | | | | - | | | | - |
| අදියර 3 | | | | - | | | | - |
| මුළු කේවල හානිකරණය | | | | - | | | | - |
| සාමූහික හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | 86,167 | | | | 115,814 |
| අදියර 2 | | | | 92,156 | | | | 121,038 |
| අදියර 3 | | | | 326,611 | | | | 414,438 |
| මුළු සාමූහික හානිකරණය | | | | 504,934 | | | | 651,289 |
| මුළු ලැබිය යුතු ශුද්ධ කුලී | 1,242,983 | 1,675,970 | - | 2,413,845 | 1,328,304 | 2,204,531 | - | 2,881,372 |

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

### 25.5.3 කාලසීමා ණය සහ ලැබිය යුතු දෑ

| මාර්තු 31 දිනට | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව | එක් වසරක් තුළ | වසර 1 - 5 | වසර 5 ට වැඩි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| මෝටර් වාහන ණය | 12,132,928 | 18,250,910 | 41,723 | 30,425,561 | 15,038,440 | 31,941,065 | 187,072 | 47,166,578 |
| කෙටි හා මධ්‍යම ණය | 9,664,686 | 9,326,044 | 639,014 | 19,629,744 | 11,284,774 | 9,631,763 | 733,961 | 21,650,499 |
| පැහැදිළි පදනම් ණය තොග | 836,317 | 29,316 | - | 865,633 | 830,176 | 64,652 | - | 894,828 |
| සෙල්ෆ් ඊකැෂ් ණය | 3,465,791 | 1,606,759 | - | 5,072,551 | 2,315,513 | 598,809 | - | 2,914,322 |
| ෆාස්ට් ට්‍රැක් ණය | 896,100 | 92,235 | - | 988,335 | 2,020,498 | 605,689 | - | 2,626,187 |
| වෙළඳ මුරාබා | 181,068 | 22,846 | 45,535 | 249,449 | 248,779 | 59,022 | - | 307,800 |
| මුෂාරකා | 1,136,527 | 1,435,060 | 8,052 | 2,579,639 | 1,491,411 | 2,744,510 | 27,526 | 4,263,447 |
| රන් ණය | 9,194,726 | - | - | 9,194,726 | 2,658,471 | - | - | 2,658,471 |
| සාධකකරණ ලැබීම් | 1,507,410 | - | - | 1,507,410 | 2,111,469 | - | - | 2,111,469 |
| ආන්තික වෙළඳාම | 6,632,491 | - | - | 6,632,491 | 8,387,793 | - | - | 8,387,793 |
| කර්ය මණ්ඩල ණය | 191,331 | 479,967 | 203,403 | 874,700 | 192,171 | 418,747 | 2,993 | 613,911 |
| වෙනත් ණය | 164,157 | 23,312 | - | 187,470 | 184,773 | 23,106 | - | 207,879 |
| අඩු කිරීම: පෙරගෙවූ කුලිය | (300) | - | - | (300) | (819) | - | - | (819) |
| හානිකරණ වෙන්කිරීමට පෙර ලැබිය යුතු ණය | 46,003,233 | 31,266,450 | 937,727 | 78,207,409 | 46,763,450 | 46,087,363 | 951,553 | 93,802,366 |
| | | | | | | | | |
| අඩු කිරීම: හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | - | | | | - |
| අදියර 2 | | | | - | | | | - |
| අදියර 3 | | | | 2,145,506 | | | | 1,655,462 |
| මුළු කේවල හානිකරණය | | | | 2,145,506 | | | | 1,655,462 |
| | | | | | | | | |
| සාමූහික හානිකරණය | | | | | | | | |
| අදියර 1 | | | | 543,627 | | | | 798,866 |
| අදියර 2 | | | | 501,880 | | | | 271,408 |
| අදියර 3 | | | | 4,190,401 | | | | 3,667,268 |
| මුළු සාමූහික හානිකරණය | | | | 5,235,908 | | | | 4,737,542 |
| මුළු ලැබිය යුතු ශුද්ධ කුලී | 46,003,233 | 31,266,450 | 937,727 | 70,825,995 | 46,763,450 | 46,087,363 | 951,553 | 87,409,362 |

## 25.6 ගනුදෙනුකරුවන් වෙත වන ණය සහ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වෙන්කිරීම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

SLFRS 9 අනුව, සමූහය මඟින් ණය සහ අත්තිකාරම් සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා වෙන්කිරීමක් වාර්තා කෙරේ.

**තනි තනිව හානිකරණය**

සමූහය මඟින් හානිකරණය සම්බන්ධ කවර හෝ සලකුණක් පවතීද යන්න නිර්ණය කිරීම සඳහා සැලකිය යුතු ගනුදෙනුකාර නිරාවරණය වෙන වෙනම ඇගැයීමට ලක් කෙරේ. අලාභ සම්බන්ධ වාස්තවික සාක්ෂි සහිත ණය අදියර 3 යටතේ වර්ග කෙරෙයි. ආරම්භයේ සිට සැලකිය යුතු ණය පිරිහීමක් සිදුවීද යන්න නිර්ණය කිරීම සඳහා පහත දැක්වෙන විශේෂිත ක්‍රියාපටිපාටිය යටතේ තනි තනිව වශයෙන් සැලකිය යුතු වටිනාකමක් සහිත නමුත් හානිකරණය නොවූ ණය අදියර 1 හෝ අදියර 2 තුළ හානිකරණය සඳහා සාමූහිකව ඇගයීමට ලක් කෙරේ.

**සාමූහික හානිකරණය**

පහත දැක්වෙන කරුණු හේතුවෙන් සාමූහික හානිකරණ වෙන්කිරීමක් ස්ථාපනය කොට ඇත.

- තනි තනිව වශයෙන් සැලකිය යුතු ලෙස නොසැලකෙන සමාන ආකාරයේ ණය සහ අත්තිකාරම් කාණ්ඩයන්; සහ
- තනි තනිව වශයෙන් සැලකිය යුතු ලෙස ගැනෙන නමුත් තනි තනිව වශයෙන් හානිකරණය වූ බවට හඳුනා නොගත් වත්කම් කාණ්ඩයන්

SLFRS 9 - අනුව, සමූහයේ අපේක්ෂිත ණය අලාභ (ECL) ගණනය කිරීම් යනු විචල්‍ය යෙදවුම් තේරීම සහ ඒවායේ අන්‍යෝන්‍යතාවන් සඳහා පාදක වූ උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ ආකෘතිවල ප්‍රතිදානයන් වේ. ගිණුම්කරණ විනිසුම් සහ ඇස්තමේන්තු ලෙස සලකනු ලබන අපේක්ෂිත ණය අලාභයන්හි මූලිකාංගවලට ඇතුළත් වන්නේ:

- ණය අවදානම් හි සැලකිය යුතු ඉහළ යාමක් පවතීද යන්න තීරණය කිරීම සඳහා සමූහයට ගුණාත්මක ඇගයුම් ක්‍රියාවලියක් පවතින අතර එසේ අවදානමක් පවතී නම් මූල්‍ය වත්කම් සඳහා ජීව කාල ණය අලාභ (LTECL) පදනමක් මත වෙන්කිරීම් සිදු කෙරේ:
- ඒවායේ අපේක්ෂිත ණය අලාභ (ECL) සාමූහිකව ඇගයුමට ලක් කිරීමේදී මූල්‍ය වත්කම් කාණ්ඩකරණය සිදු කෙරේ:
- විවිධ සංඛ්‍යාලේඛණමය ක්‍රමවේද සහ යෙදවුම් වරණයන් ඇතුළුව අපේක්ෂිත ණය අලාභ සැකසීම
- දළ දේශීය නිෂ්පාදිතය, උද්ධමනය, පොලී අනුපාත, විනිමය අනුපාත සහ විරැකියාව වැනි සාර්ව ආර්ථික සාධක අතර සම්බන්ධය සහ පැහැර හැරීමේ සම්භාවිතාව (PD), පැහැර හැරීම් කෙරෙහි නිරාවරණය (EAD) සහ අලාභ ගෙනදුන් පැහැර හැරීම (LGD) කෙරෙහි ඒවාහි බලපෑම නිර්ණය කිරීම;
- අපේක්ෂිත ණය අලාභ ආකෘතීන් වෙත ආර්ථික යෙදවුම් උකහා ගැනීමේදී ඉදිරි දැකුම් සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ඒවායේ බර තැබීමේ සම්භාවිතාවන් තෝරා ගැනීම

සමූහය මඟින් මූල්‍ය සාධන පත්‍රයෙහි අවශේෂ ජීව කාලය තුළ පැහැර හැරීමේ අවදානමක් සිදුවීමේ අවදානමෙහි වෙනස සැලකිල්ලට ගනිමින්, මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය සාධන පත්‍රයක ණය අවදානම සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් ඇති දැයි පරීක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපනය කොට ඇත. SLFRS 9 මඟින් මූලික හඳුනා ගැනීමේ සිට ණය ගුණාත්මකභාවයේ වෙනස්වීම් මත පදනම් වූ හානිකරණය සඳහා අදියර තුනකින් යුතු ආකෘතියක් ඉදිරිපත් කරේ.

**අදියර 1**

මූලික හඳුනා ගැනීමේදී මූලිකව ණය හානිකරණය නොවූ ණය සහ ලැබිය යුතු දෑ අදියර 1 වෙත වර්ග කෙරේ. අදියර 1 හි මූල්‍ය සාධන පත්‍රයෙන්, මීළඟ මාස 12 (12M ECL) තුළ සිදුවිය හැකි පැහැරහැරීමේ සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් වන අපේක්ෂිත ණය අලාභවල ජීව කාලයේ කොටසට සමාන වටිනාකමක් අනුව මනිනු ලැබේ.

**අදියර 2**

ආරම්භයේ සිටම ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් හඳුනාගනු ලැබුවහොත්, එය අදියර 2 වෙත ගෙන යන අතර සමූහය විසින් LTECL සඳහා දීමනාවක් වාර්තා කෙරේ.

**අදියර 3**

හානිකරණ සම්භාවිතාව 100% ක් සමඟින්, ණය මුදල ණය හානිකරණයට ලක් වී ඇති නම්, එය අදියර 3 වෙත ඇතුළත් කොට සමූහය විසින් ඒ සඳහා දීමනාවක් වාර්තා කෙරේ.

**ණය අවදානමෙහි සැලකිය යුතු ඉහළ යාම**

මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය සාධන පත්‍රයක පැහැර හැරීමේ අවදානමක්ම සැලකිය යුතුයි ලෙස ඉහළ ගොස් ඇතිද යන්න නිර්ණය කිරීමේදී, සමූහය අතිරික්ත පිරිවැයක් හෝ ප්‍රයත්නයකින් තොරව අදාළ හා පවතින සාධාරණ හා සහායක තොරතුරු සැලකිල්ලට ගැනේ. මෙයට සමූහයේ ඓතිහාසික අත්දැකීම් සහ විශේෂඥ ණය ඇගයුම් සහ ඉදිරි දැකුම් තොරතුරු මත පදනම්ව සිදු කෙරෙන ගුණාත්මක හා ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් ඇතුළත් වේ.

SLFRS 9 උපකල්පනය මත පදනම්ව ගනුදෙනුකරුවෙකුගේ ගිවිසුම්ගත ගෙවීම් දින තිහකට වඩා කල් පසු වේ නම් නිරාවරණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ණය අවදානමක් සහිත බවට සමූහය සලකයි.

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

## 25.6 ගනුදෙනුකරුවන් වෙත වන ණය සහ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වෙන්කිරීම (සබැඳේ)

සමූහය මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී, කිසියම් නිරාවරණයක් පැහැර හැරීමට ලක්වීමට පෙර, ආරම්භයේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති දැයි හඳුනා ගැනීම සඳහා පූර්ව නිර්වචනිත කඩඉමක් භාවිත කරමින් ණය සහ අත්තිකාරම් සමාලෝචනය කරනු ලැබේ.

**පැහැර හැරීමට ලක්වූ සහ ණය හානිකරණය වූ වත්කම් පිළිබඳ නිර්වචනය**

පහත දැක්වෙන අවස්ථාවන්හිදී සමූහය මගින් වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය සහ අත්තිකාරම් පැහැර හැරීමට ලක්වී ඇති බව සලකනු ලබයි.

1. සමූහය මගින් සුරැකුම (රඳවා ගෙන ඇත්නම්) උපලබ්ධි කිරීම් වැනි ක්‍රියා මාර්ගයන්ගෙන් තොරව, ණයගැතියා හට සමූහය වෙත සම්පූර්ණයෙන් සිය බැඳීම් ගෙවීමට නොහැකි බවක් හැඟවෙන අවස්ථාවකදී;

2. ණයගැතියා සිය ගිවිසුම්ගත ගෙවීම් සම්බන්ධයෙන් දින 90 කල් පසු වන අවස්ථාවකදී;

සමූහය මගින් ප්‍රධාන සංරචකයන් තුනක් භාවිත කරමින් අපේක්ෂිත ණය අලාභ ගණනය කෙරේ. ඒවා නම් පැහැර හැරීමේ සම්භාවිතාව (PD), පැහැර හැරීම නිසා සිදුවූ අලාභය (LGD) සහ පැහැර හැරීමට ලක්වනු නිරාවරණය (EAD) වේ. මෙම සංරචක සාමාන්‍යයෙන් අභ්‍යන්තරව සකසන ලද සංඛ්‍යාලේඛනමය ආකෘතීන් සහ ඓතිහාසික දත්ත මගින් උකහා ගැනෙන අතර ඉන් අනතුරුව ඉදිරි දැකුම් තොරතුරු පිළිබිඹු වන පරිදි ගළපනු ලැබේ.

1. පැහැර හැරීමේ සම්භාවිතාව (PD) - පැහැර හැරීමේ සම්භාවිතාව මගින් මීළඟ මාස 12 (12mPD) තුළ හෝ බැඳීමේ ඉතිරි ජීව කාලය පුරා ණයගැතියා විසින් සිය මූල්‍ය බැඳීම් (ඉහත පැහැර හැරීමේ සහ ණය හානිකරණ නිර්වචනය අනුව) පැහැර හැරීමේ සම්භාවිතාව නියෝජනය වේ.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් සඳහා පැහැර හැරීමේ සම්භාවිතා වර්ග දෙකක් භාවිත කෙරේ.

- මාස 12 පැහැර හැරීමේ සම්භාවිතාව - මෙය මීලඟ මාස 12 ඇතුළත (හෝ මාස 12ට අඩු නම් මූල්‍ය සාදන පත්‍රයෙහි ඉතිරි ජීව කාලය පුරා) පැහැර හැරීමක් සිදු වීමේ සම්භාවිතාව පිළිබඳ ඇස්තමේන්තුව වේ. මාස 12 අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් සඳහා මෙය භාවිත කෙරේ.
- ජීව කාල පැහැර හැරීමේ සම්භාවිතාව - මෙය මූල්‍ය සාධන පත්‍රයෙහි ඉතිරි ජීව කාලය පුරා පැහැර හැරීමක් සිදු කිරීම් පිළිබඳව සම්භාවිතාව ආශ්‍රිත ඇස්තමේන්තුව වෙයි. මෙය "අදියර 2" සහ "අදියර 3" නිරාවරණ සඳහා ජීව කාල අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් සඳහා භාවිත කෙරේ.

2. පැහැර හැරීම නිසා සිදුවූ අලාභය (LGD) - මෙය දෙන ලද යම් කාලයකදී පැහැර හැරීම සිදු වන අවස්ථාවක ඇති වන අලාභය පිළිබඳ තක්සේරුවකි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ යම් ඇප මුදාහැරීම ඇතුළුව ණයකරු ලබාගැනීම අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශයට පත් කෙරේ.

3. පැහැර හැරීමට ලක්වූ නිරාවරණය (EAD) - මෙය අනාගත පැහැර හැරීමේ දිනයක නිරාවරණය පිළිබඳ තක්සේරුවක් වන අතර වාර්තා කරන දිනට පසුව නිරාවරණයේ අපේක්ෂිත වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, මූලික සහ පොළී ආපසු ගෙවීම සහ බැඳුනු පහසුකම සඳහා අපේක්ෂිත අඩු කිරීම් ඇතුළත් වේ.

4. වට්ටම් අනුපාතය - මෙය මූලික හඳුනා ගැනීමේදී සඵල පොළී අනුපාතිකය යොදා ගනිමින් වාර්තාකරණ දිනයේදී ප්‍රවර්තන වටිනාකමක් වෙත අපේක්ෂිත අලාභයක් වට්ටම් කිරීම සඳහා යොදා ගැනේ.

5. ආර්ථික සාධක ගැළපුම (EFA) - ඉදිරි දැකුම් තොරතුරු යොදා ගැනීමේදී, සමාගමක් විසින් අපේක්ෂිත ණය අලාභ ඇගයුමට ලක් කිරීම සඳහා ප්‍රක්ෂේපිත සාර්ව ආර්ථික සාධක සැලකිල්ලට ගත යුතු වේ.

ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු

සමූහය මගින්, එහි මූලික හඳුනා ගැනීමේ සිට කිසියම් සාධන පත්‍රයක් ණය අවදානම සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් ඇතිද යන්න නිර්ණය කිරීම සඳහා වන සිය ඇගයුමේදී සහ සිය අපේක්ෂිත ණය අලාභ මිනුම්කරණය යන අවස්ථා දෙකෙහිදීම ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු උපයෝගී කරගනු ලබයි. මූලික තත්ත්වයක් සහ අයහපත්ම තත්ත්වයක් නිර්මාණය කිරීම සඳහාද සමූහය මගින් පළපුරුදු ණය විනිසුම ලබාගෙන ඇත. මූලික තත්ත්වය මගින් වඩාත් සිදුවිය හැකි ප්‍රතිඵලය නියෝජනය වන අතර එය ක්‍රමෝපායික සැලසුම්කරණයේදී සහ අයවැය සැකසීමේදී සමූහය මගින් යොදාගනු ලබන තොරතුරු සමඟ ගළපනු ලැබේ. සමූහය මගින් විවිධ කළඹ කාණ්ඩයන් සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රමුඛ ගාමකයන් හඳුනා ගෙන ලේඛනගත කොට ඇත. ප්‍රමාණාත්මක ආර්ථික සාධක ආර්ථික දත්ත සහ ශ්‍රී ලංකා මහ බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි සංවිධානයන් මගින් ප්‍රකාශයට පත් කෙරෙන පුරෝකථනයන් මත පදනම් වේ.

| ණය අවදානමෙහි ප්‍රමාණාත්මක ගාමකයන් | ණය අවදානමෙහි ගුණාත්මක ගාමකයන් |
|---|---|
| පොළී අනුපාතය (AWPLR) | ක්ෂේත්‍රයේ ව්‍යාපාරයන්හි තත්ත්වය |
| දළ දේශීය නිෂ්පාදිත වර්ධනය | නියාමනමය බැලපෑම |
| උද්ධමන අනුපාතය | රජයේ ප්‍රතිපත්ති |
| විරැකියා අනුපාතය | සාමාන්‍ය LTV |
| විනිමය අනුපාතය | |

රට තුළ පවතින අවිනිශ්චිත සාර්ව ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් සමාගම මගින් බර තැබීමේ තත්ත්වයන් හි නරකම අවස්ථාව 70%, හොඳම අවස්ථාව 0% සහ පදනම් අවස්ථාව 30% ක් වශයෙන් සංශෝධනය කරන ලදි.

**චක්‍රීය පහසුකම් (Revolving Facilities)**

සමූහය මගින් ෆාස්ට් ට්‍රැක් වැනි චක්‍රීය පහසුකම් සලසනු ලබන අතර, එකී පහසුකම් මත මාස 12 අපේක්ෂිත ණය අලාභ දීමනාව පමණක් ගණනය කෙරේ. එහිදී පැහැර හැරීමේ නිරාවරණය - EAD ගණනය කරනු ලබන්නේ ණය පරිවර්තන සාධකය (CCF) සඳහා ගළපන ලද දණ්ඩන සීමාව සහ ණය මුදලෙහි ධාරණ වටිනාකම යන දෙකෙන් උපරිමය ලබා ගැනීමෙනි. සමූහය මගින් අදාළ ගිවිසුම්වල සීමාවන් භාවිත කරන ලද වටිනාකකමින් නවතනු ලබන බැවින් අදියර 3 ගිවිසුම් දළ ධාරණ වටිනාකමට සීමා වන අතර එය භාවිත කරන ලද වටිනාකමද වේ. පැහැර හැරීමේ නිරාවරණය - EAD වෙත අපේක්ෂිත මාස 12 පැහැර හැරීමේ සම්භාවිතාවන් ආදේශනය කොට අපේක්ෂිතවලින් ගුණ කෙරෙන අතර මුල් සඵල පොළී අනුපාතිකයෙහි වැටයුමක් අනුව වට්ටම්ගත කෙරේ.

## 25.7 වසර තුළ කේවල සහ සාමූහික හානිකරණ ගාස්තුවලට අදාළ වෙනස්වීම

කාණ්ඩය අනුව, ණය සහ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම සම්බන්ධ සසැඳුමක් පහත දැක්වේ.

| සමාගම | කල්බදු | කුලී පිට ගැණුම් | ඉජාරා | කාලසීමා ණය | ප්‍රතිමූල්‍ය ණය | මුරාබා | වෙළඳ මුරාබා | සාධකකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2021 අප්‍රේල් 1 දිනට | 3,029,790 | 174,687 | 188,652 | 4,581,573 | 20,147 | 8,345 | 140,383 | 1,124,361 | 9,267,938 |
| වසර සඳහා ගාස්තුව/ (ප්‍රතිවර්තනය) | 656,967 | 8,184 | (77,567) | (157,665) | 3,300 | (830) | 58,672 | 128,571 | 619,632 |
| 2022 මාර්තු 31 දිනට | 3,686,757 | 182,871 | 111,085 | 4,423,908 | 23,447 | 7,515 | 199,055 | 1,252,932 | 9,887,570 |
| **කේවල හානිකරණය** | | | | | | | | | |
| අදියර 1 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 2 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 3 | - | - | - | 771,042 | 2,406 | - | 3,456 | 878,558 | 1,655,462 |
| මුළු කේවල හානිකරණය | - | - | - | 771,042 | 2,406 | - | 3,456 | 878,558 | 1,655,462 |
| **සාමූහික හානිකරණය** | | | | | | | | | |
| අදියර 1 | 804,513 | 15 | 26,549 | 486,203 | - | 8 | 4,311 | 16,624 | 1,338,223 |
| අදියර 2 | 628,642 | 214 | 15,101 | 207,247 | - | 9 | 263 | 39,650 | 891,126 |
| අදියර 3 | 2,253,602 | 182,642 | 69,435 | 2,959,416 | 21,041 | 7,498 | 191,025 | 318,100 | 6,002,759 |
| මුළු සාමූහික හානිකරණය | 3,686,757 | 182,871 | 111,085 | 3,652,866 | 21,041 | 7,515 | 195,599 | 374,374 | 8,232,108 |
| **එකතුව** | 3,686,757 | 182,871 | 111,085 | 4,423,908 | 23,447 | 7,515 | 199,055 | 1,252,932 | 9,887,570 |

| සමාගම | කල්බදු | කුලී පිට ගැණුම් | ඉජාරා | කාලසීමා ණය | ප්‍රතිමූල්‍ය ණය | මුරාබා | වෙළඳ මුරාබා | සාධකකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2022 අප්‍රේල් 1 දිනට | 3,686,757 | 182,871 | 111,085 | 4,423,908 | 23,447 | 7,515 | 199,055 | 1,252,932 | 9,887,570 |
| වසර සඳහා ගාස්තුව/ (ආපසු හැරවීම) | (157,838) | 1,422 | (18,882) | 518,903 | 26,050 | (3,287) | (2,077) | 157,395 | 521,686 |
| කපාහරින ලද අගය | - | - | - | - | - | - | - | - | - |
| 2023 මාර්තු 31 දිනට | 3,528,919 | 184,293 | 92,203 | 4,942,811 | 49,497 | 4,228 | 196,978 | 1,410,327 | 10,409,256 |
| **කේවල හානිකරණය** | | | | | | | | | |
| අදියර 1 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 2 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 3 | - | - | - | 717,122 | 16,886 | | 1,171 | 1,410,327 | 2,145,506 |
| මුළු කේවල හානිකරණය | - | - | - | 717,122 | 16,886 | - | 1,171 | 1,410,327 | 2,145,506 |
| **සාමූහික හානිකරණය** | | | | | | | | | |
| අදියර 1 | 602,883 | 78 | 19,991 | 284,319 | | 3 | 1,263 | - | 908,537 |
| අදියර 2 | 545,564 | - | 14,317 | 261,332 | - | - | 2,020 | - | 823,233 |
| අදියර 3 | 2,380,472 | 184,215 | 57,895 | 3,680,038 | 32,611 | 4,225 | 192,524 | - | 6,531,980 |
| මුළු සාමූහික හානිකරණය | 3,528,919 | 184,293 | 92,203 | 4,225,689 | 32,611 | 4,228 | 195,807 | - | 8,263,750 |
| **එකතුව** | 3,528,919 | 184,293 | 92,203 | 4,942,811 | 49,497 | 4,228 | 196,978 | 1,410,327 | 10,409,256 |

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

### 25.7 වසර තුළ කේවල සහ සාමූහික හානිකරණ ගාස්තුවලට අදාළ වෙනස්වීම (සබැඳේ)

| සමූහය | කල්බදු | කුලී පිට ගැණුම් | ඉජාරා | කාලසීමා ණය | ප්‍රතිමූල්‍ය ණය | මුරාබා | වෙළඳ මුරාබා | සාධකකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2021 අප්‍රේල් 1 දිනට | 3,029,790 | 579,354 | 188,652 | 4,791,164 | 20,147 | 8,345 | 140,383 | 1,124,361 | 9,882,196 |
| වසර සඳහා ගාස්තුව/ (ප්‍රතිවර්තනය) | 656,967 | 64,421 | (77,567) | 96,622 | 3,300 | (830) | 58,672 | 128,571 | 930,156 |
| විනිමය අනුපාත විචල්‍යතාව | - | - | - | 29,784 | - | - | - | - | 29,784 |
| 2022 මාර්තු 31 දිනට | 3,686,757 | 643,775 | 111,085 | 4,917,570 | 23,447 | 7,515 | 199,055 | 1,252,932 | 10,842,136 |
| | | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | | |
| අදියර 1 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 2 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 3 | - | - | - | 735,534 | 2,406 | | 38,964 | 878,558 | 1,655,462 |
| මුළු කේවල හානිකරණය | - | - | - | 735,534 | 2,406 | - | 38,964 | 878,558 | 1,655,462 |
| | | | | | | | | | |
| සාමූහික හානිකරණය | | | | | | | | | |
| අදියර 1 | 804,513 | 115,806 | 26,549 | 745,704 | - | 8 | 36,538 | 16,624 | 1,745,742 |
| අදියර 2 | 628,642 | 121,029 | 15,101 | 189,072 | - | 9 | 42,686 | 39,650 | 1,036,189 |
| අදියර 3 | 2,253,602 | 406,940 | 69,435 | 3,119,998 | 21,041 | 7,498 | 208,129 | 318,100 | 6,404,743 |
| මුළු සාමූහික හානිකරණය | 3,686,757 | 643,775 | 111,085 | 4,182,036 | 21,041 | 7,515 | 160,091 | 374,374 | 9,186,674 |
| එකතුව | 3,686,757 | 643,775 | 111,085 | 4,917,570 | 23,447 | 7,515 | 199,055 | 1,252,932 | 10,842,136 |

| සමූහය | කල්බදු | කුලී පිට ගැණුම් | ඉජාරා | කාලසීමා ණය | ප්‍රතිමූල්‍ය ණය | මුරාබා | වෙළඳ මුරාබා | සාධකකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2022 අප්‍රේල් 1 දිනට | 3,686,757 | 643,775 | 111,085 | 4,790,308 | 23,447 | 7,515 | 326,317 | 1,252,932 | 10,842,136 |
| වසර සඳහා ගාස්තුව/ (ප්‍රතිවර්තනය) | (157,838) | (143,069) | (18,882) | 972,698 | 26,050 | (3,287) | (129,339) | 157,395 | 703,728 |
| විනිමය අනුපාත විචල්‍යතාව | - | - | - | (38,394) | - | - | - | - | (38,394) |
| 2023 මාර්තු 31 දිනට | 3,528,919 | 500,706 | 92,203 | 5,724,612 | 49,497 | 4,228 | 196,978 | 1,410,327 | 11,507,470 |
| | | | | | | | | | |
| කේවල හානිකරණය | | | | | | | | | |
| අදියර 1 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 2 | - | - | - | - | - | - | - | - | - |
| අදියර 3 | - | - | - | 717,122 | 16,886 | - | 1,171 | 1,410,327 | 2,145,506 |
| මුළු කේවල හානිකරණය | - | - | - | 717,122 | 16,886 | - | 1,171 | 1,410,327 | 2,145,506 |
| | | | | | | | | | |
| සාමූහික හානිකරණය | | | | | | | | | |
| අදියර 1 | 602,883 | 86,164 | 19,991 | 542,364 | - | 3 | 1,263 | - | 1,252,668 |
| අදියර 2 | 545,564 | 92,156 | 14,317 | 499,860 | - | - | 2,020 | - | 1,153,917 |
| අදියර 3 | 2,380,472 | 322,386 | 57,895 | 3,965,266 | 32,611 | 4,225 | 192,524 | - | 6,955,379 |
| මුළු සාමූහික හානිකරණය | 3,528,919 | 500,706 | 92,203 | 5,007,490 | 32,611 | 4,228 | 195,807 | - | 9,361,964 |
| එකතුව | 3,528,919 | 500,706 | 92,203 | 5,724,612 | 49,497 | 4,228 | 196,978 | 1,410,327 | 11,507,470 |

## 25.8 වසර තුළ හානිකරණය සඳහා වෙන්කිරීමෙහි වෙනස්වීම

### 2022/23 හානිකරණයෙහි වෙනස්වීම - සමාගම

| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| 2022 අප්‍රේල් 1 දිනට අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම | 1,338,223 | 891,126 | 7,658,221 | 9,887,570 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 54,520 | 18,525 | 29,519 | 102,564 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපා හැරීම් හැර) | (111,628) | (687,814) | (201,356) | (1,000,798) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (1,415,730) | 421,383 | 994,347 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 80,509 | (289,082) | 208,573 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 76,260 | 103,778 | (180,038) | - |
| වසර තුළ අදියර අතර මාරුකරන ලද නිරාවරණයන්හි වසර අවසාන අපේක්ෂිත ණය අලාභ කෙරෙහි බලපෑම | 477,074 | (160,731) | (143,386) | 172,957 |
| අපේක්ෂිත ණය අලාභ ගණනය සඳහා භාවිත කරන ලද ආකෘතීන් සහ යෙදවුම් වෙත කළ වෙනස්කම් | 409,309 | 526,048 | 318,700 | 1,254,057 |
| කපා හරින ලද අගයන් | - | - | (7,094) | (7,094) |
| 2023 මාර්තු 31 දිනට ශේෂය | 908,537 | 823,233 | 8,677,486 | 10,409,256 |

### 2021/22 හානිකරණයෙහි වෙනස්වීම - සමාගම

| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| 2021 අප්‍රේල් 1 දිනට අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම | 831,484 | 1,113,374 | 7,323,080 | 9,267,938 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 556,956 | 76,426 | 442,180 | 1,075,562 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපා හැරීම් හැර) | (12,530) | (362,278) | (439,651) | (814,459) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (203,085) | 100,684 | 102,401 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | (9,270) | (105,960) | 115,230 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 81,009 | 27,966 | (108,975) | - |
| වසර තුළ අදියර අතර මාරුකරන ලද නිරාවරණයන්හි වසර අවසාන අපේක්ෂිත ණය අලාභ කෙරෙහි බලපෑම | (231,669) | (24,428) | 28,790 | (227,307) |
| අපේක්ෂිත ණය අලාභ ගණනය සඳහා භාවිත කරන ලද ආකෘතීන් සහ යෙදවුම් වෙත කළ වෙනස්කම් | 306,788 | 65,342 | 200,229 | 572,359 |
| කපා හරින ලද අගයන් | - | - | (5,063) | (5,063) |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 1,338,223 | 891,126 | 7,658,221 | 9,887,570 |

## 25. ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

### 2022/23 හානිකරණයෙහි වෙනස්වීම - සමූහය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| 2022 අප්‍රේල් 1 දිනට අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම | 1,745,742 | 1,036,189 | 8,060,205 | 10,842,136 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 262,396 | 105,963 | 31,453 | 399,812 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපා හැරීම් හැර) | (169,818) | (708,045) | (213,595) | (1,091,458) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (1,654,045) | 639,811 | 1,014,234 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 88,560 | (377,990) | 289,430 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 83,886 | 114,156 | (198,042) | - |
| වසර තුළ අදියර අතර මාරුකරන ලද නිරාවරණයන්හි වසර අවසාන අපේක්ෂිත ණය අලාභ කෙරෙහි බලපෑම | 500,928 | (165,553) | (149,346) | 186,028 |
| අපේක්ෂිත ණය අලාභ ගණනය සඳහා භාවිත කරන ලද ආකෘතීන් සහ යෙදවුම් වෙත කළ වෙනස්කම් | 429,774 | 541,829 | 312,326 | 1,283,930 |
| කපා හරින ලද අගයන් | - | - | (7,094) | (7,094) |
| විදේශ විනිමය ගැළපීම් | (34,756) | (32,442) | (38,686) | (105,884) |
| 2023 මාර්තු 31 දිනට ශේෂය | 1,252,668 | 1,153,917 | 9,100,885 | 11,507,470 |

### 2021/22 හානිකරණයෙහි වෙනස්වීම - සමූහය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | අදියර 4<br>රු. '000 |
|---|---|---|---|---|
| 2021 අප්‍රේල් 1 දිනට අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම | 995,233 | 1,262,265 | 7,624,698 | 9,882,196 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 838,601 | 111,603 | 488,498 | 1,438,702 |
| හඳුනා ගැනීමෙන් බැහැර කළ හෝ නැවත ගෙවන ලද වත්කම් (කපා හැරීම් හැර) | (137,607) | (384,216) | (437,025) | (958,848) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (207,147) | 103,722 | 103,425 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 10,197 | (119,666) | 109,469 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 89,110 | 14,417 | (103,526) | - |
| වසර තුළ අදියර අතර මාරුකරන ලද නිරාවරණයන්හි වසර අවසාන අපේක්ෂිත ණය අලාභ කෙරෙහි බලපෑම | (236,302) | (24,672) | 29,079 | (231,896) |
| අපේක්ෂිත ණය අලාභ ගණනය සඳහා භාවිත කරන ලද ආකෘතීන් සහ යෙදවුම් වෙත කළ වෙනස්කම් | 312,924 | 65,995 | 202,231 | 581,150 |
| කපා හරින ලද අගයන් | - | - | (5,063) | (5,063) |
| විදේශ විනිමය ගැළපීම් | 80,733 | 6,740 | 48,420 | 135,894 |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 1,745,742 | 1,036,188 | 8,060,205 | 10,842,136 |

## 26. රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**රක්ෂණ - සැලසුම් වර්ගීකරණය**

රක්ෂණ ගිවිසුම් යනු සමූහය (රක්ෂකයා) මගින් තවත් පාර්ශ්වයක් වෙතින් (රක්ෂණවර හිමියන්) සැලකිය යුතු රක්ෂණ අවදානමක් භාර ගනිමින්, රක්ෂණවර හිමියන් වෙත අහිතකර ලෙස බලපාන විශේෂිත අවිනිශ්චිත සිදුවීමකදී (රක්ෂිත සිදුවීම) රක්ෂණවර හිමියන් වෙත වන්දි ලබාදීමට එකඟ වීමයි. පොදු මාර්ගෝපදේශයක් වශයෙන්, සමූහය මගින් සැලකිය යුතු රක්ෂණ අවදානමක් ඇතිද යන්න නිර්ණය කරනු ලබන්නේ අදාළ සිදුවීම් සිදු නොවූයේ නම් ගෙවන ලද ප්‍රතිලාභ සහ ගෙවිය යුතු ප්‍රතිලාභ සංසන්දනය කිරීමෙනි. රක්ෂණ ගිවිසුම් මගින් මූල්‍ය අවදානමද හුවමාරු කළ හැකිය.

කොන්ත්‍රාත්තුවක්, රක්ෂණ කොන්ත්‍රාත්තුවක් වශයෙන් වර්ගීකරණය කළ පසු, මෙම කාල සීමාව තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු අයුරින් සංකෝචනය වුවද, සියලුම හිමිකම් සහ බැඳීම් ඉවත්වීම හෝ කල් ඉකුත් වීම සිදු නොවුණේ නම්, එය එහි ජීව කාලය පුරා රක්ෂණ ගිවිසුමක් වශයෙන් පවතී.

**රක්ෂණ ලැබිය යුතු දෑ**

ලැබිය යුතු දෑ ප්‍රාග්ධනය හා පොලිය පමණක් නියෝජනය කරන බැවින් රක්ෂණ ලැබිය යුතු දෑ මගින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පරීක්ෂණය (SPPI test) සම්පූර්ණ කරයි. රක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් පොලී ගාස්තුවක් නොමැති වුවද, ඒවා කෙටි කාලීන සහ පොලියක් අය කිරීම සඳහා ණය අවදානමක් රහිත වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව (SPPI) සමත් වේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මේවා ස්වභාවයෙන් කෙටි කාලීන වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සඳහා වන ව්‍යාපාර ආකෘතියක් සඳහා සහ සාධන පත්‍රය ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත කිරීම සඳහා කළමනාකරණය විසින් සිය අභිමතය පළ කරනු ලැබුණි. මේවා මූල්‍යමය සංරචකයක් රහිත කෙටි කාලීන ශේෂයන් වන බැවින්, ක්‍රමක්ෂය පිරිවැය ධාරණ අගයට සමාන වේ. සක්‍රීය (1 අදියර), අවක්‍රීය (2 අදියර) සහ අක්‍රීය (3 අදියර) යන අදියර තුනක් මත පදනම්ව, සමාගම මගින් තත්ත්වයන් කිහිපයක් යටතේ මාස 12 අපේක්ෂිත ණය අලාභ සහ ජීව කාල ණය අලාභ වශයෙන් අපේක්ෂිත ණය අලාභ සපයනු ලැබේ.

**නීතිරීති හා කොන්දේසිවල කැපී පෙනෙන සංශෝධන හේතුවෙන් හඳුනා ගැනීමෙන් බැහැරකිරීම**

සැලකිය යුතු ආකාරයෙන්, එය නව රක්ෂණ ගිවිසුමක් බවට පත්වන තාක් දුරට නැවත සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සමාගම මගින් ලැබිය යුතු වාරික හඳුනා ගැනීමෙන් බැහැර කෙරෙන අතර, අදාළ වෙනස වෙනම වත්කමක් හෝ වගකීමක් වශයෙන් හඳුනා ගැනේ. අලුතින් හඳුනාගත් රක්ෂණ ගිවිසුම්, අපේක්ෂිත ණය අලාභ කාර්යයන් උදෙසා අදියර 1 වශයෙන් වර්ගීකරණය කෙරේ.

ලැබිය යුතු රක්ෂණ වාරික හඳුනා ගැනීමෙන් බැහැර කරන්නේද නොකරන්නේද යන්න තක්සේරු කිරීමේදී සමූහය විසින් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

- රක්ෂණය කළ හැකි අවදානම අහිමි වීම
- ගනුදෙනුකරුවන්ගේ වෙනස්වීම

**රක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධ හානිකරණ තක්සේරුකරණය**

අපේක්ෂිත ණය අලාභ ක්‍රමවේදය මත පදනම්ව සමූහය මගින් හානිකරණ ප්‍රතිපාදන තක්සේරු කරනු ලබයි.

**ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සමාගම මගින් ප්‍රතිරක්ෂකයින් වෙත රක්ෂණ අවදානම පවරනු ලැබේ. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ මගින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු හිඟ ශේෂයන් නියෝජනය වේ. ප්‍රතිරක්ෂකයින්ගෙන් පියවා ගත යුතු වටිනාකම්, හිඟ හිමිකම්පෑම් වෙන්කිරීමට ගැළපෙන පරිදි හෝ ප්‍රතිරක්ෂකයාගේ රක්ෂණවරයන් ආශ්‍රිත පියවන ලද හිමිකම්පෑම් ආකාරයෙන් සහ ආශ්‍රිත ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව ඇස්තමේන්තුගත කෙරේ.

පවරන ලද ප්‍රතිරක්ෂණ කටයුතු මගින් සමූහය ස්වකීය රක්ෂණවරහිමියන් කෙරෙහි වන බැඳීම්වලින් නිදහස් නොකෙරේ.

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධ ගතිලක්ෂණ අනුව, ලැබිය යුතු දෑ ප්‍රාග්ධනය හා පොලිය පමණක් නියෝජනය කරන බැවින් සාධන පත්‍ර මගින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පරීක්ෂණය (SPPI test) සම්පූර්ණ කරයි. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් පොලී ගාස්තුවක් නොමැති වුවද, ඒවා කෙටි කාලීන හා සහ පොලියක් අය කිරීම සඳහා ණය අවදානමක් රහිත වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව සමත් වේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මේවා ස්වභාවයෙන් කෙටි කාලීන වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සඳහා වන ව්‍යාපාර ආකෘතියක් සඳහා සහ සාධන පත්‍රය ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත කිරීම සඳහා කළමනාකරණය විසින් සිය අභිමතය පළ කරනු ලැබුණි. මේවා මූල්‍යමය සංරචකයක් රහිත කෙටි කාලීන ශේෂයන් වන බැවින්, ක්‍රමක්ෂය පිරිවැය ධාරණ අගයට සමාන වේ.

**ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධ හානිකරණ තක්සේරුකරණය**

SLFRS 4 - රක්ෂණ ගිවිසුම්, ඡේදය 20 මත පදනම්ව සමාගමෙහි ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ අපේක්ෂිත ණය අලාභ ආකෘතිය සඳහා සුදුසුකම් නොලබයි. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ ආශ්‍රිත අපහායන අලාභ හඳුනා ගැනෙනුයේ ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් පසු සිදුවීමක් හේතුවෙන් ගිවිසුමෙහි කොන්දේසි අනුව සමාගම වෙත සියලු හිඟ මුදල් නොලැබී යා හැකි අන්දමේ වාස්තවික සාක්ෂි පවතින විට සහ අදාළ සිදුවීම සමාගම වෙත ප්‍රතිරක්ෂකයාගෙන් ලැබිය යුතු වටිනාකම කෙරෙහි මැනිය හැකි බලපෑමක් සහිත වූවක් වූ විටකදීය.

## 26. රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ (සබැඳේ)

**විලම්භිත වියදම්**

**විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC)**

කොමිස්, ප්‍රාරක්ෂණය, අලෙවිකරණය සහ රක්ෂණවර නිකුත් කිරීමේ වියදම් ඇතුළුව ව්‍යාපාර අත්පත්කර ගැනීමේ පිරිවැය වැනි නව ව්‍යාපාර සැකසුම් සඳහා සෘජුව සම්බන්ධ සහ විචලනය වන වියදම්, අනාගත වාරික මගින් මෙකී පිරිවැය අයකර ගැනීමට හැකිතාක් දුරට විලම්භනය කරනු ලැබේ. සෙසු සියලු අත්පත්කර ගැනීමේ පිරිවැය ඒවා දරන ලද අවස්ථාවේදී වියදමක් වශයෙන් හඳුනා ගැනේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, විලම්භිත අත්පත් කරගැනීමේ පිරිවැය (DAC), උපයන නොලද වාරික ක්‍රමක්ෂය කරන ලද පදනම මත අදාළ කාලසීමාව පුරා ක්‍රමක්ෂය කෙරේ.

සඵල ජීව කාලයෙහි හෝ වත්කම සමග බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජන මාදිලිවල වෙනස්කම් ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කරමින් ගිණුම්ගත කෙරෙන අතර එය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් වශයෙන් සලකනු ලැබේ.

ආශ්‍රිත ගිවිසුම් කල් ඉකුත් වූ විට හෝ අවලංගු වූ පසු විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැය හඳුනා ගැනීමෙන් බැහැර කෙරේ.

කිසියම් හානිකරණ දර්ශකයක් උද්ගත වූ පසු විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැය සම්බන්ධ අපහායන සමාලෝචනයක් එක් එක් වාර්තාකරණ දිනයේදී හෝ නිරන්තරව සිදු කෙරේ. අයකර ගත හැකි මුදල ධාරණ වටිනාකමට වඩා අඩු නම්, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හානිකරණ අලාභයක් හඳුනා ගැනේ. එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයේදී වගකීම් ප්‍රමාණවත් පරීක්ෂාව තුළද විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැය සැලකිල්ලට ගැනේ.

**ප්‍රතිරක්ෂණ කොමිස්**

බාහිර පැතිර ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධ ලැබිය යුතු කොමිස් විලම්භනය කොට අපේක්ෂිත ගෙවිය යුතු වාරික කාලසීමාව පුරා සරල මාර්ග පදනමකින් ක්‍රමක්ෂය කෙරේ.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ප්‍රතිරක්ෂණ ලැබීම්* | - | - | 521,091 | 606,386 |
| රක්ෂණ ලැබීම්* | - | - | 976,974 | 716,142 |
| එකතුව | - | - | 1,498,065 | 1,322,528 |
| සාධාරණ අගය | - | - | 1,498,065 | 1,322,528 |

## 27. මූල්‍ය වත්කම්- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, සමාගම මගින්, ඒවා විකිණීම සඳහා රඳවා නොගත් අවස්ථාවකදී ක්‍රමෝපායක අරමුණක් උදෙසා රඳවා ගන්නා ලද ඇතැම් හිමිකම් ආයෝජන, සාමාන්‍යයෙන් අවලංගු කළ නොහැකි පරිදි ඒවා SLFRS 9 - "මූල්‍ය සාධන පත්‍ර" යටතේ හිමිකම් පිළිබඳ නිර්වචනය සපුරාලන අවස්ථාවකදී, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හිමිකම් සාධන පත්‍ර වශයෙන් වර්ගීකරණය කරනු ලබයි. එබඳු වර්ගීකරණයක් තීරණය කෙරෙනුයේ සාධන පත්‍රයෙන් සාධන පත්‍රයට පදනම මතය.

උපලබ්ධි නොවූ ලාභ හා අලාභ, "සාධාරණ අගය සංචිතය" තුළ වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ හිමිකම් වශයෙන් හඳුනා ගැනේ. මෙකී මූල්‍ය ආයෝජන බැහැර කරන ලද විටකදී, පෙර සාධාරණ අගය සංචිතයෙහි හඳුනාගත්, සමුච්චිත ලාභ හෝ අලාභ රඳවාගත් ඉපැයුම් වෙත මාරු කෙරේ. වත්කම රඳවා තබා ගැනුණු විට වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට උපයන ලද ලාභාංශ, අදාළ ගෙවීම් හිමිකර ගැනීමේ අයිතිය ස්ථාපනය වූ පසු ආදායම් ප්‍රකාශයෙහි "මෙහෙයුම් ආදායම" වශයෙන් හඳුනා ගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට හිමිකම් සාධන පත්‍ර, හානිකරණ තක්සේරුව සඳහා යටත් නොවේ.

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | 2023 | 2022 | 2023 | 2022 |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| හිමිකම් සුරැකුම් | 27.1 | 283 | 228,541 | 231,838 | 228,541 | 231,838 |
| භාණ්ඩාගාර බිල්පත | | | - | - | 428,309 | 299,663 |
| ණයකර | 27.1 | 283 | 716,112 | 1,101,440 | 716,112 | 1,101,440 |
| එකතුව | | | 944,653 | 1,333,278 | 1,372,962 | 1,632,941 |
| සාධාරණ අගය | | | 944,653 | 1,333,278 | 1,372,962 | 1,632,941 |

## 27.1 හිමිකම් ආයෝජන සහ ණයකර ආයෝජන - සමාගම

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | 2023 කොටස් සංඛ්‍යාව | 2023 ආයෝජන පිරිවැය රු.'000 | 2023 වෙළඳපොළ වටිනාකම රු.'000 | 2022 කොටස් සංඛ්‍යාව | 2022 ආයෝජන පිරිවැය රු. '000 | 2022 වෙළඳපොළ වටිනාකම රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| **හිමිකම් ආයෝජන** | | | | | | | | |
| පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී | | | 25,014,002 | 237,633 | 130,073 | 25,014,002 | 237,633 | 135,076 |
| ආසිරි හොස්පිට්ල් හෝල්ඩිංග්ස් පීඑල්සී | | | 500,000 | 20,730 | 12,450 | 500,000 | 20,730 | 18,750 |
| වින්ඩ්ෆෝර්ස් පීඑල්සී | | | 1,000,000 | 18,489 | 16,500 | - | - | - |
| ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී | | | 5,000,000 | 50,000 | 12,500 | 5,000,000 | 50,000 | 11,000 |
| සණස සංවර්ධන බැංකුව පීඑල්සී | | | 2,271,260 | 213,853 | 57,008 | 2,271,260 | 213,853 | 67,002 |
| | | | | 540,705 | 228,531 | | 522,216 | 231,828 |
| **මිල ගණන් ප්‍රකාශ නොකළ ආයෝජන** | | | | | | | | |
| ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | 27.2.1 | 283 | 100 | 10 | 10 | 100 | 10 | 10 |
| උප එකතුව | | | | | 228,541 | | | 231,838 |
| **ණයකර ආයෝජන** | | | | | | | | |
| ලංකා විදුලිබල මණ්ඩලය | | | 9,180,900 | 1,000,086 | 716,112 | 9,180,900 | 1,000,086 | 891,470 |
| සම්පත් බැංකුව | | | | | | 2,025,000 | 211,149 | 209,970 |
| **එකතුව** | | | | 1,590,801 | 944,653 | | 1,733,461 | 1,333,278 |

## 27.2 මට්ටම 3 ධුරාවලිය යටතේ වන අප්‍රකාශිත ස්කන්ධ සුරැකුම් සඳහා සාධාරණ අගය මිනුමෙහි සැසඳුම

### 27.2.1 ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

| | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| අප්‍රේල් 1 දිනට ශේෂය | 10 | 10 | 10 | 10 |
| වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගත් ප්‍රතිමිනුම | - | - | - | - |
| **මාර්තු 31 දිනට ශේෂය** | 10 | 10 | 10 | 10 |

## 28. ණය සාධන පත්‍ර- ක්‍රමක්ෂය පිරිවැය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

SLFRS 9 අනුව, "මූල්‍ය ආයෝජන", ලාභ අලාභ ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට නම් කොට නොමැති නම් සහ පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ.

- ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ එක්රැස් කිරීමේ අරමුණින් යුතුව වත්කම් රඳවා ගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම් රඳවා ගැනීම; සහ
- මූල්‍ය වත්කමෙහි ගිවිසුම්ගත කොන්දේසි මඟින් හිඟ මුල් මුදලෙහි මූලික මුදල සහ පොලිය ගෙවීම් සඳහා පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා නිශ්චිත දිනයන් උද්ගත වන්නේ නම්.

මූලික මිනුමින් අනතුරුව, මේවා ක්‍රමක්ෂය පිරිවැය අනුව පසුව මනිනු ලැබේ (හානිකරණ වෙන්කිරීම අඩුකොට සඵල පොලී අනුපාතිකය භාවිත කරමින් දළ ධාරණ අගයට). ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන අත්පත් කර ගැනීම සම්බන්ධ කවර හෝ වට්ටම් හෝ වාරික සහ ගාස්තු සහ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. ක්‍රමක්ෂය "පොලී ආදායම" තුළ ඇතුළත් කරනු ලබන අතර, හානිකරණයෙන් උද්ගතවන අලාභ ආදායම් ප්‍රකාශයෙහි - "ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු" යටතේ හඳුනා ගැනේ.

## 28. ණය සාධන පත්‍ර- ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

| මාර්තු 31 දිනට | සමාගම 2023 රු. '000 | සමාගම 2022 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය 2022 රු. '000 |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 10,903,577 | 9,827,221 | 10,903,577 | 9,827,221 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | - | 2,242,156 | 2,750,582 |
| අප්‍රකාශිත වරණීය කොටස් | - | - | 630,330 | 918,504 |
| වාණිජ පත්‍රිකා | - | - | - | 152,475 |
| ණයකර | - | - | 2,083,609 | 2,364,743 |
| එකතුව | 10,903,577 | 9,827,221 | 15,859,672 | 16,013,525 |
| සාධාරණ අගය | 10,936,265 | 9,804,639 | 15,854,167 | 15,765,803 |

## 28. ණය සාධන පත්‍ර- ක්‍රමක්ෂය පිරිවැය
### 28.1 ණයකර

| මාර්තු 31 දිනට | අනුපාතය | කල්පිරීමේ දිනය | සමූහය 2023 ණයකර සංඛ්‍යාව | සමූහය 2023 ධාරණ අගය රු. '000 | සමූහය 2022 ණයකර සංඛ්‍යාව | සමූහය 2022 ධාරණ අගය රු. '000 |
|---|---|---|---|---|---|---|
| සම්පත් බැන්ක් පීඑල්සී | 12.50% | 23-මාර්තු-20 | 1,000,000 | - | 1,000,000 | 100,366 |
| | 13.90% | 24-පෙබ-24 | 1,000,000 | 101,152 | 1,000,000 | 101,152 |
| සියපත ෆිනෑන්ස් පීඑල්සී | 13.33% | 24-අගෝ-8 | 1,500,000 | 162,605 | 1,500,000 | 162,630 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 11.00% | 22-සැප්-10 | 1,000,000 | - | 1,000,000 | 105,940 |
| නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී | 13.95% | 24-මාර්තු-30 | 2,000,000 | 200,149 | 2,000,000 | 200,149 |
| ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී | 12.75% | 23-නොවැ-9 | 1,000,000 | 104,925 | 1,000,000 | 104,925 |
| | 13.00% | 25-මාර්තු-29 | 844,500 | 84,538 | 844,500 | 84,538 |
| | 13.50% | 24-මාර්තු-28 | 1,000,000 | 100,143 | 1,000,000 | 100,143 |
| | 11.00% | 25-ජුනි-12 | 1,190,000 | 129,407 | 1,190,000 | 129,415 |
| සෙලාන් බැන්ක් පීඑල්සී | 12.85% | 23- මාර්තු-29 | 750,000 | - | 750,000 | 75,026 |
| එම්ටීඩී වෝකර්ස් පීඑල්සී | 11.75% | 19-සැප්-30 | 254,784 | 26,954 | 254,784 | 26,954 |
| කොමර්ෂල් බැන්ක් පීඑල්සී | 12.00% | 23-ජුලි-22 | 881,700 | 90,106 | 881,700 | 90,106 |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | 13.00% | 23-නොවැ-1 | 193,300 | 20,332 | 193,300 | 20,332 |
| | 12.30% | 24-සැප්-22 | 413,300 | 43,894 | 413,300 | 43,900 |
| නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී | 12.80% | 24-දෙසැ-23 | 2,000,000 | 206,566 | 2,000,000 | 206,553 |
| හේලීස් පීඑල්සී | 12.50% | 23-ජුලි-31 | 1,000,000 | 101,972 | 1,000,000 | 101,978 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 9.35% | 26-අප්‍රේල්-15 | 4,000,000 | 435,688 | 4,000,000 | 435,694 |
| එල්ඕඑල්සී පීඑල්සී | 10.25% | 26-පෙබ-24 | 3,000,000 | 302,819 | 3,000,000 | 302,819 |
| උප එකතුව | | | | 2,111,250 | | 2,392,620 |
| අඩු කිරීම:අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන | | | | (27,641) | | (27,877) |
| එකතුව | | | | 2,083,609 | | 2,364,743 |

මෙම කාණ්ඩය යටතේ වන සියලුම ආයෝජන, ආයෝජන ශ්‍රේණියේ සාධන පත්‍ර වන බැවින්, අපේක්ෂිත ණය අලාභ සඳහා වන සමස්ත ප්‍රතිපාදන මාස 12 අපේක්ෂිත ණය අලාභවලින් උකහා ගන්නා ලදී.

## 29. පරිපාලිතයන්හි ආයෝජන

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

'ඒකාබද්ධ සහ වෙන් වෙන් වූ මූල්‍ය ප්‍රකාශ' සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 27 අනුව, පරිපාලිතයන්හි ආයෝජන, සමාගමේ මූල්‍ය ප්‍රකාශවල ලාභ හෝ අලාභ ප්‍රකාශය වෙත කවර හෝ හානිකරණ අලාභවලින් ශුද්ධව අය කෙරෙන අතර පිරිවැය අනුව ප්‍රකාශයට පත් කෙරේ.

පරිපාලිතයන් යනු සමූහය/සමාගම මගින් පාලනය කරනු ලබන ආයතන වේ. සමාගම මගින් පරිපාලිතයින් පාලනය අත්පත් කර ගත් දිනයේ සිට පරිපාලිතයන් ඒකාබද්ධකරණය කෙරෙන අතර, එම පාලනය අහිමිවන තෙක් අඛණ්ඩව ඒකාබද්ධකරණය කෙරේ. සමාගම මගින් එය නිරාවරණය වූ පසු හෝ ආයෝජිතයා සමඟ සිය ආයෝජනයෙන් විචල්‍ය ආදායම් ලබා ගැනීමේ අයිතිය හිමි වූ පසු, ආයෝජිතයා පාලනය කරනු ලබන අතර, ආයෝජිතයා මත පවතින සිය බලය ඔස්සේ අදාළ ආදායම්වලට බලපෑම් කිරීමේ හැකියාව සමාගමට හිමි වෙයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී, අභ්‍යන්තර සමූහ ශේෂයන් සහ ගනුදෙනු, ආදායම්, වියදම් සහ කවර හෝ අභ්‍යන්තර සමූහ ගනුදෙනුවලින් වන උපලබ්ධි නොවූ ලාභ ඉවත් කෙරේ.

පාලනය නොවන හිමිකම් මගින් සමාගම වෙත සෘජුව හෝ වක්‍රව හිමිකමක් නොමැති, පරිපාලිතයන්ගේ ලාභ හෝ අලාභ සහ ශුද්ධ වත්කම් කොටස නියෝජනය වේ.

පාලනය නොවන හිමිකම්, ලාභ හෝ අලාභ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයේ වෙන් වශයෙන් දක්වා ඇත. එසේම මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයෙහි හිමිකම් හි දක්වා ඇති නමුත්, මවු සමාගමෙහි කොටස් හිමිකරුවන්ගේ හිමිකම්වලින් වෙනම ප්‍රකාශයට පත් කෙරේ. පාලනය නොවන හිමිකම්වලට අදාළ වන කවර හෝ අලාභයක්, සෘණාත්මක ශේෂයක් කෙරෙහි හේතු වුවද, හිමිකමට සාපේක්ෂව පාලනය නොවන හිමිකමකට වෙන් කරනු ලැබේ. පාලනය නොවන හිමිකම් මගින් අත්පත් කරගැනීම්, මවු සමාගම් ව්‍යාප්ති ක්‍රමවේදය යොදා ගනිමින් ගිණුම් ගත කෙරෙන අතර, එමගින් ප්‍රතිශ්ඨාවෙහි සහ අත්පත්කොට ගත් ශුද්ධ වත්කම්වල සාධාරණ අගය අතර වෙනස හිමිකම් ලෙස හඳුනා ගනු ලබයි.

බංග්ලාදේශයෙහි සංස්ථාපිත ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හැරුණු විට, සමාගමේ සියලුම පරිපාලිතයන් ශ්‍රී ලංකාවේ සංස්ථාපිතය. පරිපාලිතයන් පිළිබඳ ලැයිස්තුවක් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ පිටු අංක 231 සටහන 1.2 හි දැක්වේ.

| මාර්තු 31 දිනට | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | හිමිකාරිත්වය | පිරිවැය | අධ්‍යක්ෂවරුන්ගේ / වෙළඳපොළ තක්සේරුව | හිමිකාරිත්වය | පිරිවැය | අධ්‍යක්ෂවරුන්ගේ / වෙළඳපොළ තක්සේරුව |
| සමාගම | % | රු.'000 | රු.'000 | % | රු.'000 | රු.'000 |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 100.00 | 175,000 | 353,841 | 100.00 | 175,000 | 332,983 |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | 100.00 | 550,000 | 919,221 | 100.00 | 550,000 | 1,013,914 |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | 100.00 | 600,000 | 596,214 | 100.00 | 600,000 | 626,158 |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | 100.00 | 150,000 | 479,547 | 100.00 | 150,000 | 367,437 |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 75.00 | 600,000 | 3,255,000 | 75.00 | 600,000 | 2,955,000 |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | 51.00 | 1,216,604 | 1,920,742 | 51.00 | 1,138,788 | 1,482,658 |
| එකතුව | | 3,291,604 | 7,524,565 | | 3,213,788 | 6,778,150 |

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හැරුණු විට පරිපාලිතයන් කොළඹ කොටස් වෙළඳපොළෙහි ප්‍රකාශිත නොවේ. පරිපාලිතයන්හි ආයෝජන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව, ශුද්ධ වත්කම් පදනමක් මත ධාරණය කොට ඇත. පීපල්ස් ඉන්ෂ්වරන්ස් පීඑල්සී වෙළඳපොළ වටිනාකම් පදනමක් මත තක්සේරු කොට ඇත.

## 29. පරිපාලිතයන්හි ආයෝජන (සබැඳේ)

ප්‍රමාණාත්මක පාලනය නොවන හිමිකම් (NCI) සහිත සමූහයේ පරිපාලිතයන්ට අදාළ තොරතුරු පහත වගුවෙන් සාරාංශගත කෙරේ.

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | එකතුව | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 5,505,104 | 557,249 | 6,062,353 | 4,562,288 | 449,753 | 5,012,041 |
| අඩු කිරීම: මෙහෙයුම් වියදම් | 4,395,453 | 734,304 | 5,129,757 | 4,254,559 | 478,043 | 4,732,602 |
| ආදායම් බදුවලට පෙර ලාභය | 1,109,651 | (177,055) | 932,596 | 307,729 | (28,290) | 279,439 |
| අඩු කිරීම: ආදායම් බදු වියදම් | 442,306 | 296,718 | 739,024 | 217,338 | (7,556) | 209,782 |
| බදුවලට පසු ලාභය | 667,345 | (473,773) | 193,572 | 90,391 | (20,734) | 69,657 |
| සුළු කොටස් හිමි අයිතිය (NCI) වෙත වෙන්කරන ලද ලාභය | 166,836 | (232,149) | (65,313) | 22,598 | (10,160) | 12,438 |

| මාර්තු 31 දිනට | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | එකතුව | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| මුදල් සහ මුදලට සමාන දෑ | 259,422 | 126,354 | 385,776 | 642,756 | 124,218 | 766,974 |
| බැංකු සහ මූල්‍ය ආයතනවල ශේෂයන් | 3,665,082 | 1,390,392 | 5,055,474 | 2,561,413 | 1,997,930 | 4,559,343 |
| ණය සහ ලැබීම් | 42,539 | 10,949,870 | 10,992,409 | 51,575 | 10,964,065 | 11,015,640 |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු | 2,111,871 | - | 2,111,871 | 1,931,657 | - | 1,931,657 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 428,309 | - | 428,309 | 299,663 | - | 299,663 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධන පත්‍ර | 4,466,859 | 630,330 | 5,097,189 | 5,408,890 | 918,504 | 6,327,394 |
| දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් | 367,958 | 165,712 | 533,670 | 106,954 | 183,036 | 289,990 |
| වෙනත් වත්කම් | 386,208 | 381,610 | 767,816 | 1,099,636 | 356,326 | 1,455,962 |
| **මුළු වත්කම්** | 11,728,248 | 13,644,268 | 25,372,514 | 12,102,544 | 14,544,079 | 26,646,623 |
| | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 192,027 | 1,047,214 | 1,239,241 | 184,738 | 796,993 | 981,731 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | - | 8,109,008 | 8,109,008 | - | 8,665,037 | 8,665,037 |
| වෙනත් මූල්‍ය වගකීම් | 871,770 | 624,228 | 1,495,998 | 969,610 | 528,323 | 1,497,933 |
| වෙනත් වගකීම් | 493,820 | 97,658 | 591,478 | 216,896 | 97,658 | 314,554 |
| රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 5,296,908 | - | 5,296,906 | 5,982,246 | - | 5,982,246 |
| මුළු වගකීම් | 6,854,525 | 9,878,108 | 16,732,631 | 7,353,490 | 10,088,011 | 17,441,501 |
| **ශුද්ධ වත්කම් වටිනාකම** | 4,873,723 | 3,766,160 | 8,639,883 | 4,749,052 | 4,456,068 | 9,205,120 |

## 30. ආයෝජන දේපළ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

ආයෝජන දේපළ යනු භාණ්ඩ හෝ සේවා සේවා සැපයීම් හෝ පරිපාලන අවස්ථා වෙනුවෙන් භාවිත කෙරෙන, නමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා නොපවතින, කුලී ආදායම් උපයා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීම සඳහා හෝ මෙම අරමුණු දෙකම සඳහා රඳවාගත් දේපළ වේ.

ආයෝජන දේපළ මූලිකව පිරිවැය අනුව හඳුනා ගැනේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනයට වෙළඳපොළ තත්ත්වයන් පිළිබිඹු වන පරිදි, අයෝජන දේපළ සාධාරණ අගය අනුව ප්‍රකාශයට පත් කෙරේ. සාධාරණ අගය වෙනස් වීම හේතුවෙන් උද්ගතවන ලාභ හෝ අලාභ, ඒවා උද්ගත වන වසරේ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

එක් සමූහ සමාගමක් මගින් පරිපාලිතයන්හි ආයෝජන දේපළවලින් සැලකිය යුතු කොටසක් අත්පත් කොටගෙන ඇති නම්, එවැනි ආයෝජන දේපළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්හි දේපළ, පිරියත හා උපකරණ වශයෙන් සැලකෙන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 16 - "දේපළ, පිරියත හා උපකරණ" අනුව ගිණුම්ගත කෙරේ.

**හඳුනා ගැනීමෙන් බැහැර කිරීම්**

ආයෝජන දේපළ, බැහැර කිරීමේදී හෝ ආයෝජන දේපළ භාවිතයෙන් ස්ථිරවම ඉවත් වූ විට සහ එහි බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි අවස්ථාවකදී හඳුනා ගැනීමෙන් බැහැර කෙරේ. ආයෝජන දේපළ විශ්‍රාම ගැන්වීමෙන් හෝ බැහැර කිරීමෙන් උද්ගත වන කවර හෝ ලාභ හෝ අලාභ අදාළ විශ්‍රාම ගැන්වීම හෝ බැහැර කිරීම සිදු කළ වසරේ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

**ආයෝජන දේපළ වෙත/ ආයෝජන දේපළ වෙතින් පසුකාලීන මාරුකිරීම්**

ආයෝජන දේපළ වෙත මාරු කිරීම් සිදු කෙරෙනුයේ, අවසන් හිමිකරුගේ හිමිකාරීත්වය සහිතව භාවිතය වෙනසක් පවතින විට, වෙනත් පාර්ශ්වයක් ලෙස මෙහෙයුම් කල්බදු අරඹන විට හෝ ඉදිකිරීම් හෝ සංවර්ධනයක් සම්පූර්ණ කිරීමේදී පමණි.

ආයෝජන දේපළ වෙතින් මාරු කිරීමක් සිදු කරනුයේ, හිමිකරුගේ හිමිකාරීත්වය ආරම්භ කිරීමෙන් හෝ විකිණීමේ අදහසක් සහිතව සංවර්ධන ආරම්භ කළ අවස්ථාවකදී භාවිතයේ වෙනසක් වූ විට පමණි.

හිමිකරුගේ හිමිකාරීත්වය සහිත දේපළ හෝ තොග වෙත ආයෝජන දේපළවලින් මාරු කිරීමක් සඳහා, පසුකාලීන ගිණුම්ගත කිරීම් සඳහා දේපළවල උපකල්පිත පිරිවැය යනු භාවිතය වෙනස් වූ දිනයේදී සාධාරණ අගය වේ. හිමිකරු සතු දේපළක් වශයෙන් සමාගම සතු දේපළ, ආයෝජන දෙපළක් ආයෝජනයක් බවට පත් පත්වන්නේ නම්, සමාගම මගින් භාවිතයේ වෙනස සිදු වූ දිනය දක්වා දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇති ප්‍රතිපත්තිය අනුව එවැනි දේපළ ගිණුම්ගත කෙරේ.

තොගවලින් ආයෝජන දේපළ වෙත මාරු කිරීමක් සඳහා, අදාළ දිනයේදී දේපළෙහි සාධාරණ අගය සහ එහි පෙර ධාරණ අගය අතර ඕනෑම වෙනසක් ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. සමාගම මගින් ස්වයං ඉදිකිරීම් ආයෝජන දේපළක් ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කළ පසු, අදාළ දිනයෙහි දේපළවල සාධාරණ අගය සහ එහි පෙර ධාරණ අගය අතර කවර හෝ වෙනසක්, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

**ආයෝජන දේපළවල සාධාරණ අගය**

සමාගමේ සහ සමූහයේ ආයෝජන දේපළ සාධාරණ අගයෙන් නිරූපණය කෙරේ. සමාන ආකාරයේ වත්කම්වල වර්තමාන වෙළඳපොළ මිල පවත්නා විට, එවැනි සාක්ෂි මෙකී වත්කම්වල සාධාරණ අගයන් ඇස්තමේන්තුගත කිරීමේදී සැලකිල්ලට ගැනේ. එබඳු තොරතුරු නොමැති විටකදී, සමූහය සහ සමාගම මගින් සාධාරණ අගයන් වශයෙන් ආරෝපණය කළ හැකි වටිනාකම්, සාධාරණ පරිදි සාධාරණ අගයේ ඇස්තමේන්තු ආශ්‍රයෙන් නිර්ණය කරනු ලබයි. මෙහිදී සමාන දේපළ සඳහා වෙළඳපොළ කුලී සහ මූල්‍ය ප්‍රවාහයේ ප්‍රමාණයේ සහ කාලයේ අවිනිශ්චිතතාවය පෙන්නුම් කරනු ලබන වට්ටම් අනුපාතික භාවිත කරමින් සාක්ෂි මත පදනම් වූ තක්සේරු යොදා ගනිමින් වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහ ප්‍රක්ෂේපණ පිළිබඳ සැලකිල්ලට ගනු ලබයි.

**සාධාරණ අගය නිර්ණය කිරීම**

සෑම වසරකදීම තක්සේරුකරණයට ලක් වන දේපළවල පරිශ්‍රය සහ කාණ්ඩය පිළිබඳ මෑත කාලීන අත්දැකීම් සහිත පිළිගත් වෘත්තීමය සුදුසුකම් සහිත බාහිර හා ස්වාධීන තක්සේරුකරුවන් විසින් ආයෝජන දේපළ කළඹ තක්සේරු කරනු ලබයි. අදාළ කාලසීමාව තුළ වන මූල්‍ය කාල පරිච්ඡේදයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාධාරණ අගය නිර්ණය කෙරේ.

මිනුම්කරණ දිනයේදී වෙළඳපොළ සහභාගිකයින් අතර සාමාන්‍ය ගනුදෙනුවකදී, අදාළ දේපළ විකිණිය හැකි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවක් වීම හේතුවෙන් වෙළඳපොළ වටිනාකම මත පදනම්ව සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

**සමූහය තුළ කල්බදු පදනමට දෙන ලද ආයෝජන දේපළ**

මව් සමාගමට හෝ පරිපාලිතයක් වෙත කල්බදු පදනමට දෙන ලද දේපළක් සමූහය පාර්ශ්වයෙන් හිමිකරුගේ හිමිකාරීත්වය සහිත යැයි සලකනු ලබන අතර සාමෝධානික අරමුණු උදෙසා ගැළපුම් සිදු කෙරේ.

**හිමිකරුගේ පදිංචිය සහිත දේපළ සහ ආයෝජන දේපළ:**

දේපළ, ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් සපුරාලන්නේද යන්න හඳුනා ගැනීමේදී, දේපළ සඳහා පමණක් නොව වෙනත් වත්කම් වෙත ආරෝපණය කළ හැකි මූල්‍ය ප්‍රවාහවලට වඩා ස්වාධීන මූල්‍ය ප්‍රවාහ දේපළ මගින් උත්පාදනය කරන්නේදැයි විනිශ්චයක් සිදු කරයි. අනුශාංගික සේවා සැලකිය යුතු මට්ටමක පවතීද යන්න නිර්ණය කිරීමේදීද විනිශ්චයන් සිදු කරනු ලබන අතර එවිට ආයෝජන දේපළක් වශයෙන් දේපළ සුදුසුකම් නොලබයි.

## 30. ආයෝජන දේපළ (සබැදේ)

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023<br>රු. '000 | 2022<br>රු. '000 | 2023<br>රු. '000 | 2022<br>රු. '000 |
| අප්‍රේල් 1 දිනට ශේෂය | - | - | 820,664 | 820,664 |
| වසර තුළ එක් කිරීම් | 284,961 | - | 284,961 | - |
| සාධාරණ අගය ගැළපීමෙන් ප්‍රතිලාභ | - | - | 94,692 | - |
| මාර්තු 31 දිනට ශේෂය | 284,961 | - | 1,200,317 | 820,664 |

වසර තුළ පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් විසින් අංක 7 සහ 9, හැව්ලොක් පාර, කොළඹ 5 දරන ස්ථානයේ පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මහජන බැංකුව, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වෙත කුලියට දෙන ලදී. සමූහයේ මූල්‍ය ප්‍රකාශයන්හි, එබඳු දේපළ වෙන් කොට ඇති අතර, මහජන බැංකුව වෙත කුලියට දෙන ලද කොටස සමූහයේ ආයෝජන දේපළ වශයෙන් වර්ග කොට ඇත. වර්ග කිරීමෙහි පදනම වශයෙන් කුලියට දෙන ලද වර්ග අඩි සංඛ්‍යාව පදනම් කරගෙන ඇත.

වෙළඳපොළ වටිනාකම මත සමාගම විසින් දේපළ ආයෝජන සිදු කරනු ලබයි. 2022 දෙසැම්බර් 31 දිනට ඉහත ආයෝජන දේපළ ආයෝජනහි වෙළඳපොළ වටිනාකම සිදු කරන ලද්දේ සමාගම සමඟ සම්බන්ධ නොවූ ස්වාධීන තක්සේරුකරුවකු වන කේ.ටී.ඩී. තිසේරා මහතා FRICS (Eng) විසින් සිදු කරන ලදී.

ඉහත ආයෝජන දේපළ සම්බන්ධ හඳුනා ගත් කුලී ආදායම්, පිටු අංක 242 හි සටහන 10 හි අනාවරණය කොට ඇත.

ඉහත ආයෝජන දේපළ සම්බන්ධව හඳුනා ගත් සෘජු මෙහෙයුම් වියදම් පිටු අංක 248 හි සටහන 15 හි අනාවරණය කොට ඇත.

## 31. වෙනත් වත්කම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමාගම සහ සමූහය මගින් ඔවුන්ගේ සියලුම වෙනත් වත්කම්, වෙනත් මූල්‍ය වත්කම් සහ වෙනත් මූල්‍ය නොවන වත්කම් වශයෙන් වර්ග කරනු ලැබේ. වෙනත් මූල්‍ය නොවන වත්කම් ප්‍රධාන වශයෙන් අත්තිකාරම් ගෙවීම්, අයකර ගත හැකි එකතු කළ අගය මත බදු, තොග සහ වෙනත් අයකර ගත හැකි දේවලින් සමන්විත වේ. අත්තිකාරම් ගෙවීම් ඓතිහාසික පිරිවැය අනුව ධාරණය කරනු ලැබේ.

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2023<br>රු. '000 | සමාගම 2022<br>රු. '000 | සමූහය 2023<br>රු. '000 | සමූහය 2022<br>රු. '000 |
|---|---|---|---|---|---|---|
| වෙනත් මූල්‍ය වත්කම් - රක්ෂණ කොමිස් | | | 100,306 | 108,493 | - | - |
| මූල්‍ය නොවන වත්කම් | 31.1 | 288 | 929,832 | 640,662 | 1,281,022 | 831,825 |
| එකතුව | | | 1,030,138 | 749,155 | 1,281,022 | 831,825 |

### 31.1 මූල්‍ය නොවන වත්කම්

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2023<br>රු. '000 | සමාගම 2022<br>රු. '000 | සමූහය 2023<br>රු. '000 | සමූහය 2022<br>රු. '000 |
|---|---|---|---|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | | | 118,813 | 111,524 | 91,853 | 81,928 |
| ලැබිය යුතු ලාභාංශ | | | 110,768 | 225,000 | - | - |
| තොග | | | 47,018 | 33,015 | 67,150 | 40,815 |
| පෙරදා ගෙවූ වියදම් | | | 127,533 | 94,605 | 135,472 | 100,814 |
| සේවක ණය මත ක්‍රමක්ෂය නොකළ පිරිවැය (1 වැනි දින වෙනස) | 31.2 | 289 | 370,151 | 54,211 | 370,235 | 54,360 |
| විලම්භිත වියදම් | | | - | - | 91,926 | 151,388 |
| වෙනත් ලැබීම් | | | 155,549 | 122,307 | 524,386 | 402,520 |
| එකතුව | | | 929,832 | 640,662 | 1,281,022 | 831,825 |

### 31.2 සේවක ණය මත ක්‍රමක්ෂය නොකළ පිරිවැය (1 වැනි දින වෙනස)

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2023 රු. '000 | 2022 රු. '000 | 2023 රු. '000 | 2022 රු. '000 |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 54,211 | 123,264 | 54,360 | 123,264 |
| වසර සඳහා අයකිරීම | 315,940 | (69,053) | 315,875 | (68,904) |
| මාර්තු 31 දිනට ශේෂය | 370,151 | 54,211 | 370,235 | 54,360 |

## 32. දේපළ, පිරියත සහ උපකරණ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**හඳුනා ගැනීමේ පදනම**

දේපළ, පිරියත සහ උපකරණ යනු සේවා හෝ පරිපාලන කාර්යයන් සඳහා රඳවා තබා ගනු ලබන ස්පෘශ්‍ය අයිතමයන් වන අතර, ඒවා වසරකට වැඩි කලක් භාවිතයට අපේක්ෂිතය.

වත්කමක් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇති නම් සහ අදාළ වත්කමෙහි පිරිවැය සාධාරණ අයුරින් මැනිය හැකි නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනේ.

**මිනුම්කරණ පදනම**

වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා යෝග්‍ය වන දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් එහි පිරිවැය අනුව මූලිකව හඳුනා ගැනේ. පිරිවැය අදාළ වත්කම අත්පත් කරගැනීම සඳහා සෘජුව ආරෝපණය කළ හැකි දරන ලද වියදම සහ පසුව එයට කොටස් එක් කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට යොදන ලද පිරිවැයෙන් සමන්විත වේ. අමුද්‍රව්‍ය පිරිවැය හා සෘජු ශ්‍රමය, එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද කවර හෝ පිරිවැය, සහ අයිතමයන් ගැලවීමේ සහ ඉවත් කිරීමේ පිරිවැය සහ අදාළ පරිශ්‍රයේ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය සහ ප්‍රාග්ධනගත ණය ගැනීමේ පිරිවැය ආදියෙන් ස්වයං නිර්මිත වත්කමක පිරිවැය සමන්විත වේ. ආශ්‍රිත උපකරණයෙහි ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් වන මිලදී ගත් මෘදුකාංග, පරිගණක උපකරණයෙහි කොටසක් වශයෙන් ප්‍රාග්ධනීකරණය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටස් විවිධ සඵල ජීව කාල සහිත වන විට, ඒවා දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතමයන් (ප්‍රධාන සංරචක) වශයෙන් ගිණුම්ගත කෙරේ.

සමාගම සහ සමූහය මඟින් පිරියත හා උපකරණ සඳහා පිරිවැය ආකෘතියක් යොදවමින් කවර හෝ අවස්ථාමය පිරිවැය සමඟින් මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා කවර හෝ සමුච්චිත හානිකරණ අලාභයන් අඩු කොට වාර්තා කෙරේ.

**පසුකාලීන පිරිවැය**

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ප්‍රතිස්ථාපනය සම්බන්ධ පිරිවැය, අයිතමයක රැගෙන යාමේ අගයෙන් හඳුනා ගැනෙනුයේ එම කොටස මඟින් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලාඒමක් සිදු වනුයේ නම් සහ එහි අගය සාධාරණ ලෙස මැනිය හැකි නම්ය. දේපළ, පිරියත සහ උපකරණයන් හි එදිනෙදා කටයුතුවලදී පිරිවැය ලාභ හො අලාභ ප්‍රකාශය වෙත අය කෙරේ.

**අලුත්වැඩියාව සහ නඩත්තුව**

අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද මූල්‍යමය කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයට අය කෙරේ. පවතින වත්කම්වල ආසන්නතම තක්සේරු කරන ලද සම්මත කාර්යසාධනයට වැඩි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම සහ සමූහය වෙත ගලාඒමක් සිදුවිය හැකි අවස්ථාවේදී සහ අලුත්වැඩියාවේදී අදාළ වත්කමෙහි හඳුනාගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේදී, මූලික අලුත්වැඩියාවන් සම්බන්ධ පිරිවැය, වත්කම්හි ධාරණ අගයේ දක්වා ඇත. ආශ්‍රිත වත්කමෙහි අවශේෂ සඵල ජීව කාලය තුළ මූලික අලුත්වැඩියාවන් ක්ෂය කෙරේ.

**හඳුනා ගැනීමෙන් බැහැර කිරීම**

දේපළ, පිරියත හා උපකරණ ඒවා ඉවත් කිරීමේදී හෝ එමගින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කළ නොහැකි විටකදී හඳුනා ගැනීමෙන් බැහැර කෙරේ. වත්කම් හඳුනා ගැනීමෙන් බැහැර කිරීමෙන් ඇති වන ප්‍රතිලාභ හෝ අලාභ (ශුද්ධ බැහැර කිරීමෙන් ලද මුදල සහ වත්කම්වල ධාරණ අගයේ වෙනස අනුව ගණනය කෙරේ.) වසර තුළ 'වෙනත් මෙහෙයුම් ආදායමෙ' හි ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**ක්ෂයවීම්**

වත්කම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව පැහැදිලිව දක්වෙන බැවින්, දේපළ, පිරියත සහ උපකරණවල එක් එක් අයතමයන්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල මාර්ග ක්‍රමයක් භාවිත කරමින් ලාභ හා අලාභ ප්‍රකාශයෙහි ක්ෂය වශයෙන් හඳුනා ගැනේ. ඉඩම් ක්ෂයවීමට භාජනය නොවේ.

## 32. දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)

ඇස්තමේන්තුගත සඵල ජීව කාලයන් පහත දැක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | වසරකට % | කාලසීමාව |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2 | වසර 50 |
| බදු දේපළවල වැඩිදියුණු කිරීම් | 25 | වසර 4 |
| මෝටර් රථ | 12.5 - 20 | වසර 5 - 8 |
| පරිගණක දෘඩාංග | 20 | වසර 5 |
| කාර්යාල උපකරණ | 10 - 20 | වසර 5 -10 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 20 | වසර 5 |

ඉහත අනුපාතයන් සමූහයේ සියලුම සමාගම් මගින් සංගතව භාවිත කෙරේ. දේපළ, පිරියත සහ උපකරණවල එක් එක් සැලකිය යුතු කොටස් සඳහා ක්ෂයවීමේ අනුපාතයන් වෙන වෙනම නිර්ණය කෙරෙන අතර, ඒවා කළමනාකාරිත්වය අදහස් කරන පරිදි මෙහෙයවීම් සඳහා අවශ්‍ය පරිශ්‍රය සහ තත්ත්වය තුළ භාවිතයට සුදුසු බවට පත්වූ පසු ක්ෂයවීම ආරම්භ කෙරේ. වත්කමක ක්ෂයවීම, අදාළ වත්කම විකිණීම සඳහා රඳවාගත් වශයෙන් වර්ග කරන ලද දිනය සහ වත්කම හඳුනා ගැනීමෙන් බැහැර කරන ලද දිනය යන දෙකෙන් කලින් එළඹෙන දිනයේදී අවසන් වේ. ක්ෂයවීමේ ක්‍රමවේදයන්, සඵල ජීව කාල සහ අවශේෂ වටිනාකම් එක් එක් වාර්තාකරණ දිනයේදී නැවත සමාලෝචනය කර අවශ්‍ය නම් ගැළපුම් සිදු කෙරේ.

**දේපළ, පිරියත හා උපකරණවල සඵල ජීව කාලය**

සමූහය සහ සමාගම මගින් ඒවායේ ඇස්තමේන්තු ගත අවශේෂ වටිනාකම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ඒවායේ ඇස්තමේන්තුගත සඵල ජීව කාලය පුරා සරල මාර්ගික ක්‍රමවේදය භාවිත කරමින් දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කරනු ලැබේ. සඵල ජීව කාලය මගින් සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ භාවිතයෙන් සමාගම සහ සමූහය අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට අදහස් කරන කාලසීමාව සම්බන්ධ කළමනාකාරිත්වයෙහි ඇස්තමේන්තුව නියෝජනය වේ. අවශේෂ වටිනාකම මගින් වත්කමක් දැනටමත් එහි ජීව කාලයේ අවසානයට ළඟා වූ බවට සහ එහි සඵල ජීව කාලයේ අවසානයේදී අපේක්ෂිත තත්ත්වයට පත්ව ඇති බවට සලකමින්, බැහැර කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය අඩු කිරීමෙන් පසු, අදාළ වත්කම විකිණීමෙන් සමූහය/ සමාගම් වර්තමානයේදී ලබාගත හැකි කළමනාකාරිත්වයේ ඇස්තමේන්තුගත වටිනාකම් නියෝජනය වේ. අපේක්ෂිත භාවිත මට්ටමෙහි සහ තාක්ෂණික වර්ධනයන්වල වෙනස්කම් මෙකී වත්කම්වල ආර්ථික තත්ත්වය, සඵල ජීව කාලය සහ අවශේෂ වටිනාකම් කෙරෙහි බලපෑ හැකි අතර එවිට එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගත ක්ෂය අයකිරීම වෙත බලපෑම් ඇති වෙයි.

### 32.1 දේපළ, පිරියත හා උපකරණ - සමාගම

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි | බදු දේපළවල වැඩිදියුණු කිරීම් | මෝටර් රථ | පරිගණක දෘඩාංග | කාර්යාල උපකරණ | ගෘහභාණ්ඩ සහ උපාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පිරිවැය** | | | | | | | |
| 2022 අප්‍රේල් 1 දිනට ශේෂය | 723,542 | 56,872 | 438,804 | 874,947 | 666,126 | 440,498 | 3,200,789 |
| එකතුකිරීම් | - | - | 182,800 | 14,113 | 49,359 | 6,981 | 253,253 |
| බැහැරකිරීම් | - | - | (29,081) | (55,955) | (15,990) | (4,673) | (105,699) |
